ISSN 1391 - 1031
2012 අප්‍රේල්
18 වෙළුම 01 කලාපය
ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

'' කම්කරු පංතියේ විමුක්තිය දිනාගත යුත්තේ කම්කරු පංතියම විසින්ය යන්න අපි සියලු දෙනාම අවබෝධ කරගෙන සිටිමු. බහුජනතාව විඥාන ලෙස සංවිධානය වී සමස්ත ධනපති පංතියටම විරුද්ධව විවෘත පංති සටනක් පිළිබඳ දැනුම සහ පුහුණුව ලබන තෙක් සමාජවාදී විප්ලවයක් ගැන සිතිය නොහැක.''

**ලෙනින් (තෝරාගත් කෘති - 3 වෙළුම, 26 පිටුව)**

## 3 ජිනීවා විගඩම...




පසුගිය පෙබ. 27දා ජිනීවාවලදී රැස්වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ 19වැනි සැසිවාරය මාර්තු 23දා අවසන් වූයේ...

## 4 තරුණ



තම සිතට වදදෙමින් තිබූ පැනයට නාන තටාකයේදී විසඳුම සොයාග ැනීමෙන් ප්‍රීතියට පත් ආකිමිඩීස් යුරේකා! යුරේකා!! කියමින්...

## 5 සංවාදය



රටක ප්‍රධාන නීතිය බවට පත්වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. 1948න් පස්සේ අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ...

## 8 කලාකරුවා උපත ලබයි...



වර්තමානයේ 'කලාකරුවා' යැයි සඳහන් කරන විටම අපේ මනස තුළ මැවෙන පොදු සංකල්පයක් ...

## 9 සල්ලි අච්චු ගැහුවත්...



සමහරු කියන්නේ රුපියල වෙනස් වෙන්න පටන් ගෙන කියාය. අතගා බැලුවොත් රුපියලේ ...

මතවාද...................07
දැනුම..................... 10
කාලීන......................11
කාන්තා....................12
ජාත්‍යන්තර..............13
විශේෂාංග...............14




# ජිනීවා තොණ්ඩුව

# තවත් තද වෙන ලකුණු

**එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ජිනීවා සමුළුවේදී සම්මත වූ ශ්‍රී ලංකාවට එරෙහි යෝජනාව අරභයා ආණ්ඩුවේ වගකීම් විරහිත හැසිරීම හේතුවෙන් එහි බලපෑම තීව්‍රවීමේ ඉඩක් නිර්මාණය වී ඇති බව වාර්තා වේ.**

විශේෂයෙන් ජිනීවා යෝජනා සම්මතයෙන් පසු ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරුන් ආණ්ඩුවේ මතය ලෙස මාධ්‍ය හමුවේ දක්වා තිබූ අදහස් මෙම තීරණයට හේතුවී තිබේ. මර්වින් සිල්වා අමාත්‍යවරයා ජිනීවා යෝජනාවලට සහාය පළකළ රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීන් කිහිප දෙනෙකුට පහරදිය යුතු බවට ප්‍රකාශ කර තිබූ අතර නිමල් සිරිපාල ඇමතිවරයා කියා සිටියේ, එල්.එල්.ආර්.සී නිර්දේශ බයිබලය හෝ ධම්ම පදය නොවන බැවින් එයින් තමන්ට අවශ්‍ය දේ පමණක් ක්‍රියාත්මක කරන බවය. ඔවුන් මෙසේ ප්‍රකාශ කර තිබුණේ, ආණ්ඩුවේ උපදෙස් මත මහින්ද සමරසිංහ ඇමතිවරයා එම නිර්දේශ ක්‍රියාත්මක කරන බවට ජිනීවා කිමිටුව හමුවේ පොරොන්දුවී තිබියෙදීය.

මානව හිමිකම් කවුන්සලයේ 19වැනි සැසිවාරයට එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවට එරෙහි යෝජනාවක් ගෙන ආ මොහොතේ ආණ්ඩුව විසින් ව්‍යාජ අධිරාජ්‍ය විරෝධයක් සමාජගත කිරීමට උත්සාහ කර තිබුණි. කෙසේ වුවද යෝජනාව සම්මතවීමට අදාල පරිසරය ගොනැගීමට ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවිරෝධී හිතුවක්කාරී පාලනයත් අධිරාජ්‍යවාදී ආයතන හා රටවල් සමග ඇති කරගත් ප්‍රසිද්ධ හා අප්‍රකට එකඟතාත් හේතුවී තිබූ බව රහසක් නොවීය.

කෙසේ වුවද මෙම තත්වය තුළ සම්මත වූ ජිනීවා යෝජනා විසින් රටත් සිංහල දෙමළ මුස්ලිම් සියලු ජනතාවත් මහත් අනතුරක හෙළනු ලැබ තිබේ. ජිනීවා යෝජනාවේ තෙවැනි වගන්තය වූ 'මානව හිමිකම් කවුන්සලයේ තාක්ෂණික සහාය ලබාගත යුතු අතර 22 වැනි සැසිවාරයට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය' යන නිර්දශේය මගින් රටට මැදිහත්වීම සඳහා අධිරාජ්‍යවාදයට ඉඩක් නිර්මාණය වී තිබේ. මෙසේ ලබාගන්නා අවස්ථාවන් පසුකාලීනව රටක් සම්බන්ධයෙන් වැඩිදුර හා බරපතළ තීන්දුවලට යාමට අධිරාජ්‍යවාදී රටවල් උපයෝගී කරගෙන ඇති බව ජාත්‍යන්තර අත්දැකීම් පෙන්වා දෙයි.

එම අනතුර තේරුම් ගනිමින් ඊට මුහුණදීම සඳහා රාජතාන්ත්‍රික ප්‍රවේශයකට යනු වෙනුවට ජනතාවට හාස්‍ය ගෙන දෙන්නා වූත් රාජ්‍යතාන්ත්‍රික වශයෙන් ඉතා අමනෝඥ වූත් උද්දච්ඡ වූත් ප්‍රකාශ ප්‍රසිද්ධියේ සිදුකිරීම ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් අහිතකර තත්වයක් ඇති කරමින් තිබේ. ජී.එල්. පීරිස් විදේශ අමාත්‍යවරයා හදිසියේම වොෂිංටනය බලා කැඳවීමට මෙම තත්වය හේතුවී ඇති බව ප්‍රකාශ වන අතර ඉන්දීය දූත පිරිසක්ද නව තත්වය සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතය.

මෙම නව වර්ධනයන් පිළිබඳ අදහස් දක්වමින් ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා නියමුවා වෙත පැවසුවේ, අධිරාජ්‍යවාදයට පාර කපන මෙම ධනපති පාලනයට අධිරාජ්‍යවාදී මැදිහත්වීම් පරාජය කළ නොහැකි බවත් ඒ සඳහා අධිරාජ්‍යවාදය සහ ධනවාදය එක්මිටකට ගෙන පරාජය කළ හැකි සිංහල දෙමළ මුස්ලිම් සියලු ජාතිකත්වයන් එකතු කර ගත් දේශප්‍රේමී අරගලයක් අවශ්‍ය බවත්ය. ජ.වි.පෙ. ඊට නායකත්වය සැපයීමට සූදානම් බව කී ඔහු ඒ සඳහා සියලු ප්‍රගතිශීලී ජනතාවට ජ.වි.පෙ. සමග අත්වැල් බැඳගැනීමට ඇරයුම් කර සිටියේය.

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**



# වැඩ බිම

## අන්තර් සමාගම් 13වැනි සමුළුව අභිමානවත්ව මුළුදෙයි



ලංකාව පුරා විසිරී සිටින ආයතන 570 කට වැඩි ප්‍රමාණයක වෘත්තීය සමිති ශාඛා සාමාජිකයින් 5000කට ආසන්න පිරිසකගේ සහභාගිත්වයෙන් අන්තර් සමාගම් සේවක සංගමයේ 13 වන නියෝජිත සමුළුව පසුගිය මාර්තු 13වැනි දින සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්වුණු බව වාර්තා වේ.
පෞද්ගලික අංශයේ සේවකයාට 40% වැටුප් වැඩිවීමක් ලබාදෙන ලෙසත් විශ්‍රාම වැටුපක් ලබාදීමට කටයුතු කරන ලෙසත් ජීවන අංක දීමනාව රු. 280/=ක් ලෙස ගැසට් කරන ලෙසත් බල කරන විරෝධතා පාගමනකින් අනතුරුව පැවති මෙම සමුළුවේ ප්‍රධාන ආරාධිතයින් ලෙස ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාත් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයාත් සහභාගි වූහ. එමෙන්ම ජාත්‍යන්තර නියෝජිතයින් ලෙස වියට්නාමයේ ඩැන්ග් ක්වැන්ග් කියු සහෝදරයාද ලී කිම් ඩා ඕ සහෝදරියද ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් එච්. මහදේවන් සහෝදරයාද සහභාගි වීම විශේෂත්වයක් විය.

## ආණ්ඩුව දුම්රිය දේපළ විකුණන් කනවා

**සමස්ත ලංකා දුම්රිය පොදු සේවක සංගමය**

වැය කරන ලද මුදලට වඩා හරි අඩකටත් අඩුවෙන් දුම්රිය මාර්ග ඉදිකිරීමේ හැකියාව දුම්රිය සේවකයින් සතුව තිබියදී විදෙස් ප්‍රේමයෙන් ඔද වැඩී සිටින වත්මන් ආණ්ඩුව දුම්රිය මාර්ග ඉදිකිරීම ඉන්දියාවට ලබාදී ඇතැයි සමස්ත ලංකා දුම්රිය සේවක සංගමය පවසයි . එමෙන්ම ඓතිහාසික වටිනාකමකින් පමණක් නොව වසර සියයකටත් වැඩි පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් දුම්රිය මුලස්ථාන භූමිය ඇතුළු අක්කර 25 ක් විදෙස් සංචාරකයින්ගේ සුඛ විහරණය සඳහා විකුණා දැමීමට ආණ්ඩුව තීරණය කොට ඇති බවට චෝදනා කරන එම සංගමය ප්‍රවාහන අමාත්‍යංශය සහ ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) උප දෙපාර්තමේන්තුව පිහිටි ඩී.ආර්.විජේවර්ධන මාවත කැසිනෝ කලාපයක් වෙනුවෙන් මේවන විටත් වෙන්කර ඇති බව කියා සිටී. ඊට අමතරව ආණ්ඩුව වසර සියයකටත් වඩා පැරණි දුම්රිය නිවාස සංකීර්ණයක් පිහිටි අක්කර 30 ක් පමණ වූ දෙමටගොඩ මවුන්ට්මේරි භූමියද විකුණා දැමීමට සූදානමින් සිටින බවට දැනගන්නට ඇතැයිද එම සංගමය කියයි.
මහජන මුදල් කෝටි ගණනින් වැය කරමින් බාල දුම්රිය එංජින්, පෙට්ටි සහ උපකරණ ගෙන්වීමට කටයුතු කරන ලද ආණ්ඩුව එතැනින් නොනැවතී රුපියලේ අගය බාල්දු කර, තෙල් මිල අහස උසට ඉහළ දමා දුම්රිය සේවකයාද මහපාරට ඇද දමා ඇති බවටත් දුම්රිය දෙපාර්තමේන්තුවට වාර්ෂිකව රුපියල් කෝටි අනූවක පමණ අමතර මුදලක් දැරීමට සලස්වා ඇති බවටත් සමස්ත ලංකා දුම්රිය පොදු සේවක සංගමය චෝදනා කරයි.

## ජපුර රෝහලට දේශපාලන පත්වීම් එපා!

**සමස්ත ලංකා රජයේ වෛද්‍ය නිලධාරී සංගමය**



ශ්‍රී ජයවර්ධනපුර රෝහලට සිදුකරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂක ධූරයේ පත්වීම සම්බන්ධයෙන් තම සංගමය දැඩි විරෝධය පළ කරසිටින බව සමස්ත ලංකා රජයේ වෛද්‍ය නිලධාරී සංගමය පවසයි. එම සංගමයේ සංවිධායක ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා පවසන්නේ, මෙම පත්වීම ලබා දී ඇත්තේ, පුවත්පත් දැන්වීමකින් අනතුරුව බවත් ඒ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුව තිබූ බවය. වෛද්‍යවරයෙක් වීමත් පශ්චාත් වෛද්‍ය උපාධි සුදුසුකම් සපුරා තිබීමත් වෛද්‍ය පරිපාලන සේවයේ වසර 7 ක පලපුරුද්දක් තිබීමත් අවුරුදු 45ට වැඩිවීමත් එම සුදුසුකම් විය.
නමුත් ආණ්ඩුව විසින් පත් කොට ඇති තැනැත්තිය මෙම සුදුසුකම් කිසිවක් සපුරා නැති බව කියා සිටින එම සංගමය ඇයගේ වයස 44ක් බවත් ඇය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෛද්‍යවරියක් නොවන බවත් ඇය කිසිදු රෝහලක හෝ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයක අධ්‍යාපනය ලැබූ බවට කිසිදු සාක්ෂියක් සොයා ගැනීමට නොහැකි වී ඇති බවත් පෙන්වා දෙයි. ඊට අමතරව ඇය විසින් එම තනතුර සඳහා වැඩිපුර දීමනා ලබා ගෙන ඇති බවට විගණන වාර්තාවක් මගින් තොරතුරු ආවරණය වී ඇති බවද හෙළි කරන එම සංගමය සාමාන්‍යයෙන් මෙම තනතුරට පත්කරනු ලබන්නේ, වෛද්‍ය පරිපාලන සේවයේ සුදුසුකම් සැපුරූ වෛද්‍යවරුන් පමණක් බවද මේ ආකරයට දේශපාලන පත්වීම සිදුකිරීම බරපතළ ගැටලුවක් බවද පවසයි. මේ ආකාරයේ ආණ්ඩුවේ වගකීම් විරහිත ක්‍රියාවලට සමස්ත ලංකා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දැඩි විරෝධය පළ කර සිටින බවද එම සංගමයේ සංවිධායක ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා නිවේදනය නිකුත් කරමින් ප්‍රකාශ කර සිටී.

# පුවත්

## රටත් ජනතාවත් රැවටූ මාළඹේ පෞද්ගලික වෛද්‍යවිද්‍යාලය වහා රජයට පවරා ගනු!

සමාජවාදී ශිෂ්‍ය සංගමය
சோஷலிச மாணவர் சங்கம்
SOCIALIST STUDENTS UNION

ආයතනය රජයට පවරාගෙන වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කරන්නැයි සමාජවාදී ශිෂ්‍ය සංගමය ආණ්ඩුවට බලකර සිටී. මේබව සඳහන් වන්නේ, එම සංගමය විසින් පසුගියදා නිකුත් කරන ලද නිවේදනයකය. එහි මෙසේද සඳහන්ය.
මාළඹේ පෞද්ගලික වෛද්‍යවිද්‍යාලය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීමට ආණ්ඩුව විසින් පත්කළ කමිටුවේ වාර්තාව 2012.02.28 දින නිකුත් කර ඇත. එම කමිටුවේ සභාපතිවරයා වූයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය රවීන්ද්‍ර රුබේරු මහතාය.
මෙම වාර්තාවේ පහත සිදුවීම් හෙළිදරව් වී ඇත.
01. 2008.30.17 දින මෙම ආයතනය වෙනුවෙන් වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අවසර ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇති නම South Asian Institute of Technology and Managment (SAITM)ය. පසුව මෙම නම වංචනික ලෙස South Asian Institute of Technology and Medicine ලෙස වෙනස් කර ඇත.
02. ආයෝජන මණ්ඩලයේ අවසර ලබාගැනීමේදී වෛද්‍ය උපාධියක් පිරිනැමීම සඳහා කිසිසේත් අවසර ඉල්ලා නැති අතර අවසර ඉල්ලා ඇත්තේ සෞඛ්‍ය විද්‍යාව හා හෙද උපාධි පිරිනැමීමේ අවසරය පමණි.
03. 2008.03.31 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය SAITM ආයතනයට අවසර ලබාදී ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිසි අනුමැතියකින් පසුව සෞඛ්‍ය විද්‍යාව හා හෙද උපාධිය පිරිනමන ලෙසය. නමුත් වෛද්‍ය උපාධියක් පිරිනැමීමට නොව හෙද උපාධියක් පිරිනැමීමට පවා මෙම ආයතනයට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අවසර ලැබී නැත.
04. 2008.10.01 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා SAITM ආයතනය ගිවිසුමක් අත්සන් කිරීමට පෙරද සිසුන් කණ්ඩායම් දෙකක් බඳවාගෙන ඇත.
05. SAITM ආයතනය සඳහන් කරන අනුබද්ධ විශ්වවිද්‍යාලය වූ රුසියාවේ නිෂ්නිනොව්ගොරොද් විශ්වවිද්‍යාලය මේ වනතෙක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉල්ලුම්පතක්වත් ඉදිරිපත් කර නැත. නමුත් වෙළඳ දැන්වීම්වල පළකල ඇත්තේ මෙම රුසියානු විශ්වවිද්‍යාලය සඳහා ශ්‍රී ලංකාවේ අනුමැතිය ලැබී ඇති බවයි.
06. ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාව මෙම ආයතනය සඳහා අවසර දීම ප්‍රතික්ෂේප කර තිබියදීත් 2009.05.10 දින පුවත්පත් දැන්වීම් පළකරමින් ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් බඳවාගෙන ඇත.
07. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම ආයතනය සඳහා නවක සිසුන් බඳවාගැනීම අත්හිටුවා තිබියදීත් 05 වෙනි හා 06 වෙනි කණ්ඩායම් බඳවාගෙන ඇත.
එසේම ප්‍රතිපත්තිමය වශයෙන් මෙම ආයතනය පිළිගන්නා බවට උසස් තත්වයේ රෝහලක් ඉදිකිරීම සඳහා සුභපැතුම් පත් පිරිනමමින් 2009.01.07 දින සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් එවකට එහි පෞද්ගලික සෞඛ්‍ය අංශය සංවර්ධනය පිළිබඳ අධ්‍යක්ෂකවරයා ලිපියක් නිකුත් කර ඇත. බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා බවට පත් වූ ඔහු විසින් 2010.10.13 SAITM ආයතනය සඳහා ශික්ෂණ රෝහල් ලෙස හෝමාගම, අවිස්සාවේල්ල හා තලංගම යන රජයේ රෝහල් භාවිතා කිරීමට අවසර ලබාදී ඇත. එම නිලධාරියාගේ දියණියක්ද මුදලට වෛද්‍ය උපාධිය ලබැගැනීම සඳහා මෙම වෛද්‍ය විද්‍යාලයට ඇතුලත් වී ඇති බවද වාර්තා වේ.
2010 අගෝස්තු 30 දින එස්.බී. දිසානායක අමාත්‍යවරයා විශේෂ ගැසට් නිවේදනයක් මගින් වෛද්‍ය උපාධිය ප්‍රධානය සඳහා අවසර ලබාදුන් අතර මෙම ආයතනයට ඉන් නොනැවතී මහජන බැංකුවෙන් රුපියල් මිලියන 600ක ණය ආධාරයක්ද ලබාදීමට ඇමතිවරයා මැදිහත් විය. මෙසේ වංචනික ලෙස පිහිටුවා පවත්වාගෙන යන මාළඹේ පෞද්ගලික වෛද්‍යවිද්‍යාලයට ශිෂ්‍ය කණ්ඩායම් 06ක් බඳවාගෙන ඇත. එක් ශිෂ්‍යයෙකුගෙන් රුපියල් ලක්ෂ 70 බැගින් ලබාගනිමින් සිසුන් 373 දෙනෙකුගේ කෝටි ගණනක මුදල් ලබාගෙන ඇත. එහෙයින් තවදුරටත් රටටත් ජනතාවටත් වංචා කිරීමට ඉඩ නොදී මෙම ආයතනය රජයට පවරාගෙන වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කරන ලෙස අප ආණ්ඩුවට බල කර සිටිමු. එසේම මුදලට උපාධි ලබාගැනීමට ගොස් වංචාවට ගොදුරු වූ සිසුන්ට සාධාරණ වන්දියක් ලබාදීමට කටයුතු කරන ලෙසද ඉල්ලා සිටිමු.

### 9 පිටුවෙන් සල්ලි අච්චු...

එසේම ආණ්ඩුවට ඇති අමාරුම මඟ නිෂ්පාදනය යළි පණ ගන්වා අපනයන වර්ධනය කිරීමෙන් ආදායම් ජනිත කිරීම බව පැහැදිලිය. මෙම කඩා වැටෙන දුබල ධනපති ක්‍රමය ලෝකය තුළත් ලංකාව තුළත් එවැනි නිෂ්පාදනීය නව ආදායම් ජනිත කිරීමට අසමත්ය. එය රාජපක්ෂවරුන්ගේ හෝ වික්‍රමසිංහලාගේ පෞද්ගලික දෝෂයකට වඩා එහා යන සමාජ ක්‍රමයේම අර්බුදයයි.
ආණ්ඩුවේ කෙටි කාලීන අපේක්ෂාව වී ඇත්තේ, රුපියල බාල්දු වීමත් සමග ඩොලරයට ගෙවීමට සිදුවන රුපියල් ඉහළ යාමෙන් ආනයන සීමා වීමත් අපනයන සඳහා කලින්ට වඩා රුපියල් ලැබීම වැඩිවීමෙන් වෙළෙඳපොළ හිඟය දැන් පවතින මට්ටමට වඩා අඩුවේ යැයි කල්පනා කිරීමය. එසේම පවතින සෘණ තත්වය ඉක්මවන විදේශ විනිමය ප්‍රමාණයක් ලැබේය යන අපේක්ෂාවද ආණ්ඩුවේ නිලධාරීන් හා පාලකයන් තුළ පවතී.
නමුත් එවැනි හීනවලින් කෙටිකාලීන හීන සිත සනසා ගත හැකිවුවත් දිගු කාලීනව රටක් ලෙස මුහුණ දෙමින් එන නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියේ ඇති අසාර්ථකභාවයට මේ දුබල ධනපති ක්‍රමයටත් ඒ ක්‍රමය කරතියාගෙන යන වත්මත් සන්ධාන පාලකයන්ටත් පිළිතුරු නැත. මේ අර්බුදයට ඇති එකම විසඳුම වන්නේ, දිගුකාලීන සැලසුම් කරන සමාජවාදී ජනතා ආර්ථිකයක ප්‍රතිලාභයන්ය. එම ප්‍රතිලාභ ජනිත කරනු ඇත්තේ, මවන මුදල්වලින් නොව සැබෑ ශ්‍රමයේ ඵලදාව විසින්ය.

### 11 පිටුවෙන් බස්ගාස්තු...

වැනිදාට කළ යුතු බස් ගාස්තු සංශෝධනය පෙබ. 13 වන දින කළේ කුමන පදනමකින්ද? ඩීසල් මිල වැඩිවීම මත පදනම්ව පමණක් නොවෙයි මේ බස් ගාස්තු වැඩි කිරීම සිදුකොට තිබෙන්නේ. සාමාන්‍යයෙන් බස් ගාස්තු වැඩි කිරීම සඳහා ප්‍රධාන කරුණු 12 ක් ගණනය කරනවා. ඩීසල් කියන්නේ ඒකෙන් එක් කරුණක් පමණයි. ඒ ඩීසල් මිල වැඩි කිරීම මත පමණයි බස් ගාස්තු වැඩි කිරීමට අවස්ථාව තිබෙන්නේ. නමුත් තමුන්වහන්සේලා මෙම කරුණු 12 ම පදනම් කරගෙන බස් ගාස්තු වැඩි කර තිබෙනවා. ඒක වැරදියි.
මෙම ගාස්තු වැඩි කිරීම අනුව පෙනී යන්නේ මෙම වැඩි කිරීම සඳහා ඩීසල් මිල ඉහළ යාම පමණක් පදනම් කරගත්තක් නොවන බවයි. වාර්ෂිකව ජූලි මාසයේ 01 වැනිදාට පිරිවැය දර්ශකය සකස් කොට ඊට අනුව ගාස්තු සංශෝධනයක් කළ යුතු වුවද ආණ්ඩුව විසින් මෙම සංශෝධනයේදී ජූලි මාසයේ 01 වැනිදා කළ සංශෝධනය මාස 5 කට පෙර ලබා දී ඇති බව පෙනී යයි. අද අපේ රටේ ප්‍රවාහනය පිළිබඳ වැදගත්ම වරලත් ආයතනයක් විසින් කියා තිබෙන්නේ කුමක්ද? මේ හේතු කොට ගෙන මේ මාස 6 ඇතුළත් ලබා ගන්නා අමතර ගාස්තු වශයෙන් රුපියල් මිලියන 920 ක් සාමාන්‍ය මගීන්ට වැඩිපුර ගෙවීමට සිදුවන බවයි. අනෙකුත් ගාස්තු එකතු කිරීමත් නිසා මෙම සංශෝධනයේ බලපෑම රුපියල් මිලියන 3520 ක් පමණ වැඩිවී තිබෙනාවා.
ගරු කථානායක තුමනි, මේ බස් ගාස්තු සංශෝධනයෙන් ජූලි මාසයේදී වැඩි කරන්නට අවශ්‍ය ප්‍රමාණය මාස 6 කට පෙර වැඩි කළා. එම වැඩි කිරීම නිසා රුපියල් මිලියන 3550 ක් අපේ රටේ මගී ජනතාවට වැඩිපුර ගෙවීමට සිදුවී තිබෙනවා. ඒ අනුව මෙම බස් ගාස්තු වැඩි කිරීම මගින් තමුන්වහන්සේලාම සකස් කරපු කෙටුම්පත් කරපු 2002 කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරපු පත්‍රිකාව මුළුමනින්ම උල්ලංඝනය කොට තිබෙනවා. ඒ නිසා මා ඉල්ලා සිටින්නේ මෙම බස් ගාස්තු නැවත සංශෝධනය කළ යුතු බවයි. ඩීසල් මිල ඉහළ යාම මත පමණක් සිදු කළ හැකි මෙම බස් ගාස්තු සංශෝධනය අපේ රටේ සාතිශය බහුතරයක් පොදු මගී ප්‍රවාහනය ප්‍රයෝජනයට ගන්නා ජනතාවට පහසුවන ආකාරයේ සංශෝධනයක් විය යුතු බවද අවධාරණය කිරීමට කැමැත්තෙමු.

# 'ජිනීවා' විගඩම හා බේදවාචකය

පසුගිය පෙබ. 27දා ජිනීවාවලදී රැස්වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ 19වැනි සැසිවාරය මාර්තු 23දා අවසන් වූයේ, ලංකාව පිළිබඳව එක්සත් ජනපදය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්මත කර ගනිමිනි. මානව හිමිකම් කොමිසමේ සැසිවාරය ජිනීවාවලදී එසේ අවසන් වන විට ලංකාවේ රාජපක්ෂ ආණ්ඩුවව හා එහි කවටයින් විසින් රඟ දැක්වූ 'ජිනීවා නාඩගමේ' එක් දර්ශන වාරයක්ද නිමාවට පත්විය. ලංකාවේදී ජිනීවා නාඩගම, විගඩමක් බවට පත් වෙද්දී ජිනීවාවල සමුළුව අවසන් වී ඇත්තේ, ලංකාවට බේදවාචකයක් නිර්මාණය කරමිනි. එනම් ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට අත දැමීම සඳහා අධිරාජ්‍යවාදයට නිල අයිතිය ලබා දෙමිනි. ජිනීවා මානව හිමිකම් කොමිසමට එක්සත් ජනපදය ඉදිරිපත් කළ ලංකාව පිළිබඳ යෝජනාව සම්මත වීම වළක්වන බවටත් එය පරාජය කරන බවටත් රට තුළ වීදිබැස වහසිබස් දෙඩූ ආණ්ඩුව අවසානයේ ඔප්පු කළේ, එවැනි යෝජනාවක් පරාජය කිරීමට තමන් අසමත් බවය. ආණ්ඩුවට සැබෑ ලෙසම කළ හැක්කේ, රට තුළ බොරුවට අධිරාජ්‍යවිරෝධී රඟපෑමක නියැළෙමින් අධිරාජ්‍යවාදයට රට යට කිරීම මිස අධිරාජ්‍යවාදී බලපෑම් පරාජය කිරීම නොවන බව හොඳ හැටි ඔප්පු කර තිබේ. ජිනීවා යෝජනා සම්මත වී මෙරම් බරපතළ අනතුරක් රට හමුවේ නිර්මාණය වීමෙන් පසුව පවා ආණ්ඩුව ඉන් පාඩම් උගෙන ගන්නා බවක් නොපෙනේ. අවස්ථාවට අනුව වචන වෙනස් කරමින් සියලු දෙනා නොමග යැවීමට, රැවටීමට උත්සාහ කිරීමේ දෙබිඩි ප්‍රතිපත්තියෙන් මිදීමට ආණ්ඩුවට තවමත් නොහැකිවී තිබේ. පෙබ. 27දා ජිනීවාවල මානව හිමිකම් කොමිසම රැස්වූ දවසේ මහින්ද සමරසිංහ මහතා එහිදී කළ කථාවේ සිට මානව හිමිකම් කොමිසම පැවති මුළු කාලය පුරාම ලංකාව ජාත්‍යන්තර රටවලට සහතික වෙමින් කියා සිටියේ, තමන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නගන බවය. ඒ වෙනුවෙන් කැපවෙන බවය; එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන නිසා ඒ පිළිබඳ යෝජනාවක් අවශ්‍ය නැති බවය; උගත් පාඩම් කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නගන බවට සහතික වී තිබියදීත් ඒ පිළිබඳ යෝජනාවක් ගෙනඒම අසාධාරණ බවය.

එහෙත් දැන් මානව හිමිකම් කොමිසම අවසන්වී, යෝජනාවෙන් ලංකාව පරාජයට පත්වී අවසන් වූවාට පසු පසුගිය 26වැනිදා මාධ්‍ය හමුවකදී නිමල් සිරිපාල සිල්වා ඇමතිතුමා පවසා තිබුණේ, උගත් පාඩම් කොමිසමේ වාර්තාව බයිබලය හෝ ධම්මපදය නොවන බවත් එහි ක්‍රියාත්මක කළ යුතු දේවල් ක්‍රියාත්මක කරන බවත් ක්‍රියාත්මක නොකළ යුතු දේ ක්‍රියාත්මක නොකරන බවත් එය තීරණය කරන්නේ ආණ්ඩුව බවත්ය. ජිනීවාවලදී ලද පරාජය වසා ගැනීමත් ජිනීවා යෝජනාවේ ඇත්ත අනතුර ජනතාවට වසං කිරීමත් ආණ්ඩුවේ 'නිර්භීතකම' පෙන්වීමත් මෙහි අරමුණ විය හැක. කුමන අරමුණකින් කියූවද මෙය යළි ප්‍රතිවිරෝධතා රැසකට මඟ තනනු ඇත. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පිහිටුවන ලද්දේ ජනාධිපතිවරයා විසිනි. ඒ 2010 මැයි 15දාය. එහි වාර්තාව ජනාධිපතිවරයාට බාරදෙනු ලැබූයේ, 2011 නොවැ. 20දාය. එය බාරගත් ජනාධිපතිවරයා එම වාර්තාව කියවන පින්තූරයක් පුවත්පත්වල පළකළ අතර එහි ජනාධිපතිවරයා සිටියේ, පන්සිය පනස් ජාතක පොත කියවන කෙනෙකුගේ විලාසයෙනි. ඊළඟට දෙසැම්බර් 16 දා එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේද නිමල් සිරිපාල ද සිල්වා මහතාය. එහිදී නිමල් සිරිපාල ඇමතිවරයා කියන්නේ, උගත් පාඩම් කොමිසන් වාර්තාව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම හා ඒ පිළිබඳව ගනිමින් ඇති ක්‍රියාමාර්ගයන්ය. එහිදී ඔහු මෙසේ පවසයි. ''කොමිසන් සභා වාර්තාව යම් යම් නිශ්චිත සිද්ධීන් සඳහන් කිරීමෙන් ඒවා සිදුවීමට තුඩුදුන් තත්වයන් කෙබඳුදැයි පරීක්ෂාකර බැලීම සුදුසු බව දැන් සඳහන් කරයි. මෙම සිද්ධීන් පළමුකොට තරයේ පරීක්ෂාවට ලක්කර වරද සිදුකිරීම ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව දඬුවම් පැමිණවීමට සුදුසු බව රජය තරයේම විශ්වාස කරයි'' එලෙස පවසන නිමල් සිරිපාල මහතා තම කතාවේ අවසානයේ මෙසේද කියයි. 'උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසන් සභාව ඉතා කෙටි කාලයක් තුළදී තමාට පැවරුණු බැරෑරුම් කාර්යය කැපවීමෙන් හා වගකීමෙන් ඉටු කිරීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා නැවත සිය ස්තුතිය එම කොමිසන් සභාවට පළකරයි.

> ජිනීවා යෝජනා සම්මත වී මෙරම් බරපතළ අනතුරක් රට හමුවේ නිර්මාණය වීමෙන් පසුව පවා ආණ්ඩුව ඉන් පාඩම් උගෙන ගන්නා බවක් නොපෙනේ.

තවද මෙම ගරු සභාවේ සියලු මන්ත්‍රීවරුන් තම තමන්ගේ පක්ෂ සම්බන්ධතා ඉක්මවා යමින් යෝජිත වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යාමට මෙම තීරණාත්මක අවස්ථාවේදී සහාය දෙනු ඇතැයි රජය අපේක්ෂා කරයි'' එලෙස දෙසැම්බර් 16 වැනිදා වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් එහි අගය කොට එය ක්‍රියාත්මක කිරීමට සහය ඉල්ලූ නිමල් සිරිපාල ඇමතිවරයාම දැන් එම වාර්තාව බයිබලය නොවන බව පවසයි. නිමල් සිරිපාල මහතාගේ ආණ්ඩුව පත්ව ඇති අවුල තේරුම් ගැනීමට මෙයම ප්‍රමාණවත්ය.

රටම ඉතා බරපතළ අනතුරු ගෙනදිය හැකි මෙම ප්‍රශ්නයේදී අනෙක් ආණ්ඩු මෙන්ම රාජපක්ෂ ආණ්ඩුවද කටයුතු කළේ, වගකීම් විරහිතව හා අධිරාජ්‍යවාදී උපාය මාර්ගය ඉදිරියේ ළදරුවන් සේ හැසිරෙමිනි. ලංකාවට එරෙහිව එක්සත් ජනපදය ජිනීවාවල සම්මත කරගත් යෝජනාව අහම්බයක් හෝ සැබෑ ලෙසම මානව හිමිකම් රැකීමේ වුවමනාව නිසා කළ එකක් නොවේ. ලොව පුරා ජනතාවන් මරා දමමින් මහ දවාලේ රටවල් ආක්‍රමණය කරමින්, කුමන්ත්‍රණ කරමින් මානව හිමකම් උල්ලංඝනය කිරීමේ අංක එකේ සිටින එක්සත් ජනපදය අපේ රටවල මානව හිමිකම් ගැන කිඹුල් කඳුළු හෙළන්නේ, එම රටවලට අත පෙවීම සඳහා මිස සැබෑ ලෙස මානව හිමිකම් රැකීමට නොවේ. බේදවාචකය වන්නේ, රාජපක්ෂ පාලනය එය වටහා නොගැනීම හා මානව හිමිකම් නොරකිමින් එක්සත් ජනපදයට මානව හිමිකම් දඩමීමා කර ගැනීමේ අවස්ථාව ලබා දීමය.

එක්සත් ජනපදය ඇතුළු අධිරාජ්‍යවාදයත් ඉන්දීය ආධිපත්‍යවාදයත් ඉතා දිගු කලක සිට කටයුතු කරන්නේ, ලංකාව ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයට අනුව හසුරුවා ගැනීම සඳහාය. එබැවින් එක්සත් ජනපදයේ හා ඉන්දියාවේ, ලංකාව පිළිබඳ ප්‍රතිපත්තිය උපායමාර්ගික වුවමාන හා උපක්‍රමික අරමුණු සමඟ බැඳී තිබේ. යුද්ධය පැවති කාලය පුරා යුද්ධය උපයෝගීකර ගනිමින් ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට අත දැමූ හා රට බෙදීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ මොවුහු යුද්ධය නිමාවූ පසු දැන් මානව හිමිකම් නැමති සටන් පාඨය මගින් ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට අතපෙවීමටත් බෙදුම්වාදය වෙත ලංකාව යොමු කිරීමටත් කටයුතු කරති. ඒ අනුව සටන් පාඨ වෙනස් වුවවද මොවුන්ගේ අරමුණ එකකි. මෙම සත්‍යය තේරුම් ගැනීමට අසමත් වූ රාජපක්ෂ පාලනය කළේ, මානව හිමිකම් අවිය අධිරාජ්‍යවාදීන්ට ගැනීමට ඇති ඉඩ අහුරනවා වෙනුවට එය ඔවුන් අතට පත්කිරීමය; ඔවුන්ගේ උගුලට හසු වීමය.

යුද්ධය අවසන් වූ වහාම උතුරු නැගෙනහිර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරනවා වෙනුවට ජනතාවගේ මූලික ප්‍රශ්න කඩිනමින් විසඳා වගවීම හා ජාතික ප්‍රතිසන්ධානය සඳහා තම මැදිහත්වීම භාවිතයෙන් පෙන්වනවා වෙනුවට රාජපක්ෂ පාලනය කළේ, යුද ජයග්‍රහණයෙන් මත්ව, වල්මත්ව හිතුවක්කාරී ලෙස හැසිරෙමින් රටත් ලෝකයත් එකවර රැවටීමට උත්සාහ කිරීමය. ලංකාවේ පසුගාමී ධනවාදයට ජාතික ගැටලුව විසඳීමට හෝ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට හැකියාවක් නැත. එබැවින් සිදුවූයේ, ධනපති පාලනයේ දුර්වලකම හා නොහැකියාව විසින් අධිරාජ්‍යවාදයට නැවත අවස්ථාවන් විවර කර දීමය. එහිදී සරල ලෙස විසඳිය හැකි දේ පවා අත්හළ රාජපක්ෂ පාලනය සියලු දෙනා රැවටීමට ගොස් අවසානයේ පඹ ගාලක පැටලී ජිනීවා උගුලේ තමනුත් අසුවී රටත් අසුවන තැනට වැඩ කළේය.

2009 මැයි මස බෙදුම්වාදී යුද්ධය අවසන් වූ වහාම ලංකාවට එරෙහිව යෝජනාවක් මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කිරීමට එක්සත් ජනපදය සූදානම් වෙද්දී ආණ්ඩුව එය වළක්වා ගත්තේ 2009 මැයි 22දා තමන්ම යෝජනාවක් මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කර සම්මත කර ගනිමිනි. එම යෝජනාව මගින් ආණ්ඩුව මානව හිමිකම් කොමිසමට සහතික වූයේ, ''මානව හිමිකම්වලට ප්‍රමුඛතාවය ලබාදෙන බවත් අවතැන් වූවන් ඇතුළු පීඩාවට පත් අයට සහන සලසන බවත් නිතිපතා විනිවිදභාවය සහිතව පසුබිමේ තත්වය හා ගන්නා ලද පියවර පිළිබඳව මානව හිමිකම් කොමිසම දැනුවත් කරන බවත් එක්සත් ජාතීන්ගේ අදාල ආයතන හා මානව හිමිකම් කොමිසම සමඟ සහයෝගයෙන් කටයුතු කරන බවත්ය.

යෝජනාව සම්මත කරගෙන ඒ මොහොතේ තිබූ අනතුරෙන් මිදුණු ආණ්ඩුව දිගුකාලීනව සිදුවිය හැකි අනතුර නොසලකා යෝජනාවේ කරුණු නොසලකා හරිමින් කටයුතු කළේ, අධිරාජ්‍යවාදී ආයතන රැවටිය හැකියයි සිතමිනි.

2010 මාර්තුවන විට ආණ්ඩුවේ මෙම වගකීම් විරහිත හැසිරීම ගැන කණස්සල්ල පළකළ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැංකි මූන් පවසා සිටියේ, ආණ්ඩුව තම වගවීමෙන් කර අරින නිසා ලංකාව පිළිබඳව උපදෙස් ගැනීමට උපදේශක කමිටුවක් පත්කරන බවය. ලංකාවේ ආණ්ඩුවට යළි ඇහැ ඇරුණේ එවිටය. යළිත් කලබල වූ ආණ්ඩුව එක් අතකින් රට තුළ බොරු බැංකි මූන් විරෝධයක් නිර්මාණය කළ අතර නිව්යෝක්වලදී බැංකි මූන්ගේ කමිටුවේ සභාපති දරුස්මාන්ට දිවා භෝජන සංග්‍රහ පැවැත්වීය. ඒ අතර දරුස්මාන් කමිටුව රටට ඒම වැළැක්වීමට ජනාධිපතිවරයාම කොමිසමක් පත් කළේය. ඒ, උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමය. දැන් ආණ්ඩුව සිරවී සිටින්නේ, එම කොමිසමේ වාර්තාවේ නිර්දේශ තුළය. රාජක්ෂ ජනාධිපතිවරයාම පත්කළ කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට බලකරමින් එම කොමිසමේ නිර්දේශ තුළම ආණ්ඩුව සිරකොට බෙල්ලෙන් අල්ලා ගැනීමට අධිරාජ්‍යවාදීහු සමත්වූහ. ඒ, ඉන්දියාවේද සහාය සහිතවය. ආණ්ඩුවේ මුග්ධ හා තක්කඩිකමේ අවසන් ප්‍රතිඵල වූයේ රට යළිත් අධිරාජ්‍යවාදී බලපෑමට යටවිය හැකි අනතුරුදායක තත්වයකට පත්වීමය.

මානව හිමකම් කොමිසමේ සම්මත වූ යෝජනාවට අනුව,

1. ලංකාව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාවේ නිර්දේශ ක්‍රියාවට නැගිය යුතුය.
2. එම නිර්දේශ ක්‍රියාවට නැගීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක්, මාර්ග සිතියමක් සකස්කළ යුතුය.
3. ඒ සඳහා මානව හිමිකම් කොමිසමේ තාක්ෂණික සහාය ලබාගත යුතුය. ඒ අතර මානව හිමිකම් කොමිසමේ 22වැනි සැසිවාරයට කොමිසම විසින් ලංකා ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

මෙම යෝජනාවේ අනතුරුදායකම කොටස තුන්වන කොටසයි. එම කොටසට

15වැනි පිටුවට





''ලංකාවේ භූගෝලීය පිහිටීමේ උපායමාර්ගික වැදගත්කමත්, එහි එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට ඇති අභිලාෂයනුත් අනික් අතට ඉන්දියාවට එහි ඇති බලපෑමත් යන කරුණු ලංකාවේ වර්තමාන අර්බුදයට, විශේෂයෙන්ම ජාතික ගැටලුව අද පවතින තත්ත්වයට සංකීර්ණ වීමට බලපා ඇති බව නොරහසකි. ''

**රෝහණ විජේවීර - දෙමළ ඊලාම් අරගලයට විසඳුම කුමක්ද?**




# හෙට ලොව අපටයි!

වසරේ දින 365 පුරාවට කවරෙකුගේ හෝ සැමරුම් දිනක් නොවන දිනයක් සොයා ගැනීමට නොහැකි තරම්. සෑම දිනයක්ම පාහේ කවුරුන් හෝ පුද්ගලයෙකුගේ ගුණානුස්මරණයක්, පදවි ප්‍රාප්ත සැමරුමක් හෝ ජන්ම දින සංවත්සර සැමරුමකි. මෙසේ සමරනු ලබන පිරිස් අතර ජාතික වීරයෙන්, කලාකරුවන්, නොයෙක් විද්‍යාර්ථීන්, සමාජ සේවකයින් මෙන්ම දේශපාලනඥයින්ද වේ. සැමරුම්වලට සමගාමීව දිවයින් පුරා උත්සව මාලාවන්ය. ලේ දන් දීමේ පිංකම්ය. ප්‍රතිමාවන්ට පුෂ්පෝපහාර දැක්වීම්ය. ගුණ කථනය. එසේත් නැතිනම් සැමරුම අලලා සකස් කරන ලද රූපවාහිනී වැඩසටහන්ය. නොතිබූ ගුණ පවා අඩංගු කරමින් කරනු ලබන ගුණ වැයුම්ය.

මේ සියලු සැමරුම් අතර සැමරුම් දින නොමැති. සිහිවීම පිණිස පිළිම නෙලා නොමැති විරුවන් පිරිසක්ද මේ මහ පොළව මත නිහඬවම වැතිර නිදති. රටේ බොහොමයක් දෙනා ඔවුන් ජීවත් වූ බවවත් නොදනිති. එසේත් නැතහොත් අමතක කර දමා ඇත. සමස්ත රට වැසියාගේම සුභ සෙත වෙනුවෙන් තම තාරුණ්‍යය, ජීවිතය කැපකළ මේ විරුවන් නිහඬවම පස් කඳුයට සැතපෙමින් පීතෘ භූමිය පෝෂණය කරති. බක් මහේ උදාව අපට කියා පාන්නේ එසේ නිහඬවම මිහිදන් වූ විරුවන් පිළිබඳව මතකයයි. 1971 අප්‍රේල් 05 වන දින එක්තරා බලාපොරොත්තුවේ නිමේෂයක දී ඔවුහු අවි අත දැරූයේ සමස්ත දේශයේම නිර්ධන පන්තිය පීඩනයට පත් කරනු ලබන්නා වූ කුරිරු ධනේශ්වර පාලනය අවසන් කොට දුක් විඳින ජනී ජනයා වෙනුවෙන් වූ වඩා යහපත් පරිපූර්ණ සමාජයක් ගොඩ නැගීමේ උත්තම අභිලාෂය සිත්හි දරාගෙනය. සැමට සාධාරණ සමාජයයක් බිහි කිරීම වෙනුවෙන් අවි අතට ගත් ඔවුහු සැබෑ මානව ප්‍රේමීහු වූහ. නමුත් ඒ අපේක්ෂාව මල් එල ගන්වා ගැනීමට ඉඩ නොතැබූ ධනේශ්වර පාලකයෝ ඔවුන් වෙත මර්දනයයේ හස්තය ක්‍රියාත්මක කළහ. නම් ගම් පවා නොදන්නා මානවප්‍රේමී විරෝදාර තරුණ තරුණියන් රැසක් නිමේෂයක දී සංහාරය කරනු ලදහ.

එපමණක්න්ද නොසෑහී අත් අඩංගුවට පත් වූවන් හට තම සගයන් පාවා දීමට බල කරන ලදී. තමන් හට ජීවිත දානය ලබා ගැනීම වෙනුවෙන් ඇතැම් දුර්වලයින් තම දේශපාලන ව්‍යාපාරයද, සටන් සගයන්ද පාවා දෙමින් ආණ්ඩුවේ සාක්ෂිකරුවන් බවට පත් වූ මොහොතක බොහොමයක් විරෝදාර තරුණ තරුණියන් මරණය අභියස පවා තමා විශ්වාස කළ දර්ශනය හෝ තම සටන් සගයන් පාවා නොදී අභීත ලෙස මරු වැළඳ ගත්හ. තම සගයන් පාවා දෙන ලෙස බල කරමින් විදුලි කියතකින් දෙකට කපද්දී පවා වචනයක් හෝ හෙළි නොකොට මරු වැළඳ ගත් බද්දේගම කමල බන්දු සහෝදරයා පිළිබඳව අසන්නට ලැබෙන්නේ මෙවන් මොහොතකය. ඇතැම් සහෝදරවරුන් පොලිසියේ වෙඩි පහර කා ගෙන විමුක්ති ගී ගායනා කරමින් මිය ගියේ සතුරන් වෙත කිසිදු හෝ රහසක් හෙළ නොකරමිනි. ගතවූ හතළිස් එක් වසරක් පුරාවට බක් මහේ පිපෙනා එරබදු මල් රත්න වර්ණ වුයේ මෙම විරුවන්ගෙන් ගලා ගිය රුධිරයෙනි. මේ බිම සරු වුයේ ඔවුන්ගේ සිරුරු පස් කඳු අතර සිරවී පොහොර බවට පත් කරවාලමිනි.

අද දවසේ අපගේ පරමාර්ථය වන්නේද ඒ නිහඬ විරුවන් තම ජීවිත පරිත්‍යාගයෙන් තැනීමට වෙර දැරූ ලෝකය යථාර්ථයක් බවට පත් කිරීමය. එය අප හමුවේ ඇති ප්‍රමුකතම වගකීම වන අතර මානව පරම්පරාවේ අනාගතය වෙනුවෙන් අප ඉටු කළ යුතු යුතුකමක්ද වන්නේය. බක් මගේ විරුවන් මෙන්ම ඉල් මහා විරුවන්ද ජීවිත පරිත්‍යාගයන් වඩාත් අරුත් ගැන්වෙන්නේ අප එම යුතුකම් හා වගකීම ඉටු කිරීමට ගන්නා වූ කැපකිරීම තුළය.

## බක් මහේ කටහඬ...



එරබදු අතු නැමී රෑ හුළගේ හැපෙන
ගඟබඩ නුඹේ ණු ලේ පුසුඹම ඉහෙන
හිමිහිට පුංචි රතුමල් පෙති දිග හැරෙන
මේ බක් මහෙත් ඉව්රෙන් අත වනනු මැන

තෙලිකඩ ගඟේ දිය නෑ වෙනදා සිසිල
කිපිලා ලෝ දියව ලේ පාටයි ගඟුල
තොට මුණ ළඟ රබර් හේඩාවෙන් ඉගිල
කොතැනක සිර කළෙද නුඹේ ස් හඬ කොවුල

ඒ බක් මහේ රෑ හඳ දියවෙන කලට
නුඹේ සිරස පාවී ආවා තොටට
තියුණු නිවුණු සීතල දෑසෙහි රුවට
ඇවුලුණා පැතුම ගිනි දැල්ලක් ලෙසට

ගිනිබට වලින් පිඹහළ මරණයෙ විසට
විකාරව නොගිය නුඹෙ මුහුණත යසට
ඇඳී තිබෙනු දුටුවා පුදුමෙකි හිතට
පැතුම් සහගතව දිවි පිදුමෙක සතුට

අවියෙන් වනසන්න බෑ තුම් අරමුණි
හඬගා කියන නුඹෙ හඬ අහසේ හැපෙනු
ඇසුනා ඒ හඬේ නෑ මියගිය ලකුණු
මරණය සුන්දරයි සත්‍යය වෙත නැමුණු

නන්දන වීරසිංහ - කිරි සුවඳ රාත්‍රියක්

තරුණ

Soft Ware අයිති කාටද? තේමාවෙන් මාර්තු 28 කොළඹ ඩීන්ස් පාරේ සමාජය හා සාමයික කේන්ද්‍රයේ පැවති සම්මන්ත්‍රණයේදී පළවූ අදහස් ඇසුරින් සකස් කරන ලදී.

# හෝඩිය සිරගත කිරීමට එරෙහිව...

තම සිතට වදදෙමින් තිබූ පැනයට නාන තටාකයේදී විසඳුම සොයාගැනීමෙන් ප්‍රීතියට පත් ආකිමිඩීස් යුරේකා ! යුරේකා! කියමින් එවකට ග්‍රීසියේ වීදි පුරා, තම ඇඳුම් පවා නොමැතිව දිවගියේ නිමි හිමි නොවූ සිය සතුට ප්‍රකාශයට පත්කරමිනි. ඔහුට සිය සොයා ගැනීම ලෝකයෙන් සඟවාගැනීමට වුවමනා වූයේ නැත. ඔහුගේ සොයා ගැනීමෙන් ගණිතය හා විද්‍යාවේ නව පිම්මක් සනිටුහන් විය. අදද විවිධ සොයා ගැනීම් කරන අය ගැන අසන්නට ලැබේ. එවැනි අය නම් මුලින්ම දිවයන්නේ ඒවායේ පේටන්ට් අයිතිය හිමිකරගැනීමටය. ඉන් පසු තම නිපැයුමේ විද්‍යාත්මක පදනම් අන් අයගෙන් සඟවා තබාගනිමින් නිපැයුම අලෙවි කොට ලාභ ලබාගැනීමය. වාෂ්ප එන්ජිම සොයාගත් ජෝර්ජ් සටීවන්සන්ද එහි පේටන්ට් අයිතිය හිමිකරගෙන දශක හතරක් එය දියුණු නොකර අලෙවි කරමින් ධන කුවේරයකු විය. විදුලි බල්බය ඇතුළු තවත් නිර්මාණ සොයාගත් තොමස් අල්වා එඩිසන්ද මෙසේ තමන් සොයාගත් විද්‍යාත්මක රහස් අන්‍යන් ගෙන් සඟවාගෙන කටයුතු කර ඇත. පේටන්ට් අයිතිය පිළිබඳ නඩු නිසා ජේම්ස් වොට් හට සිය ජීවිතයේ වැඩි කාලයක් ගෙවීමට සිදුවූයේ විද්‍යාගාරවල නොව උසාවිවලය.



1995දී ලෝක වෙළඳ සංවිධානය (WTO) බිහිකරනුයේ අධිරාජ්‍යවාදී සූරාකෑම තවතවත් තීව්‍ර කිරීමේ අරමුණ ඇතිවය. එම වසරේදීම බුද්ධිමය දේපළ සඳහා සංයුක්ත බහුපාර්ශ්වීය වෙළඳ ගිවිසුමක් ඇති කරන ලදී. එය, "බුද්ධිමය දේපල අයිතීන්හි වෙළඳාම සම්බන්ද ක්ෂේත්‍ර පිළිබඳ ගිවිසුම" (Trade Related Aspects of the Interllectual Property Rights - TRIPS) නම් විය. එමගින් ලොව විවිධ රටවල සාම්ප්‍රදායිකව බුද්ධිමය දේපළ ලෙස සීමා වී තිබූ ලේඛන, විද්‍යාත්මක නිර්මාණ, කලා නිර්මාණ යන ක්ෂේත්‍ර වෙනුවට නව ක්ෂේත්‍ර එකතු කරන ලදී. පරිඝනක මෘදුකාංගවල සිට ජීවී විශේෂ පවා බුද්ධිමය දේපළ ලෙස අර්ථගන්වා ඒවාට අදාල නීතිහා රෙගුලාසි මාලාවක්ද සම්පාදනය කරන ලදී. "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩපිළිවෙළ හඳුන්වා දුන් එජාප ආණ්ඩුව 2003 වසර තුළ පමණක් විනාශකාරී පනත් 36ක් සම්මත කරගනු ලැබුනි. එහි එක් පනතක් වූයේ TRIPS ගිවිසුම අමු අමුවේම කොපිකර සකස්කළ 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතයි. මෙය පාර්ලිමේන්තුවේ බහුතරයෙන් සම්මත වූ අතර ජනතා විමුක්ති පෙරමුණ ඊට විරුද්ධ විය. මේ නීති පද්ධතිය අනුව අදාල මුල්‍ය වටිනාකම අදාල පුද්ගලයාට හෝ සමාගමට ගෙවීමෙන් තොරව ලේඛනයක්, මෘදුකාංගයක්, චිත්‍රපටයක්, ගීතයක් ආදී කිසිවක් ලබාගැනීමට නොහැකිය. පරිගනක හරහා පිටපත් කරගැනීම සපුරා තහනම් වන අතර, ඡායා පිටපත් ගැනීමද සිදුකළ නොහැකිය.






පනතට අනුව එවැනි වරදකට රු.ලක්ෂ 05ක උපරිම දඩයක්ද, මාස 06ක සිරදඬුවමක්ද හිමිවේ. එම වරදම දෙවතාවක් සිදුකර ඇති බව ඔප්පු වුවහොත් මෙම දඬුවම් දෙකම දෙගුණ කරනු ලැබේ. ඒ අනුව පරිඝනකයක් මිලදී ගන්නා කෙනෙකු ඒ සඳහා අවශ්‍ය මෘදුකාංග ද මිලදී ගතයුතුය.

දූන් රහස් පොලීසියත්, ආරක්ෂක අංශත් කුඩා වීඩියෝ තැටි අලෙවිසැල්වල සිට විවිධ ආයතන දක්වා කඩාපැනීම් සිදුකරන්නට පටන්ගෙන තිබේ. එපමණක් නොව ඒවායේ හිමිකරුවන් අත්අඩංගුවට ගෙන ලක්ෂ ගණන් දඩ ගසනු ලැබේ. වර්තමානයේ පරිඝනක මිනිස් ජීවිතයේ නැතිවම බැරි අංගයක් තරමට මිනිසාට සමීප වී තිබේ. කෙතරම්ද යත් මිනිස් දිවියේ 'හෝඩිය' බවට පත්ව තිබේ. එසේනම් මේ උදුරාගනු ලබන්නේ හෝඩියේ අයිතිය නොවන්නේද? සියල්ල මුදලට තීන්දු කෙරෙන ධනවාදී සමාජ ක්‍රමයකදී මෙය හැර අන්යමක් බලාපොරොත්තු විය නොහැකි බව පැහැදිලිය. මාක්ස් මීට වසර 160කට පමණ පෙර කොමියුනිස්ට් ප්‍රකාශනය ලියමින් මේ තත්වය ඉතා නිවැරදිවත් සරලවත් ලෝකයට පෙන්වා දුන්නේය. එහිදී මාක්ස් ධනවාදය ගැන මෙසේ කියයි.


"මිනිසා තම "ස්වාභාවික අධිපතීන්ට" බැඳ දමා තිබුණු විවිධ රදල බන්ධනයන් තූ තූ කොට ඉරා දැමූ එය මිනිසෙකු හා මිනිසෙකු අතර නග්න ආත්මාර්ථකාමීත්වයද, නිර්දය 'මුදල් ගෙවීමද' හැර අන් කිසිදු සබඳතාවයක් ඉතිරි නොකළේය. එය ආගමික භක්තියේ ස්වර්ගමය ප්‍රමෝදයන්ද, ධීර වීර උනන්දුවද, අවරසික අනුරක්තවාදයද, මමත්ව කේන්ද්‍රික ගණන් බැලීම නැමති අයිස් වතුරෙහි ගිල්වා දමා ඇත.එය පෞද්ගලික වැදගත්කම හුවමාරු වටිනාකම බවට පෙරළා ඇත. .......... එක වචනයකින් කියතොත්, ආගමික හා දේශපාලන මායාවන්ගෙන් වසා තිබුණු සූරාකෑම වෙනුවට, එය නග්න, අලජ්ජී, සෘජු හා ම්ලේච්ඡ සූරාකෑමක් ආදේශ කළේය. "

පරිඝනක භාවිතා කරන අයට තෝරා ගැනීම් කිහිපයක් ඇත. පළමුවැන්න නම් ඉහත වැරදි සිදුකර දඬුවම් විඳීමයි. දෙවැන්න නම් නීතියට අනුව පරිඝනක මෘදුකාංග මිලට ගැනීමයි. සාමාන්‍යයෙන් සුලභව භාවිතාවන මූලික මෘදුකාංග පවා අදාල මිලට ගන්නේ නම් රු. ලක්ෂ ගණනක් වැය කිරීමට සිදුවේ. තෙවැන්න නම් මුළුමහත් මානව සංහතියේම ඉදිරි ගමනට අඩතබන මෙවැනි පනත් හා ක්‍රියාවලීන් පැරදවීමට කටයුතු කිරීමයි. ලොවපුරාම ඒසඳහා දැවැන්ත පෙළ ගැස්මක් ගොඩනැගී තිබේ. විවෘත මෘදුකාංග (Open Sourse) භාවිතයට ගැනීම මෙහි ඉතාම වැදගත් පියවරකි. ඉතිහාසයේ වනගතව සිටි මානවයාගේ සිට ආකිමීඩීස් පමණක් නොව තවත් බොහෝ අප දන්නා, නොදන්නො කෝටි සංඛ්‍යාත මානව පරපුරක අත්දැකීම් මතින් වර්තමාන මිනිසා බිහිකොට තිබේ. ඒ නිසා 'දැනුම' කිසිවකුගේ පුද්ගලික බූදලයක් නොවේ. එබැවින් දැනුම සිරගත කිරීමට එරෙහි සටන යනු දේපල අයිතිය ධන කුවේරයන්ගෙන් නිදහස් කොට පොදු අයිතියට පවරාගැනීමේ සටනමය. එනම් සමාජවාදය සඳහා සටනමය. එය ජයග්‍රහණය කල යුතුය. එයින් තොරව මානවයාගේ ඉදිරි ගමනක් ගැන සිතිය නොහැකිය.

"ධනේශ්වර දේශපාලන පක්ෂ එකක් නැරම ඒවායේ උපතේ පටන්ම ජීවිත කාලය තුළම ජනතාව බොරුවෙන් හා වංචාවෙන් රැවටීම මුළා කිරීම, රැවටීමේ හැකියාව මතම ධනේශ්වර දේශපාලන පක්ෂවල සාර්ථකභාවය හා ජීවය රැඳී තිබේ. නමුත් නිර්ධන පංති දේශපාලන පක්ෂවල හා සංවිධානවල ජීවය රැඳී ඇත්තේ ජනතාවට සත්‍ය කීම හා ඒ කී දේ ක්‍රියාවට නැගීම මතය. අපි අපේ දේශපාලන ජීවිතයේදී සැමදාම ජනතාවට සත්‍ය පවසා ඇත්තෙමු. අපේ පංතිය වූ නිර්ධන පංතිය ප්‍රමුඛ සෙසු පීඩිත බහු ජනතාවට සත්‍යය පවසා ඇත්තෙමු. අපි කිරීමට බලාපොරොත්තු වන දේ කීවෙමු. කිව් දේ කළෙමු. නිර්ධන පංතිය ප්‍රමුඛ බහුජනතාවට සත්‍ය සැපයීම අපි අපේ පරම යුතුකම සේ සැලකුවෙමු."

රෝහණ විජේවීර

අප මරා දැමුවද අප නැගුහඬ සදා නොමියෙනු ඇත. පිටුව 40




## එන්න අපි එක්ව පියාඹමු!

# SYU දෙමළ බසින්

සමාජවාදී තරුණ සංගමයේ දෙමළ මාධ්‍ය සඟරාව ලෙස syu දෙමළ බසින් කළ එළි බැසීම පසුගිය මාර්තු 23 දා වව්නියාවේදී සිදු විය. අධිරාජ්‍යවාදීනුත්, ඔවුන්ගේ දේශීය ඒජයන්තයිනුත් යළිත් වරක් දෙමළ, මුස්ලිම් ජනතාව භේදභින්න කොට දැමීමට සැරසෙන මෙවන් වකවානුවක ජනතා සමගිය වෙනුවෙන්ද, දෙමළ බස හසුරුවන සොයුරු සොයුරියන්ට සැබෑ සත්‍ය දැනගැනීමට ඉඩ සැලසීම වෙනුවනේ ද මෙම පියවර අතිශය වැදගත් වනු ඇත.





# ලාභාපේක්ෂාවකින් තොරව පොදු ජන අරගලය වෙනුවෙන් දිවි පිදීම 71 සටන් සගයින්ගේ විශේෂත්වයයි

**ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජිනදාස කිතුලගොඩ සහෝදරයා**



''නිර්ධන පංතියට පැවරී ඇති ලෝක ඓතිහාසික කර්තව්‍යය පාවා නොදී, සියලුම අවි ආයුධ කසළ ගොඩට දැමිය හැකි වන්නේ, ධනපති පංතිය නිරායුධ කිරීමෙන් පසුව පමණකි. තවද නිර්ධන පංතිය නිසැක වශයෙන්ම මෙය ඉටු කරනු ඇත. එහෙත් ඒ මෙම කොන්දේසිය ඉටුවීමෙන් පසුව පමණි. කිසිසේත් ඊට වෙනස් නොවේ.''

**ලෙනින් (තෝරාගත් කෘති - 4 වෙළුම, 180 පිටුව)**

***නියමුවා:-*** *අප්‍රේල් නැගිටීමට වසර 41 ක් සපිරෙන මේ මොහොතේ ඔබට නැවතත් ඒ මතකයන් අතරට යන්නට ඇරයුම් කරනවා. එවකට පැවැති සමාජ ආර්ථික දේශපාලන වාතාවරණය අද තත්වය සමග සැසඳීමක් කළොත්...*

***කිතුලගොඩ සහෝදරයා:-*** රටක ප්‍රධාන නීතිය බවට පත්වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. 1948න් පස්සේ අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන දෙකක් ඇති වුණා. එකක් 1972 ජනරජ ව්‍යවස්ථාව. අනෙක 1978 ජේ. ආර්. ජයවර්ධනගේ ව්‍යවස්ථා සංශෝධනය. මෙයින් 1978 සංශෝධනය රටේ සමාජ-ආර්ථිකය හා දේශපාලන යන අංශවල ලොකු වෙනස්කම් පෙන්වන කඩඉමක් වුණා. විශේෂයෙන්ම 1978 ව්‍යවස්ථාවෙන් ගෙනාපු විධායක ජනාධිපති ක්‍රමයත් ඊට සමාන්තරව ක්‍රියාත්මක වුණ විවෘත ආර්ථික ක්‍රමයත් නිසා සමස්ත සමාජයම උඩුයටිකුරු වුණා. විධායකය, පාර්ලිමේන්තුවටත් අධිකරණයටත් ජනතාවටත් වග නොකියන තත්වයන් යටතේ ඒ වෙනස්වීම තේරුම් ගන්න පහසුයි. විධායක ජනාධිපති ක්‍රමය සහ විවෘත ආර්ථිකය සමාජ - ආර්ථික හා දේශපාලන ආදී වූ හැම ක්ෂේත්‍රයකටම කරන ලද බලපෑම හා ඉන් සිදු වී ඇති වෙනස්කම් අපට දකින්න පුළුවන්. ජාතික වශයෙන් ඇති එම තත්වයත් ජාත්‍යන්තර වශයෙන් සිදුවී ඇති වෙනස්කමුත් ඊට බලපා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ මූලික පංති පහට අදාලව එදා සාකච්ඡා වුණේ එදා පැවැතුණු සමාජ-ආර්ථික හා දේශපාලන තත්වයනුයි. එවකට රටේ පැවැතුණු මිශ්‍ර ආර්ථික ක්‍රමය දුබල එකක්. ඒ තුළ සහ අධිරාජ්‍යවාදී බලවේග විසින් නව යටත්විජිතවාදය හරහා අපේ සම්පත් කොල්ලකා ගැනීමට සට කපට උපක්‍රම යොදා තිබුණා. ඒ එදා. අද අපට ජාතික වශයෙනුත් ජාත්‍යන්තර වශයෙනුත් දකින්න ලැබෙන්නේ මහ දවාලේ, එළිපිට, කිසිදු හිරිකිතයක් නැතුව පාලකයින් මැදිහත් වී කරන රාජ්‍ය සම්පත් කොල්ලකෑමයි. එදා දුහුල් සළුවකින් වසා ගනිමිනුත් අද නිරුවතින්මත් ඒ රංගනය දකින්න ලැබෙනවා.

1971න් එපිට වකවානුව වන විට තමන්ගේ දේපළ උකස් කරමින් නම්බුව උදෙසා කළ දේශපාලනය වෙනුවට අද ඇත්තේ, ජාතික දේපළ තමන්ට ගොඩගහගන්න, ආත්ම ගරුත්වය තුට්ටුවකට නොසලකා හැරපු දේශපාලනයක්. 2000 පමණ වනවිට දේශපාලකයින් පාර්ලිමේන්තු ගියේ රේස් බුකීකාරයන් හා කුඩු ජාවාරම්කාරයන්ගේ සල්ලිවලිනුයි, පාතාලේ මැර කණ්ඩායම්වල අවි බලයෙනුයි කරන ජන්ද ව්‍යාපාර මගිනුයි. ඒත් අද වන විට කුඩු ජාවාරම්කාරයින් බුකීකාරයින් සහ පාතාල මැරයිනුත් පාර්ලිමේන්තුවට තේරි පත්වී සිටිනවා. ඉදිරියේදි එහි ප්‍රතිශතය වැඩි වෙන එක අනිවාර්යයි. එතකොට පාර්ලිමේන්තුවේ සම්මත වෙන්නේ ඔවුන්ට අවශ්‍ය අණ පනත්.

1965-1971 අතර කාලයේ ඉන්දියානු බලපෑම් දැඩිව තිබුණා. ඉන්දියානු බෝරකාරයින් රටේ ආර්ථිකයෙන් ලොකු පංගුවක් ගිල ගෙන තිබුණා. දෙමළ ජාතිවාදය පෝෂණය කරන දකුණු ඉන්දියානු (MGR රඟපාන) චිත්‍රපටි දෙමළ භාෂාව කථා කරන ජනතාව අතර මහා පරිමාණයෙන් ව්‍යප්ත වී තිබුණා. ඉන්දියාව ඉන්දියානු ව්‍යාපාරිකයන් මගින් ඉංදීය සම්බවයක් සහිත දෙමළ පීඩිත ජන කොටස් උපයෝගි කරගනිමින්, ලංකාවේ උතුරෙ ජනතාව හා තමිල්නාඩුව අතර



> 1965 අපේ පක්ෂය පටන් ගන්න වකවානුවෙ හිටපු තරුණ පිරිස් අද තරුණයින් තරම් දැනුම අතින් ඉහළ මට්ටමක හෝ තරඟකාරීත්වයක නොසිටියත් තමන්ගේ පුද්ගලික දෙයක් බලාගෙන ඉන්න තත්වයක සිටියා මිස පොදු වුවමනාවට පෙළ ගැසෙන පිරිසක් වුණේ නැහැ. ඒත් රෝහණ සහෝදරයාගේ කැපකිරීමේ ආදර්ශය හා පුද්ගලයින්ට සමීප වීමේ කලාව විසින් ඔවුන් පොදු වුවමනාවට පෙළ ගස්වන්න පමණක් නොවෙයි, පොදු වුවමනාව වෙනුවෙන් දිවි දෙන්නන් බවට පත් කරන්නටත් හැකි වුණා.

තිබූ ඥාති බැඳීම් උපයෝගී කරගනිමින්, සංස්කෘතිකමය මැදිහත් වීම් මගින් ලංකාව තුළ තම ව්‍යාප්තවාදී දේශපාලනය ගෙන ගියා. එය පැහැදිලි කිරීමට 'ඉන්දියානු ව්‍යාප්තවාදය' පංතිය මගින් අප පක්ෂය උත්සාහ ගත්තා. ඇතැමුන් අපට චෝදනා කළා, 'ජ.වි.පෙ. සිංහල ජාතිවාදී වෙමින් ඉන්දියානු ව්‍යාප්තවාදය පංතිය හරහා ජාතිවාදය අවුස්සනවා යැයි කියලා. අපේ රටේ ජාතික සමගියට හානි කරන හා රට බෙදන උතුරේ සහ නැගෙනහිර පළාත් සහ තමිල්නාඩුවත් එකතු කොට හදන්නට ගිය දෙමළ ඊළාම් රාජ්‍ය සංකල්පයටයි අපි විරුද්ධ වුණේ. ජ.වි.පෙ. කවදාවත් ජාතිවාදී වුණේ නැහැ.

එදා මෙන්ම අදත් ඉන්දියාව අපේ රටේ ආර්ථිකය ග්‍රහණය කර ගන්නට මෙතෙක් කටයුතු කළ ආකාරයත් ඉදිරි සැලසුම් පිළිබඳවත් පැහැදිලි සාධක තිබෙනවා.

එවැනි තත්වයක් ඇස්පනා පිට පෙනුණත් ඇඟිල්ලෙන් ඇන පෙන්වන්න සිදුවු තත්වයකුයි එදා තිබුණේ. සාධාරණ සමාජ ක්‍රමයක් වෙනුවෙන් තම ජීවිත පූජා කරන්නට සූදානම් ජනතාවක්, ඒ වෙනුවෙන් පෙළ ගස්වන්නට විජේවීර සහෝදරයා සමත් වුණා. අද විධායක ක්‍රමය විසිනුත් විවෘත ආර්ථිකය විසිනුත් ඇතිකර තිබෙන මහා විනාශය ඇස් පනාපිට පෙනෙන්න තිබෙන නිසා, ඊට එරෙහිව ජනතාව පෙළ ගස්වන්න පහසුයි. ආපසු හැරි බලා, අඩු පාඩු තේරුම් ගෙන පවතින ධනේශ්වර ක්‍රමය පෙරළා දමා සමාජවාදී සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීමේ කටයුත්ත සඳහා ජනතාව පෙළ ගැස්වීමේ කාර්යයට සැලැසුම් සකස් කොට එය යථාර්ථයක් බවට පත්කිරීමේ කාර්යයට උරදී ඇත්තේ ජ.වි.පෙ. පමණයි.

***නියමුවා:- මර්දනයට මුහුණ දීමේදී 71 පරම්පරාවේ සටන් සගයින්ගේ වීරත්වය, පක්ෂයේ අත්දැකීම් තුළ මහත් අභිමානයෙන් ස්මරණය කෙරෙනවා. එයට බලපෑ විශේෂ හේතු මොනවාද?***

***කිතුලගොඩ සහෝදරයා:-*** අයුක්තියට අසාධාරණයට හා කෲර පාලකයින්ට එරෙහිවද විදේශීය ආක්‍රමණිකයින්ට එරෙහිවද ඉතිහාසයේ විවිධ අවස්ථාවල විවිධ මාදිලියේ විමුක්ති අරගල අපේ රටේ පැන නැගුණා. එක් සමාජ ක්‍රමයක් (ධනේශ්වර සමාජ ක්‍රමය) පෙරළා දමා නව සමාජ ක්‍රමයක් (සමාජවාදී සමාජ ක්‍රමය) උදා කිරීමේ අරමුණෙන් අපේ රටේ ඇවුළුණු පළමු වැනි අරගලය 71 අරගලයයි.

කිසිදු පෞද්ගලික ලාභාපේක්ෂාවකින් තොරව පීඩිත ජනතාවගේ විමුක්තිය සඳහා වු පොදු ජන අරගලය වෙනුවෙන්ම තම ජීවිත පුදකිරීම 71 අරගලයේදී දිවිපිදු සටන් සගයින්ගේ විශේෂත්වයයි. ඕනෑම කෙනෙකුට තම ජීවිතයේදී වඩාත්ම වටිනා වස්තුව තම ජීවිතයයි. එබඳු වූ තම ජීවිතය, සමස්ත සමාජයේම විමුක්තිය නමැති උතුම් අරමුණ වෙනුවෙන් පුද කිරීමට ඉදිරිපත් වන්නන් සැබැවින්ම වීරවරයින්මයි.

කෲර වධ බන්ධනවලට මුහුණ දෙමින් විප්ලවවාදීත්වයේ කිසිදු වැහැරීමකින් තොරව තම ජීවිතය පුදකිරීම, මෙම වීරවරයිනගේ විශේෂත්වයයි. එබඳු කෙනෙකු - දෙන්නෙකු නොව දස දහස් ගණන් නිර්මාණය කිරීමට සමත් වු නායකත්වය සහ එම නායකත්වය විසින් ගොඩනැගූ පක්ෂය සැබවින්ම අභිමානයෙන් යුතුව සැමරිය යුතුමයි. අඩිය. පොළෙවේ හප්පන විට, බියෙන් වෙව්ලා, දන්නා-නොදන්නා සියලු දේ වමාරන නිවටයින් වෙනුවට එදා අපට දකින්න ලැබුණේ, මරණයෙන් හෝ ඉන් මෙපිට කරන කිසිදු මෘග ක්‍රියාවකින් නොසැළුණු සැබෑ විරයින්. තම අත් පා කපා දමද්දීත් කියතෙන් ඉරා සිරුර දෙපළු කරද්දීත් අත්පා බැඳ ගිනි ගොඩට දමා පණපිටින් පුළුස්සා මරණයට පත් කරද්දීත් අත් පා බැඳ ගිනිගොඩට දමා පණ පිටින් පුළුස්සා මරණයට පත් කරද්දීත් නිර්ධන පංති ව්‍යාපාරයට එරෙහිව වචනයක් පිට නොකළ ඔවුන් හැර අභිමානයෙන් යුතුව සැමරිය යුත්තේ වෙන කවුරුන් ද?

***නියමුවා:- පක්ෂයට මුල සිටම විශාල හානියක් ගෙන දුන් කල්ලිවාදය පිළිබඳ අත්දැකීම් විශාල ප්‍රමාණයක් ඔබ සතුයි. මේ කාලය තුළ ඒවායේ වර්ධනයන්හි සමාන-අසමානකම් පිළිබඳ ඔබේ අදහස?***

***කිතුලගොඩ සහෝදරයා:-*** කල්ලිවාදය හෝ කණ්ඩායම්වාදය, ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවය අනුව කටයුතු කරන, මාක්ස්-ලෙනින්වාදී පක්ෂයක් කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ. ජ.වි.පෙ.ටත් අදාලව ඒක එහෙමමයි. හැබැයි, එවැනි ඕනෑම පක්ෂයක එබඳු ප්‍රවණතාවන් ඇති වෙන්න පුළුවන්. හේතුව, විප්ලවවාදී පක්ෂයට සාමාජිකයන් එකතු කර ගන්නේ ධනේශ්වර සමාජයෙනුයි. කණ්ඩායම් වාදය හෝ කල්ලිවාදය කියන්නේ අවස්ථාවාදයේ ලක්ෂණයක්. අවස්ථාවාදය කියන්නේ කම්කරු පංති ව්‍යාපාරය තුළ සුළු ධනේශ්වර මතවාදයේ ක්‍රියාකාරීත්වයක්. ධනේශ්වර සමාජයෙන් එන පුද්ගලයින් තුළ සුළු ධනේශ්වර නෂ්ඨාවශේෂ පවතින්න පුළුවන්. ඒකයි එහෙම වෙන්නෙ.

මෙම තත්වය අපේ පක්ෂය තුළ පමණක් නෙවෙයි ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ බොහෝ පක්ෂ තුළ

15වැනි පිටුවට

# ගොවි සටන් රට පුරා




ඉඩම් උරුමයට බැඳි සිටින ගොවියා එක්තරා ආකාරයක වත්කම් හිමියෙක් වශයෙන් සැලකේ. ඒ නිසා ගොවීන් අයිතිවාසිකම් ඉල්ලන අරගලවලට සම්බන්ධ කර ගැනීම ඇඟෙන් කට්ටක් ගන්නවා වැනි තත්වයක පැවැතිණ. එහෙත් ආශ්චර්යමත් රාජපක්ෂ පාලන යුගය නියෝජන කරන අන්ත දුබල ධනපති ක්‍රමය විසින් එවැනි ගොවියාද අරගල බිමට ඇද දමා අවසන්ය. එළවළු කුඩ සටන අවසන් වී උණුසුම මැකී යාමටත් පෙර වියපත් ගොවීන් සටන් මගට ඇද දැමීය. ඒ, නවතා දමා තිබෙන ගොවි විශ්‍රාම වැටුප දිනා ගැනීමේ සටනටය. එම ප්‍රශ්නය නිමා නොවී ඇති අතර අරගලය උණුසුම් වෙමින් තිබේ. දැන් වී විකුණා ගත නොහැකි ගොවියාද සටන් මගට ඇද දමා අවසන්ය. එළවළු ගොවියාද ඒ සමඟ සටන්වලට අවතීර්ණ කර තිබේ.

ගොවි විශ්‍රාම වැටුප් යළි දිනා ගැනීමට, වීවල අවම සහතික මිල රුපියල් 40/- දක්වා වැඩිකර එය පාර්ලිමේන්තු පනතක් මගින් නිතීගත කරන ලෙස බලකරමින් රට පුරා විවිධ ප්‍රදේශවල ගොවි උද්ඝෝෂණ පැවැත්වීය. මෙම උද්ඝෝෂණවලට නායකත්වය දෙන ලද්දේ සමස්ත ලංකා ගොවිජන සම්මේලනයි. ගොවි සටන් ක්‍රියාමාර්ග වශයෙන් පෙත්සම් අත්සන් කිරිම සහ අත් පත්‍රිකා බෙදීම, ගොවි හමු පැවැත්වීම සිදු කරන ලදී. ඉතා සාර්ථකව උද්ඝෝෂණ පැවැත්වීමද සිදු කළේය. මාර්තු 12වනිදා ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් සමන්තුරෙයි හිදී ගොවි රැස්වීමක් පැවැත්වීය. මාතලේ, දඹුල්ල, මොණරාගල, අම්පාර, හසලක, කුරුණෑගල, අම්බලන්තොට, අනුරාධපුර, එප්පාවල, මින්නේරිය යන නගරවල සාර්ථක ගොවි උද්ඝෝෂණ පැවැත්වීය. ඡායාරූපයෙන් දැක්වෙන්නේ අනුර කුමාර දිසානායක, නාමල් කරුණාරත්න සහෝදරයන් මාර්තු 27 වෙනිදා දඹුල්ල නගරයේදී ඉතා සාර්ථක පවත්වන ලද ගොවි උද්ඝෝෂණයේ අස්ථාවකි.

# සහෝදරත්වයේ උණුසුම ත්‍රි'මලේට



යුද්ධය අවසන් වී වසර තුනකට ආසන්න කාලයක් ගෙවී ගොස් තිබියදීත් උතුර, නැගෙනහිර ප්‍රදේශවල සිවිල් පරිපාලනය යළි ස්ථාපිත කිරීමට රාජපක්ෂ ආණ්ඩුව කටයුතු කර නැත. මේ ප්‍රදේශ වල ජනතාවගේ මූලික අයිතිවාසිකම් ලබාදී ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කර නොමැත.

මේ තත්ත්වය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදාහැරීමක් මාර්තු 17 දා ත්‍රිකුණාමලයේදී සිදු කරන ලදී. 'සහෝදරත්වයේ ජනතා පවුර' මගින් එය සංවිධානය කර තිබිණ. ජ.වි.පෙ මධ්‍යම කාරක සභිකයන් වන සුනිල් හඳුන්නෙත්ති සහ රාමලිංගම් චන්ද්‍රසේකර් යන සහෝදරවරුන්ගේ මූලිකත්වයෙන් මෙය සිදු කරන ලදී. මූලික අයිතිවාසිකම් අහිමි වී සිටින එහෙත් ඒ ගැන සොයා බැලීමට හෝ එම ජනතාවගේ වේදනාවන්ට කන්දෙන කිසිවකු හෝ නොමැත. ජනතා විමුක්ති පෙරමුණ දිගින් දිගටම ඔවුන්ගේ ප්‍රශ්න පිළිබඳව ජාතික තලයේදී උපරිම මැදිහත්වීම් සිදු කරමින් සිටී. ඒ අතර එම ජනතාව ළඟට ගොස් ප්‍රශ්න සාකච්ඡා කිරීම පිළිබඳව ජනතාවගේ දැඩි ප්‍රසාදය පළ විය. 'සහෝදරත්වයේ ජනතා පවුර' තම ඓතිහාසික වගකීම ඉතා හොඳින් ඉටු කරමින් සිටී.

# සටන් ක්‍රියාමාර්ග විදේශ දක්වා පැතිරේ



ඉහළ දමන ලද ඉන්ධන මිළ වහාම පහත හෙලන ලෙස සහ ඉන්ධන මිල ඉහළ දැමීමත් සමග ඉහල දමන ලද බස්ගාස්තු, විදුලි බිල ද එයට සමාන්තරව ඉහළ දමන ලද සියලුම භාණ්ඩවල මිල ගණන් පහත හෙළන ලෙස ආණ්ඩුවට බලකරමින් දකුණු කොරියාවේදී සහ ඉතාලියේදී පත්‍රිකා බෙදා හරින ලදී. එම රට වල සිටින ශ්‍රී ලාංකිකයින් දැනුවත් කිරීම සඳහා මෙම පත්‍රිකා බෙදා හැරීම සංවිධානය කර තිබුණේ ජනතා විමුක්ති පෙරමුණේ දකුණු කොරියානු කමිටුව සහ ඉතාලි කමිටුව විසිනි.

ඉන්ධන මිල විශාල වශයෙන් ඉහළ දැමීමෙන් විදේශගත ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන්ද දැඩි ආර්ථික පීඩනයකට මුහුණ දී සිටී. මෙම පීඩනය දිගින් දිගටම දරාගෙන සිටිය නොහැකි බැවින් සහ භාණ්ඩ මිල ඉහළ දැමීම නිසා පොදු ජනතාව මුහුණ දී සිටින බරපතළ ආර්ථික පීඩනය පිළිබඳවත් රටේ නිෂ්පාදන ක්‍රියාවලියට සිදු වන අහිතකර බලපෑම් නැවැත්වීම සඳහාත් වහාම ඉන්ධන මිල පහත හෙළා භාණ්ඩ මිල අඩු කිරීමට පියවර ගන්නා ලෙස ආණ්ඩුවට බල කරමින් විදේශගත ශ්‍රී ලාංකිකයින් දැනුවත් කිරීම මෙම දෙරට තුළ පත්‍රිකා බෙදා හැරීමෙන් ආරම්භ කෙරිණ.

දකුණු කොරියාවේ යොන් ඉල් සහ සොල් ක්වන් වූ යන නගරවලදී පත්‍රිකා බෙදීම සිදු කරන ලදී. ඊට අමතරව සංවාදශීලිව ජනතාව දැනුවත් කිරීමද මෙහිදී සිදු කළ විශේෂත්වයකි.

# වතුකරයෙන් උණුසුම් ප්‍රතිචාර...



වන මිල ඉහල දැමීම සහ රට තුළ උද්ගතව තිබෙන ආර්ථික අර්බුදය, ප්‍රජාතන්ත්‍රවාදය අහුරා දැමීම ඇතුළු වත්මන් ආණ්ඩුවේ ජනතා විරෝධී ක්‍රියාමාර්ග පිළිබඳව දෙමළ ජනතාව දැනුවත් කිරීමට ගෙයින් ගෙට ගොස් පත්‍රිකා බෙදීමේ හා සංවාදශීලීව කරුණු පැහැදිලි කිරීම් අවිස්සාවේල්ල ලබුගම වත්තේදී, හැටන්, මස්කෙළිය, බලවන්තලාව, තලවකැලේ යන ප්‍රදේශවලදී ඉහළ ජනතා ප්‍රතිචාර මැද සිදු කරන ලදී. අවිස්සාවේල් ආසන බල මණ්ඩලය විසින් සංවිධානය කර තිබූ පත්‍රිකා බෙදීමේ හා සංවාදශීලී ජනහමු වලට සහභාගි වූයේ ජ.වි.පෙ හිටපු පළාත් සභා මන්ත්‍රී මරුගන් මෝහන් සහෝදරයාය. එමෙන්ම පෙත්සමට අත්සන් ගැනීම සහ පත්‍රිකා බෙදමින් ජනතාවට කරුණු පැහැදැලි කිරීමේ ගෙන්ගෙට යාමේ ව්‍යාපාරයට හැටන්, මස්කෙළිය, බගවන්තලාව, කලවකැලේ යන ප්‍රදේශවලදී එක්වූයේ ජ.වි.පෙ මධ්‍යම කාරක සභික රාමලිංගම් චන්ද්‍රසේකර සහෝදරයාය. මෙම ප්‍රදේශවල ජීවත් වන ජනතාවගෙන් ඒ සඳහා ඉහළ ප්‍රතිචාරයක් ලැබිණ. විශේෂයෙන්ම තමන් මුහුණ දී සිටින භාණ්ඩ මිල වැඩිවීමේ ප්‍රශ්නය සහ දෛනික දළු නෙළීමේ ඉලක්කය සපුරා ගත නොහැකි වීම පිළිබඳව තම දුක්ගැනවිලි ජනතාව රාමලිංගම් චන්ද්‍රසේකර සහෝදරයා ඉදිරියේ තැබූහ.

# ජීනිවා නාඩගම හා ආණ්ඩුවේ ඇස්බැන්දුම




ජනතාවට බලපාන සියලුම ප්‍රශ්න දිනෙන් දින උග්‍රවෙමින් තිබියදී ඒ කිසිවකට පිළිතුරු ලබාදීමට අසමත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව සියලු ප්‍රශ්න යටපත් කිරීමට ජිනීවා නුවර මානව හිමිකම් කොමිසම යොදා ගැනීමට මාන බැලීය. මහජනතාව මුළා කිරීමේ ආණ්ඩුවේ මෙම සැලසුම සහ යුද්ධය නිමා කිරීමෙන් පසු රට තුළ මානව හිමිකම් තහවුරු කිරීම වෙනුවට අධිරාජ්‍යවාදී උවමනාවන් ඉටු කරමින් බොරු ඇමරිකානු විරෝධයක් මවාපෑමේ දෙබිඩි පිළිවෙත කුමක්ද යන්න පැහැදිලි කරන සම්මන්ත්‍රණයක් ජනතා විමුක්ති පෙරමුණ විසින් සංවිධානය කළේය.

'ජිනීවා නාඩගම සහ ආණ්ඩුවේ ඇස්බැන්දුම්' යනුවෙන් එම සම්මන්ත්‍රණයේ නම් කර තිබිණි. එහි ආරම්භක දේශනය මාර්තු 6වැනිදා කොළඹ මහජන පුස්තකලයේදී ප්‍රධාන ලෙකම් ටිල්වින් සහෝදරයා විසින් පවත්වන ලදී. එම සම්මන්ත්‍රණය නුවරදී පැවැත්වූයේ, මධ්‍යම කාරක සභික අනුර දිසානායක සහෝදරයා විසිනි. එමෙන්ම ''ජිනීවා පරාජයෙන් පසු'' යනුවෙන් මෙයට සමගාමී සම්මන්ත්‍රණයක් පක්ෂයේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා විසින් පැරිසියේදී පවත්වන ලදී. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රංශ කමිටුව විසින් සංවිධානය කරන ලදුව මාර්තු 31 දා එය පැවැත්විණි.

# කාන්තා සටන් පෙරමුණ ශක්තිමත් වෙමින්...



ශ්‍රී ලාංකික කාන්තාව තව දුරටත් ආසියාතික සමාජයක් නියෝජනය කරන්නියක් නොවේ. එනිසාම සාහිත්‍යකරුවන්ගේ ව්‍යාජ වර්ණනාවලට නිමිත්තක්ද නොවන්ණිය. විශාකාතොමෝ පැමිණි විලාසයෙන් යනුවෙන් හෝ කළෙත් අරන් ළිඳට ගිය ටිකිරි ලියෙකු හෝ නොවන්නීය. එපමණක් නොව තුට්ටුදෙකේ ටෙලි නාට්‍යවල පෙනීසිටින කාන්තා භූමිකා හෝ තරුණියන්ගේ භූමිකාද ඇය කෙරෙහි වලංගු නොවන්නීය. ගමන් දිශානතිය පිළිබඳ මෙලෝ හසරක් නොදන්නා ධනපති ක්‍රමයේ මුළු මහත් බරක් හිසින් දරන්නී ඇයයි.

වසර 140ක් පුරා වතුකරයේ අසීමිත පීඩාවන් විඳීම නිසාද දශක 4කට ආසන්න කාලයක් පුරා මැදපෙරදිග ඇතුළු විදේශ රටවල ශ්‍රමය වැගිරීම නිසාද දශක තුනකට වැඩි කාලයක් පුරා වෙළඳ කලාපවල ගත දියකර ඩොලර් ඉපයීම නිසාද රජයේ හෝ පෞද්ගලික අංශයේ කාර්යාලවල මෙන්ම ව්‍යාපාරික ආයතනවල ද ලාභ ශ්‍රමය සැපයීම නිසාද මේ ජරපත් ධනපති ක්‍රමය ඇය නිසා තවදුරටත් රැකෙමින් පවතී. මේ තත්වය අනුව අනෙක් අතට කියවෙන්නේ මානව වර්ගයාට සතුරු ධනපති ක්‍රමය වෙනස් කිරීමේ සුවිශාල හැකියාවක් ශ්‍රී ලාංකීය කාන්තාව විසින් අත්පත් කරගෙන ඇති බවය. මේ තත්වය තුළ ඇය වෙනුවෙන් වෙන් වූ සටන් පෙරමුණක සුවිශාල කාර්ය භාරයක් පවතී.

සමාජවාදී කාන්තා සංගමය එම සටන් පෙරමුණ ශක්තිමත් කරමින් නව මානයන් ඔස්සේ සටන් බිම් සොයා යමින් සිටී. ඉදිරියේදී ද ඕනෑම තත්වයක් යටතේ සටන් කිරීමේ අභියෝගය භාර ගනිමින් ධනපති ක්‍රමය පරාජය කර සමාජවාදී සමාජයක් බිහිකිරීමේ. උත්තුංග අනූපමේය කාර්ය භාරය තම උරමත දරන්නීය. සමාජවාදී කාන්තා සංගමයේ තුන්වන ජාතික මහා සමුළුව මාර්තු 08වෙනි දිනට යෙදුනු ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව අති උදාරත්වයෙන් මුළුදෙනු ලැබීය. මේ අවස්ථාවට උතුර නැගෙනහිර ඇතුළු රටේ සියලුම ප්‍රදේශ නියෝජනය කරමින් කාන්තාවන් විශාල පිරිසක් කොළඹ මහජන පුස්තකාලයට එක් රොක් වී සිටියහ. තමන් ඉදිරියේ පවතින සුවිශේෂී කාර්යභාරය සඳහා ඉතාම හොඳින් සංවිධානය වෙමින් සිටින්නීය. ඔව්! නියත වශයෙන්ම හෙට බිහිවන නව ලෝකයේ උත්තුංග කාරය භාරයක් ඇය විසින් නොපසුබටව ඉටුකරනු නියතය.

# අරාජිකත්වය සමාජ අර්බුදයේ ප්‍රකාශනයක් ලෙස



සමාජය ප්‍රබුද්ධ කරන්නේ නැතිව පුද්ගලයා ප්‍රබුද්ධ කිරීමට තැත් කිරීම ඇත් දළ සොයනු සඳහා දඩයමේ යන්නා සේය. ඇත්දළ දෙකක් හමුවන විට නිතරම පෙනී යන දෙයක් නම් ඒවා දැවැන්ත ඇතෙකුට සම්බන්ධ වී ඇති බවයි.

**ඩොනල්ඩ් ශ්‍රීවර්**

මේ දිනවල දිනපතා ප්‍රවෘත්ති අතර ප්‍රධාන තැනක් ගන්නේ මිනිස් ඝාතනයි. ඉතාම කෲර සහ ම්ලේච්ඡ අයුරින් කෙරන මිනිස් ඝාතනයි. එම ඝාතනයන් සිදුකර ඇති ආකාරය මාධ්‍ය මගින් ඉතා අපූරුවට විස්තර කරන අතර ඒවා කියවීම පවා මනසට පීඩාකාරී වේ. එහෙත් ඒවාට ඉතා හොඳ වෙළඳපළක් ඇති නිසාදෝ සෑම සිදුවීමක්ම මාධ්‍ය මුල් පිටු වසා පැතිරෙයි.
මෙම මිනිස් ඝාතන සිදුකෙරෙන ආකාරයත් ඒවා සිදුවන වේගයත් ඒවාට ජන සමාජයෙන් ලැබෙන්නා වූ ප්‍රතිචාරත් බරපතළ ලෙස සංවාදයට බඳුන් කළ යුතු ආකරයෙන් සිදුවේ. මෙම ඝාතනයන්, හුදෙක් ආවේගය දනවන ක්ෂණික ප්‍රතිචාරයන් ලෙස සිදුවී ඇති ඒවා නොව ඉතාම සැලසුම් සහගතව සිදුකර ඇති ඒවාය. එසේම ඒවා සිදුකර ඇත්තේද ඉතාම කෲර හා ම්ලේච්ඡ ආකාරයටය. ඒ නිසාම ඉන් ජන මනස බරපතළ ලෙස කම්පනයට පත්වන අතර සැකකරුවන් ගේ ගෙවල් හා දේපළ ගිනි තැබීමෙන් ජනතාව ඒවාට ප්‍රතිචාර දක්වනු පෙනේ.
ඇල්පිටිය කුරුඳුගහ හැතැප්මේ (කරන්දෙනියේ) හිත හොඳ දොස්තර ඝාතනය මේ හා සම්බන්ධ එක් උදාහරණයකි. ප්‍රදේශයේ ජනප්‍රිය වෛද්‍යවරයෙකු වූ හිතහොඳ දොස්තර මහතාට නොහඳුනන තුවක්කුකරුවෙකු විසින් සිය පෞද්ගලික බෙහෙත් ශාලාව තුළදී වෙඩි තබා මරාදමා පලාගොස් තිබුණි. පසුව හෙළිදරව් වූයේ, වෛද්‍යවරයා සමඟ උරණවූ ප්‍රදේශයේ වෛද්‍ය පර්යේෂණාගාරයක (Medical lab) හිමිකරු විසින් කොන්ත්‍රාත්තුවක් දී වෛද්‍යවරයා මරා දමා ඇති බවය. සැකකරුවන් අත්අඩංගුව ගැනීමට මාසයකට වැඩි කාලයක් ගත විය. සැකකරුවන් අත් අඩංගුවට ගැනීමත් සමගම ඔවුන් සතු ගේ දොර හා අනෙකුත් දේපල ප්‍රදේශයේ ජනතාව විසින් ගිනි තබා විනාශ කර දමුණි.
කහවත්ත ප්‍රදේශයේ මවක් සහ ඇගේ දියණිය කෲර ලෙස කපා කොටා මරා දමා තිබුණු අතර මවගේ සිරුර නිවස තුළ තිබියදීත් දියණියගේ සිරුර තවත් එපිට ස්ථානයක තිබියදීත් සොයා ගැණුනි. ඝාතකයන් පිළිබඳ හෝඩුවාවක් සැලකිය යුතු කාලයක් ගතවූ අතර ඝාතකයන්ට ප්‍රබල දේශපාලන සම්බන්ධයක් ඇති නිසා අත්අඩංගුවට නොගන්නේ යයි මතයක්ද පැතිරුණි. අවසානයේ දී ඝාතනයට සැකකාර තිදෙනෙකු අත්අඩංගුවට ගත් අතර ඒ සමඟම ප්‍රදේශවාසී ජනතාව විසින් සැකකරුවන් ගේ ගෙවල් හා අනෙකුත් දේපළ විනාශකරන ලදී.
ගොඩකවෙල තරුණයෙකුට එහි ආණ්ඩු පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු විසින් පහර දෙන ලදුව රෝහල් ගත කිරීමෙන් අනතුරුව මිය ගියේය. ඒ සමඟම ප්‍රදේශවාසී ජනතාව මාර්ග තුළට වැද ටයර් පුළුස්සමින් ඝාතනයට වගකිවයුතු දේශපාලනඥයා අත්අඩංගුවට ගන්නා ලෙස බලකරමින් උද්ඝෝෂණය කළ අතර දින ගණනාවකට පසු වගකිවයුතු දේශපාලනඥයා පොලීසියට භාර විය.
උදාහරණයන් ලෙස සඳහන් කළ මෙකී ඝාතකයින් සියල්ල පිටුපස දේශපාලන සම්බන්ධයක් හෝ නීතිය රකින ආයතනයක සම්බන්ධයක් (පොලීසිය හෝ හමුදාව) තිබේ. මේ ආකරයෙන් කෲර සහ ම්ලේච්ඡ ඝාතනයක් සිදුකිරීමට අවශ්‍ය කෙරෙන ධෛර්යය හා උත්තේජනය ලබාදෙන්නේ එකී සම්බන්ධතාවය විසිනි. ඝාතනය සිදුකිරීමට අවශ්‍ය ද්‍රව්‍යමය සම්පත් මෙන්ම ඝාතනයෙන් පසු මිනීමරුවන්ට රැකවරණය පිළිබඳ විශ්වාසය තහවුරු කරනුයේ එම සම්බන්ධතාවය මගිනි.
2012 මාර්තු 01 දින 'දිවයින'පත්‍රය වාර්තාකර තිබුණේ කහවත්ත ද්විත්ව ඝාතනයේ සැකකරුගේ වැඩිමහල් සොහොයුරා ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රී එල්.එම්. ධර්මසිරි නැමැත්තා බවය. ඔහු රජයේ ප්‍රබල අමාත්‍යවරයෙකු වන ජෝන් සෙනෙවිරත්නගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස අවුරුදු 20කට ආසන්න කාලයක් තිස්සේ කටයුතු කරමින් සිටින්නෙකි.
එපමණක් නොවේ. එම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ පුතා වැලිකඩ බන්ධනාගාරයේ සිරකරු සුභසාධන නිලධාරියෙකු ලෙස සේවය කරමින් සිටියදී මත්ද්‍රව්‍ය ජාවාරමකට සම්බන්ධව අත්අඩංගුවට පත් වූවෙකි. එම පුවත්පත එදිනම වාර්තාකර තිබුණේ 'සිව් වතාවක් ඇල්ලූ සැකකාර යුවල දේශපාලන බලපෑම් මත මුදාහැරලා' යනුවෙනි. ඝාතනයට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගෙන පරීක්ෂණ නොපැවැත්වීමට එකී බලපෑම එක් හේතුවක් වන්නට ඇත. ඒ ඉඩකඩ විසින් වරදකරුවන්ට ඝාතනයට අදාල සාක්ෂි අතුරුදහන් කිරීමට ප්‍රමාණවත් කාලයක් සපයා දී තිබේ.
2012 මාර්තු 13 වන දින Daily Mirror පුවත්පත කහවත්තේ ද්විත්ව ඝාතනය පිළිබඳ පොලිස්පතිගේ ප්‍රකාශයක් පළකර තිබුණි. එහි සඳහන් වූයේ, 'සාක්ෂි ප්‍රමාණවත් නොමැති නිසා පරීක්ෂණ ප්‍රමාදයි-පොලිස්පති' යනුවෙනි. මෙම දිනවල පුවත්පත් වාර්තාකර තිබුණේ 'දුමින්ද හා කෙහෙලියට මාස 03ක නිවාඩු ඉල්ලයි යනුවෙනි. දුමින්ද යනු ආණ්ඩුවේම ප්‍රබල චරිතයක් වූ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතාගේ ඝාතනයට සම්බන්ධ ප්‍රධාන සැකකරුය. ඔහුව අත්අඩංගුවට ගැනීමට හෝ නීතිය හමුවට පැමිණවීමත් මෙතෙක් සිදුනොවුණ අතර ඔහුට අවශ්‍ය නිවාඩු අනුමත කර ගැනීම සඳහා අවශ්‍ය සියලු දේ සිදු කෙරුණි.
මේ අකාරයේ දේශපාලනික සම්බන්ධතා පමණක් නොව වරදරුවන් නීතිය හමුවට පැමිණවිය යුතු, ඔවුන්ට එරෙහිව ඇති සාක්ෂි ගොණු කළ යුතු අපරාධ පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පැවැත්විය යුතු පොලීසියේ ක්‍රියාකාරිත්වයේ ස්වභාවයද ඉහත සඳහන් කළ ආකාරයේ අපරාධ බියක් සැකක් නැතිව සිදුකිරීමට අවශ්‍ය ඉඩකඩ නිර්මාණය කර දී තිබේ.
පොලීසියට පවා අපරාධවලට ඍජුව සම්බන්ධ වී සිටී. අඟුලාන පොලීසිය විසින් අත්අඩංගුවට ගත් තරුණයන් දෙදෙනෙකු පහර දී මරා දමා මහ මග දමායාම, බම්බලපිටිය ප්‍රදේශයේ නොගැඹුරු මුහුදේදී පුද්ගලයෙකුට පොලිස් නිලධාරීන් විසින් පොලුවලින් පහර දී මරා දැමීම ඊට උදාහරණය. එසේම දින කිහිපයකට උඩදී මිරිහාන පොලීසියේ ASP වරයෙකු රුපියල් ලක්ෂ 10ක අල්ලසක ගනිද්දී අත්අඩංගුවට පත් විය. එතැනින් නොනැවතී උසාවියේ කාර්ය භාරයද පොලීසිය තමන් විසින්ම පවරා ගනිමින් දඬුවම් පැමිණවීමද සිදු කරමින් සිටී. පොලීසිය විසින් අත්අඩංගුවට ගැනුණු ඇතැම් අපරාධකරුවන් ආයුධ භාරදීමට යද්දී ඝාතනය වීම, දියේ ගිල්වා මැරීම සුලභ ප්‍රවෘත්තිය.
නීතිය රැකීමට වගකිවයුතු හා මෙම සමාජයේ සාමය හා සංහිඳියාව පවත්වා ගැනීමට වගකිවයුතු යයි පැවසෙන ආයතනම බරපතළ ලෙස කඩා වැටී තිබේ. ඒවාට පවා අරාජික වී තිබේ. (මෙලෙස කඩා වැටී ඇත්තේ එම ආයතන පමණක්ම නොවේ. පොදුවේ සමස්ත සමාජ දේහයම කඩා වැටී ඇත.) මේ තත්වය තුළ එකී ආයතන සම්බන්ධයෙන් ජනතාව තුළ තිබූ විශ්වාසය බරපතළ අයුරින් පළුදු වී ඇත. තවදුරටත් රටේ සිදු කරන අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි විභාග කර, පරීක්ෂණ පවත්වා, වැරදිකරුවන් නීතිය හමුවට පැමිණවීම නිසි පරිදි කෙරෙන්නේ යයි ජනතාව විශ්වාස නොකරන තත්වයට සිදුවීම් සිදුවී තිබේ. එය බරපතල සමාජ අරාජිකත්වයකට පාරකපමින් තිබෙන අයුරු අපට දැකගත හැකිව තිබේ.
සිදුවන අපරාධවල ස්වභාවය, ඒවා සිදුකරන ආකාරය විසින් ජනමනස බරපතළ කම්පනයකට ලක්කරනු ලබයි. ඒවා සමාජයකට දරාගත නොහැකි මට්ටමේ සිදුවීම්ය. ඒ අතරම ඒවාට වගකිවයුතු පුද්ගලයන් නීතිය හමුවට නොපමුණුවන බවත්, ඒ නිසාම ඔවුන්ට නිසි දඬුවම් නොලැබෙන බවත් යම් දිනෙක නීතය හමුවට ගෙන ආවද ප්‍රමාණවත් සාක්ෂි ආදිය නොමැතිකම නිසා දඬුවම් නොලබා නිදහස් වන බවත් ජනතාව විශ්වාසය කරයි.
එහෙත් මේ තරම් දරුණු අපරාධවලට වගකිවය යුතු පුද්ගලයන් දඬුවම් නොලබා සිටීම ඉවසිය නොහැකිය. කරන ලද අපරාධවලට ඔවුන් කෙසේ හෝ දඬුවම් විඳිය යුතු බවට ජනතාව ප්‍රාර්ථනා කරති. මේ තත්වය තුළ කිසියම් සැකකාරයෙක් අත්අඩංගුවට ගත්විට හෝ අදාළ අපරාධයට වගකිව යුත්තන් අසවල් තැනැත්තාය යන්න සැක කළ පමණින් ජනතාව ඔවුන්ට දඬුවම් ලබාදීමට ඉදිරිපත් වේ. සැකකරුවන්ගේ ගෙවල් දොරවල්, දේපළ, ගිණිතබා විනාශ කෙරේ. ජනතාව සංවිධානාත්මක නොවන අරාජික ක්‍රියාකාරිත්වයකට එළඹේ.
අනෙක් අතට එවැනි ක්‍රියාවන්ට සමාජ අනුබලයද අනියමින් ලැබෙන්නේ 'වරදකරුවන්ට දඬුවම් ලැබුණා' නැතහොත් 'කරපු අපරාධය හැටියට ගෙවල් ගිනි තියලා මදි' ආදිය ලෙසටය.
එහෙත් ඇතැම් විට අත්අඩංගුවට ගනු ලැබුවේ සැබෑ අපරාධකරු නොවන්නටද ඉඩ තිබේ. ඊට කමක් නැත. අපරාධයට දඬුවම් දුන්නා යැයි සැනසීමක් ජන මනස තුළ ගොඩනැගේ. එපමණකින් ඔවුහු සෑහීමකට පත් වෙති.
එහෙත් යළි යළිත් එයම සිදුවේ. එය බරපතළ තත්වයකි. මෙලෙස ජනතාව අසංවිධානාත්මක හා අරාජික ලෙස බලය අතට ගැනීම මෙකී අපරාධවලටත් වඩා සමාජයට හානිකර විය හැකි වේ.
පොදුවේ ධනේශ්වර නීතියත් නීති රකින ආයතනත් උත්තරීතර නොවේ. ඒවා ධනවාදයට පක්ෂපාතී බවත් ඒවායින් යුක්තිය හෝ සාධාරණත්වය බලාපොරොත්තුවීම නිෂ්ඵල බවත් සත්‍යයකි. මාක්ස්වාදීන් පොදුවේ ධනේශ්වර නීතිය නොපිළිගන්නේ ඒ නිසාය. මාක්ස්වාදීන් ධනේශ්වර නීතියට එරෙහිව සමාජවාදී නීතියක් වෙනුවෙන් පෙනී සිටින්නේ එබැවිනි. එහෙත් ධනවාදී සමාජයක අරාජිකත්වය යනු ධනපති නීතියටත් වඩා විනාශකාරී ප්‍රතිඵල ගෙන දෙන්නකි.
ධනේශ්වර ක්‍රමයේ අර්බුදය විසින් සියලු ධනේශ්වර ආයතනද අර්බුදයට පත් කරනු ලබයි. ඒවා ඇතුළතින් බිඳ වැටෙන්නට පටන් ගනී. අප රට තුළද ධනේශ්වර ක්‍රමය කොතරම් කඩාවැටී ඇත්දැයි කියතහොත් මේ වන විට සෑම ධනේශ්වර ආයතනයක්ම ඇතුළතින් කඩා වැටී තිබේ. අකර්මණ්‍ය වී තිබේ. කිසිදු ආයතනයකට කිසිදු වැඩ කටයුත්තක් නිසි ලෙස සිදු කළ නොහැකිවා පමණක් නොව ඒ පිළිබඳ වගකියන්නේද නැත. අධ්‍යාපන අමාත්‍යාංශයට ළමයෙකුට පාසලක් ලබ දිය නොහැකිය. විභාග දෙපාර්තමේන්තුවට හරිහැටි විභාග පවත්වා ප්‍රතිඵල නිකුත්කරගත නොහැකිය. විදුලිබල හා බලශක්ති අමාත්‍යංශයට විදුලිය නොකපා සිටිය නොහැකිය. කෞතුකාග ාරයට කෞතුක භාණ්ඩ ආරක්ෂා කරගත නොහැකිය.
ධනේශ්වර ආයතන ඇතුළතින් පිරිහී කඩා වැටීමත්, ධනේශ්වර ආයතන කෙරෙහි ජනතාවගේ විශ්වාසය බිඳවැටීමත් සමාජවාදී විප්ලවයට වාසිදායක වේ. එහෙත් ඒ වෙනුවට නිර්ධන පංතික ආයතනයක් විසින් ඒ රික්තය පිරවිය යුතුය. ඒ වෙනුවට ඒ තැන ගන්නේ අරාජිකත්වය විසින් නම් තවදුරටත් එය වාසිදායක වන්නේ ධනපති ක්‍රමයටයි. ධනපති පාලකයන්ටයි. ඒ නිසාම එක් මොහොතකදී ධනපති පාලකයෝ අරාජිකත්වයට ආශිර්වාද කරති.
අප ඉහතින් කථා කල සෑම උදාහරණයකදීම සිදුවූයේ ජනතාව අසංවිධානාත්මක ලෙසත්, ආරාජික ලෙසත් බලය පාවිච්චි කිරීමයි. (බොහෝ දකුණු ඉන්දියානු චිත්‍රපටවලදී එවැනි ජවනිකා ඇතිතරම් දැකගත හැකිය.) අවසානයේ සිදුවූයේ, ජනතා විරෝධය, විරෝධය යොමු විය යුතු තැනට යොමු නොවී අපතේ යාමය. එක් අතකින් අපරාධකරුවන්ට දඬුවම් දුන්නේ යයි ඔවුන් සෑහීමකට පත්වන අතරම අනෙත් අතින් යළි යළිත් එවැනි අපරාධ සිදුවීමට අවශ්‍ය තත්වයන් එලෙසම පවතින්නට ඉඩ හරී. එය ධනේශ්වර ක්‍රමයට ආශිර්වාදයක්ම වේ.
අරාජිකත්වය නිතරම පාර කපා ඇත්තේ, ආඥාදායකත්වයටයි. සමාජයේ මතුවන ආරාජිකත්වය වහ වහා පරාජය නොකළහොත් එයම ධනේශ්වර ආඥාදායකත්වයක් බිහිවීමට අවශ්‍ය කරන තර්කානුකූල වටපිටාවක් සමාජය තුළත් සමාජ මනෝභාවය තුළත් ගොඩනංවනු ඇත. එවැන්නක් පරාජය කළ හැක්කේ, මාක්ස්වාදී ව්‍යාපාරයේ සංවිධානාත්මක මැදිහත්වීමෙන් පමණකි.



# 'කලාකරුවා' උපත ලබයි

වර්තමානයේ 'කලාකරුවා' යැයි සඳහන් කරන විටම අපේ මනස තුළ මැවෙන පොදු සංකල්පයක් තිබේ. ඒ කලාවේ කුමන හෝ මාධ්‍යයකට දායක වී සිටින එතුළ ක්‍රියාකාරී ලෙස කටයුතු කරන පුද්ගලයා කලාකරුවෙකු බවයි. මේ වනවිට කලාව දැවැන්ත වෘක්ෂයක් සේ විවිධ ධාරාවන් රැසක් ලෙස අතු ඉති ලියලා වැඩී තිබේ. සිනමාව, නාට්‍යය, ටෙලිනාට්‍යය, වෙළඳ දැන්වීම් (නිරූපණය), ගායන, වාදන, නැටුම්, චිත්‍ර, මූර්ති, ලේඛන, කවි ආදී ධාරාවන් ඒ අතර ප්‍රමුඛ වේ. වර්තමානයේදී මේ කිසියම් හෝ ධාරාවකට කිසියම් හෝ ප්‍රමාණයකින් සම්බන්ධ වන තැනැත්තා හා එකී ධාරාවන් වෘත්තීය ලෙස තෝරාගෙන තිබෙන අය 'කලාකරුවන්' බවට පත්ව තිබේ. අනුන්ගේ ගීත කිහිපයක් නවීන තාක්ෂණයේ පිහිටෙන් තමන්ගේ හඬින් කියා සංයුක්ත තැටියක් නිකුත් කොට එක් රැයකින් 'කලාකරුවන්' වීමට ඕනෑම කෙනෙකුට හැකියාව තිබේ. එසේම අවර ගණයේ ටෙලි නාට්‍යයක ඉතාම කුඩා කොටසක පෙනී සිටි වහාම 'කලාකරුවන්' බවට පත්වන අයද සිටී. ඔවුන්ම කියන ලෙසට ඒ සියලු දෙනාම 'කලාකරුවන්' හෙවත් 'ආටිස්ට්'ලාය.

**කලාකරුවා කව්ද?**

මෙවැනි තත්වයක් තුළ කලාකරුවා කවුද යන්න නිර්වචනයකර ගැනීමද සංකීර්ණ වී තිබේ. කෙසේ වුවත් තම අත්දැකීම්, තම මනස තුළ පිළිබිඹුවන සොබාදහමේ සෞන්දර්යාත්මක ප්‍රතිරූපයන් කිසියම් කලා මාධ්‍යයක් ඔස්සේ ප්‍රතිනිර්මාණය කරන තැනැත්තා කලාකරුවා ලෙස අපට හඳුනාගත හැක. කලාවේ ආරම්භය සිදුවූ ආකාරය අනුවත් පොදු අර්ථයට අනුවත් සෑම මිනිසෙක්ම කලාකරුවෙකි. මන්ද සෑම කෙනෙක් තුළම (ඔහු නීරෝගි මනසක් සහිත අයෙක් නම්) සෞන්දර්යාත්මක ප්‍රතිරූප අඩු වැඩි වශයෙන් බිහිවෙන නිසාය. එහෙත් ඒ සෑම කෙනෙක්ම තමන් තුළ බිහිවන සෞදර්යාත්මක ප්‍රතිරූප කිසියම් මාධ්‍යයක් මඟින් ප්‍රතිනිර්මාණය කරන්නේ නැත; සම්ප්‍රේෂණය කරන්නේ නැත. පවතින තරගකාරී සමාජ වටපිටාව හා සමාජය තුළ පවතින විවිධ මතයන් විවිධ බාධක හා සීමාවන් අනුවත් ඔහුට ඒ සඳහා ඉඩ ලබා දෙන්නේ නැත. මෙහිදී 'කලාකරුවන්' ලෙස මතුවන්නේ, කුමක් හෝ කරුණක් නිසා කලා මාධ්‍යයකට සම්බන්ධවූවන් හා කලා මාධ්‍යයක් මගින් තමා තුළ උපදින සංකල්පය ප්‍රතිනිර්මාණය කිරීමට සමත් වූ හෝ ඒ සඳහා භාවිතාවෙන් ක්‍රියාත්මක වූ තැනැත්තන්ය. වර්තමාන පංති සමාජය තුළ පවතින, සීමාවන්, මූල්‍ය දුෂ්කරතා, විවිධ බාධක වැරදි මතවාදයන් හා ආකල්පයන්, බොහෝ අයට 'කලාකරුවන්' බවට පත් නොවී සිටීමට බලපා තිබේ. පාසල් යන අවදියේ තමා තුළ උපදින විවිධ සිතුවිලි සෞන්දර්යාත්මක ප්‍රතිරූප ලෙස කවියකට, නිසැඳසකට, චිත්‍රයකට නැගූ කලාකරුවෙක් වීමේ හැකියාව තිබූ බොහෝ දෙනා ඉන්පසු රැකියාවක් කරමින් අඹු දරුවන් පෝෂණය කරමින් 'ජීවත්වීමේ අරගලයට' අවතීර්ණ වීමෙන් පසු තමා තුළ සිටි 'කලාකරුවාට' මියයාමට ඉඩහළ අවස්ථා බොහෝ විට තිබේ.

කෙසේ වෙතත් අපේ අවධානය අප යොමුකළ යුත්තේ මිනිසා බිහිවීමත් සමග බිහිවූ කලාව තුළ පොදු ජනතාව ගෙන් වෙනස් වූ 'කලාකරුවෙක්' බිහිවූයේ කෙසේද හා බිහිකළේ කවුරුන්ද යන්න පිළිබඳවය. ඉතාම කෙටියෙන් කිවහොත් 'කලාකරුවා' බිහිකරනු ලැබුවේ, පංති සමාජය විසිනි. මිනිසාගේ ශ්‍රම ශක්තිය අතිරික්ත වටිනාකම් නිපදවීමට හැකි තත්වයට දියුණු වීමත් සමග නිර්මාණය වූ අතිරික්ත වටිනාකම් නොවන්නට ද්‍රව්‍යමය නිෂ්පාදනයට දායක නොවෙමින් සමාජමය අතිරික්ත ධනයෙන් යැපෙන කලාකරුවෙක් බිහිවන්නේ නැත. වර්තමාන සමාජයේ කලාකරුවන්ට අනුව ඔවුන් කලාකරුවන් වී ඇත්තේ 'සංසාර පුරුද්දට' ය. තවත් සමහරු 'පෙර පින්' බලයෙනි. එසේම සරසවියෙන් (විශ්වවිද්‍යාලයෙන් නොවේ) හෙවත් සරත්වතී ගෙන් වරම් ලැබූ කලාකරුවෝද සිටිති. මේ නිසාම සමාජය තුළ 'කලාකරුවා' නම් චරිතය බිහිවූ අයුරු ඓතිහාසිකව අධ්‍යයනය කළ යුතුය.

**අතිරික්ත ධනයෙන් යැපෙමින්**

සමාජය තුළ 'කලාකරුවා' බිහිවූයේ කලාව බිහිවී සියවස් ගණනාවකට පසුවය. කලාව බිහිවූ මුල් වකවානුවේ ප්‍රාථමික සාමූහික සමාජය තුළ කලාකරුවන් නම් විශේෂ පිරිසක් සිටියේ නැත. සෑම දෙනාම නිෂ්පාදන කාර්යයේ දායකවන අය වූහ. එකල නිෂ්පාදන උපකරණ ඉතාම නොදියුණු මට්ටමක පැවැති නිසා ප්‍රාථමික මිනිසාගේ ශ්‍රම ශක්තිය අතිරික්ත වටිනාකම් නිර්මාණය කළේ නැත. ඒ නිසාම නිෂ්පාදන කාර්යයට දාකය නොවී අනුන්ගේ අතිරික්ත ධනයෙන් යැපෙන 'චරිත' බිහිවීමට ඉඩ තිබුණේද නැත. එහෙත් ක්‍රමානුකූලව නිෂ්පාදන උපකරණවල දියුණුවත් සමග මිනිස් ශ්‍රමය අතිරික්ත වටිනාකම් නිපදවන්නට සමත්විය. එකී අතිරික්ත වටිනාකම් ප්‍රමාණයෙන් වැඩිවත්ම ශ්‍රමය වැගිරවීමෙන් තොරව අනුන්ගේ ශ්‍රමයේ අතිරික්තයෙන් ජීවත්වීමට පිරිසකට හැකියාව ලැබිණි. මේ සමග එතෙක් පැවැති සමාජ සංවිධානය බිඳවැටුණු අතර නව නිෂ්පාදන මාදිලියන් ලෙස හා පළමු පංති සමාජය ලෙස වහල් ක්‍රමය බිහිවිය. සමාජය පංති අනුව බෙදන ලදී. ඒ වහලුන් හා වහල් හිමියන් ලෙසිනි. වහලුන්ගේ ශ්‍රමයේ අතිරික්තයෙන් වහල් හිමියන් තම යැපීම සලසාගත් අතර වහලුන් පාගාගෙන වැඩ ගැනීම සඳහා සූරාකෑම සඳහා අවශ්‍ය බලහත්කාරය වෙනුවෙන් රාජ්‍ය නිර්මාණය විය. රීතියක් ලෙසම රජය වහල් හිමියන්ගේ පංති උපකරණය විය. මෙයට සමගාමීව ආසියාවේ සමහර රටවල ආසියාතික නිෂ්පාදන රටාව පැවතුණි.

**පංති සමාජය තුළ**

ලොව පළමු පංති සමාජය ලෙස වහල් හිමි සමාජයත් පළමු රාජ්‍ය ආකෘතිය ලෙස වහල් හිමි රාජ්‍යයක් බිහිවූ විට සමාජයේ සියලු ධනයේ අයිතිය වහල් හිමි ප්‍රභූ පංතිය සඳහා වෙන් කරන ලදී. මේ සමගම ප්‍රාථමික ඇදහිලි සංවිධානාත්මක ආගම් බවට පත්විය. ප්‍රාථමික කලාව වෙනුවට කලාව විෂයක් ලෙස වර්ධනය විය. ආගම මෙන්ම කලාවද අධිපති පංතියේ පංති වුවමනාවන් වෙනුවෙන් යොදා ගැණිනි; එකී මෙවලම් බවට පත්විය. ආගම් බිහිවන විටම ඒ සඳහා 'පූජකවරුන්' අවශ්‍ය විය. සමාජමය අතිරික්ත ධනයෙන් පූජකවරුන් නඩත්තු කරන ලදී. කලාවද එලෙසම විය. කලාව විෂයක් ලෙස වර්ධනය වූ අතර ඒවා ප්‍රභූ පංතියෙ වුවමනාවන් සඳහා කැපකරන ලදී. ඒ සඳහා පොදු ජනයාගෙන් වෙනස් වූ 'කලාකරුවන්' නම් පිරිසක් බිහිවූ අතර ඔවුන් නඩත්තු කරනු ලැබුවේ සමාජමය අතිරික්ත ධනයෙනි.

වහලුන් සූරාකෑමෙන් උපයන ලද අතිරික්ත ධනයේ හිමිකරුවන් වූයේ පාලක පංතියේ රජුන් හා ප්‍රභූන්ය. ඒ නිසාම එම අතිරික්ත ධනයෙන් යැපෙන කලාකරුවා වහල්හිමි සමාජයේදී එහි රජුන්ට හා ප්‍රභූන්ට සේවය කරන සේවකයෙක් විය. සෑම පංති සමාජයකදීම තත්වය මේ හා සමාන විය. ඒ අනුව නිෂ්පාදන කාර්යයට දායක නොවී අතිරික්ත නිෂ්පාදනයෙන් යැපෙමින් කලා කටයුතු පමණක් කිරීමට හැකි පිරිසක් හෙවත් ''කලාකරුවන්'' බිහිවීමත් සමග ඔවුන්ගේ දායකත්වය හා පාලක පංතියේ වුවමනාවන්ට අනුව කලාව විවිධ ධාරා ඔස්සේ වර්ධනය වන්නට විය. සංගීතය, ගායනය, නර්තනය, චිත්‍ර, මූර්ති, කැටයම් ආදීය වර්ධනය වූ අතර ඒවා රජුන් ගැන ප්‍රභූන් ගැන කියැවෙන හා රජුන් වෙනුවෙන් ප්‍රභූන් වෙනුවෙන් ඔවුන් පිනවීම සඳහා නිර්මාණය කරනදේ බවටද පත්විය. ඒ අනුව අධිපති පංති කලාවක් වර්ධනය විය.

මින් අදහස් වන්නේ පීඩිත පංතින් තුළ කලාවක් නොපැවතුණු බව නොවේ. වහලුන්ගේ දුක්ඛිතභාවය ප්‍රකාශකරන දුක්බර ගී විශේෂයක් වහලුන් අතර තිබූ බවට සාක්ෂි තිබේ. අපේ රටේද අතීතයේ ආසියාතික සමාජය තුළ රජුන් හා ප්‍රභූන් වෙනුවෙන් වූ කලාවට වෙනස්ව පීඩිත ජන කොටස් තුළ තම වෘත්තීන් ඔස්සේ බිහිවූ කලාවක් ද තිබේ. බොහෝ විට අපේ රටේ ජනශ්‍රැතිය තුළ හමුවන්නේ ඒවාය. එහෙත් මේ යුගයේ කලාවේ ආධිපත්‍යය දරුවේ අධිපති පංති කලාවයි. පංති සමාජය තුළ අධිපති පංතිය විසින් අත්පත් කරගෙන තිබූ අතිරික්ත ධනයෙන් යැපීම නිසා පංති සමාජයේදි කලාකරුවා 'ස්වාධීන' වූයේ නැත. ඔහු බොහෝ විට ප්‍රභූන් වෙනුවෙන් සේවය කරන පුද්ගලයෙක් විය.

**රාජ්‍ය අනුග්‍රහය ලැබ**

පංති සමාජය බිහිවීමත් සමග රාජ්‍ය අනුග්‍රහයත් සමග කලාව විෂයක් ලෙස වේගයෙන් වර්ධනය විය. කලාව වේගයෙන් වර්ධනය වීම අපට දැකිය හැක්කේ නිෂ්පාදනය වඩාත් වේගයෙන් වර්ධනය වූ කලාපවලය. යුරෝපාකරයේදී කලාව ආරම්භයේ වේගයෙන් වර්ධනය වූ ස්ථානය වූයේ ග්‍රීසියයි. වහල් ක්‍රමය තුළ වඩ වඩාත් වර්ධනය වූ කලාපය වූයේ ග්‍රීසියයි. ඒ අනුව පුරාණ ග්‍රීසීය තුළ ක්‍රි.පූ. 5වන හා 6වන සියවස්වල නාට්‍ය, චිත්‍ර, මූර්ති, සංගීතය වේගයෙන් වර්ධනය විය. අදත් වර්තමාන නාට්‍ය කලාව සඳහා ග්‍රීක නාට්‍යවල හා ග්‍රීක නාට්‍යකරුවන්ගේ උගැන්වීම් හා අභාසය යොදාගැනේ. සොෆොක්ලීස් වැනි නාට්‍යකරුවන් මෙහිදී ප්‍රමුඛත්වයෙලා ගැනේ. හේමර්ගේ 'ඕඩිසි' හා 'ඉලියඩ්' යන වීර කාව්‍ය ආරම්භක මහා කාව්‍ය ගණයට වැටේ. මූර්ති කලාවද ග්‍රීසියේ බොහෝ දියුණුව පෙන්වූ කලාවකි. බහුදේවවාදයට අනුව විවිධ දේවරූප නිර්මාණය කළ ග්‍රීක කලාකරවෝ මිනිස් රුව නිර්මාණයේදී කාන්තාවන්ගේ සෞන්දර්යයත් පුරුෂයන්ගේ ශරීර ශක්තිය හා රණකාමීත්වයත් නිරූපණය කළ අතර එය එවකට පැවැති රණකාමීත්වයට අනුව සිදුවූවක් විය.

මෙයට සමගාමීව ක්‍රි.පූ. 5වන හා 6වන සියවස්වල ඉන්දියාවේද (භාරතය) කලාව වර්ධනය විය. මෙහි වඩාත් වැඩියෙන් වර්ධනය වූයේ සංගීතය, නැටුම් හා ලේඛන කලාවය. ග්‍රීසියේ හෝමර් 'ඕඩිසි' හා ඉලියඩ්' යන මහා නාට්‍ය රචනා කරන විට ඉන්දියාවේ ක්‍රි.පූ. 4 වන සියවසයේ පමණ 'මහා භාරත', 'රාමායනය' වැනි වීර කාව්‍ය නිර්මාණය විය. ඉන්දියාවේ පැවැති බහුදේවවාදයට අනුව දෙවියන් සඳහා ස්තෝත්‍ර හා ගායනාද නැටුම්ද මගින් සංගීතය හා නර්ථනය වර්ධනය විය. මේ යුගයේ කලාව එක් අතකින් පාලක ප්‍රභූ පංතීන්ගේ බලපෑම්වලට හසුව තිබූ අතර අනෙත් අතින් ආගමික සංස්ථාවන්ගේ බලපෑමට හසුවූ තිබුණි. මීට ආසන්න කාලවල චීනය තුළත්, නයිල් නිම්න ශිෂ්ටාචාරය හා මෙසපොතේමියානු ශිෂ්ටාචාරය තුළද කලාව වර්ධනය විය. මිසරයේ පිරමීඩ හා මූර්ති, බැබිලෝනියාවේ එල්ලෙන උයන ඊට උදාහරණයන්ය.

**ආගමික බලපෑමට හසුව**

ආසියානු කලාපයට වඩා වැඩි වේගයෙන් නිෂ්පාදන උපකරණවල, සංවර්ධනයත් විද්‍යාවේ වර්ධනයත් සිදුවූ යුරෝපාකරයේ කලාව වේගයෙන් වර්ධනය වූ බව පෙනේ. එහෙත් ග්‍රීසිය පරිහානියට ගොස් රෝමය බලවත් වීමත් වහල් ක්‍රමය බිඳවැටී වැඩවසම් සමාජය බිහිවීමත් ඒ සමගම වහල් යුගයේ වහලුන්ගේ පීඩාව නියෝජනය කරමින් බිහිවූ දහම වන ක්‍රිස්තියානිය පසුව වැඩවසම් පාලනය තුළ රජයේ ආගම වීමත් ක්‍රිස්තියානියේ බලවත් වීම සමග එහි ආධිපත්‍යයට යුරෝපා රටවල් හසුවීමත් සමග විද්‍යාව මෙන්ම කලාවද බරපතළ අර්බුදයකට ලක්විය. ක්‍රි.ව. 400 සිට 1400 දක්වා කාලය, මධ්‍යතන යුගය ලෙස හඳුන්වන කාලය 'අඳුරු යුගය' ලෙස හැඳින්වෙන්නේ විද්‍යාව, කලාව. දර්ශනය ආදී සියල්ල ආගමේ ආධිපත්‍යයට යට කොට දැමූ නිසාය. එබැවින් එම යුගය තුළ කලාව වර්ධනය වූයේ නැත. එම යුගයේ යුරෝපයේ කලාව ආගමික ග්‍රන්ථ හා පල්ලිවල අදින ලද සිතුවම්වලට සීමා විය.

ආසියානු කලාපයේද තත්වය මේ හා සමාන විය. කතෝලික දහම විසින් කරන ලද බලපෑමට සමාන නැති වුවත් ආසියානු කලාපයේද කලාව ආගමික මතයන්ට යටත්ව පැවැතිණි. මෙහිදී ඉන්දියාවේ විශේෂයක් වූයේ එහි තිබූ බහුදේවවාදී ආගම් සඳහා දෙවියන් වෙනුවෙන් ගායනා, නැටුම් ආදිය යෙදාගත් නිසා සංගීතය, ගායනය හා නැටුම් කලා ක්ෂේත්‍ර ලෙස වර්ධනය වීමය. වර්තමාන ඉන්දියාවේ නර්තනය හා සංගීතය වර්ධනය වී තිබීමට එය හේතු විය.

ලංකාවේ පංති සමාජය වූ ආසියාතික සමාජයේද කලාව වර්ධනය වූයේ රජයේ හා ආගමේ බලපෑම්වලට යටත්වය. ලංකාවේ ආගම බෞද්ධාගම වූ නිසාත් ලංකාවේ කෘෂිකාර්මික ආර්ථිකය තුළ ආසියාතික සමාජයේ නිෂ්පාදන බලවේග වේගයෙන් වර්ධනය නොවූ නිසාත් කලාව වර්ධනය වුයේද ඉන්දියානු ආභාසය ලබමින් බෞද්ධ බලපෑම තුළ සෙමින්ය. ලංකාවේ ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය, මූර්ති, චිත්‍ර ආදිය වැඩි ප්‍රමාණයක් බුද්ධාගම හා පන්සල් මූලික කරගෙන නිර්මාණය වූ ඒවා විය. අතීත කලා නිර්මාණ අතර ආගමික නොවන කලා නිර්මාණ ලෙස අපට හමුවන්නේ 'ඉසුරුමුණි පෙම් යුවල' හා සීගිරි සිතුවම් වැනි කිහිපයක් පමණක් වීමෙන්ම මෙය පැහැදිලි වේ.

මෙලෙස මධ්‍යතන යුගයේ යුරෝපයේත් පූර්ව ධනවාදී සමාජය තුළ ආසියාවේත් ආගමික වුවමනාවන්ගේ බලපෑම් තුළ පැවැති කලාව යළි වේගයෙන් ගමන් ආරම්භ කළේ ධනවාදය කරළියට ඒමත් සමගය. ඒ පිළිබඳව මීළඟට කතා කරමු.



# සල්ලි අච්චු ගැහුවත් උත්තර නැති ආර්ථික අර්බුදය

සමහරු කියන්නේ රුපියල වෙනස් වෙන්න පටන් ගෙන කියාය. අතගා බැලුවොත් රුපියලේ වෙනසක් නැත. රවුම් රුපියල ඒ රුපියලමය. නමුත් රුපියල බාල්දු වී ඇත. රුපියල කඩා වැටී ඇත. රුපියලේ වටිනාකම අඩු වී ඇත. වර්තමානයේ සිදුවෙමින් තිබෙන ආර්ථික අර්බුදයේ එක් ප්‍රකාශනයක් වී ඇත්තේ, රුපියලේ බාල්දු වීමයි. රුපියල බාල්දු වීමේ සරල තේරුම ජාත්‍යන්තරව පිළිගන්නා මුදල් ඒකකය වන ඩොලරය සමග හුවමාරු වන රුපියල් ප්‍රමාණය වැඩිවීමයි. රුපියල කඩා වැටීමට ප්‍රථම, පසුගිය අයවැයට පෙර ඩොලරයක් වටිනා භාණ්ඩ මිලදී ගැනීමට ගෙවිය යුතු වූයේ රුපියල්වලින් 110ක්ය. නමුත් මේ අර්බුදය සමග ඩොලරයක් වටිනා භාණ්ඩ මිලදී ගැනීමට රුපියල්වලින් 132ක් ගෙවිය යුතුය. එසේ නම් කළ යුත්තේ, ලංකාවට අවශ්‍ය තරම් රුපියල් මුද්‍රණය කර ගැනීම නොවේදැයි සරලව ඕනෑම අයකුට ප්‍රශ්න කළ හැකිය. අවශ්‍ය තරම් රුපියල් ඇතිනම් ඩොලරයට රුපියල්වලින් කොපමණ ගෙවුවද එය ගැටලුවක් විය නොහැක්කේය. මෙතතරම් විශාල ආර්ථික කඩා වැටීමකදීත් යුරෝපයට ණය දෙන්නට යෝජනා කරන බැසිල් රාජපක්ෂ වැනි අයටත්, රු. 7500කින් තුන්දෙනෙකුට මාසයක් ජීවත්විය හැකි යැයි කියන බන්දුල ගුණවර්ධන වැන්නවුන්ටත් මෙවැනි විසඳුමක් පහළ වුවත් පුදුම වියයුතු නැත. නමුත්, ආර්ථිකයේ මූලික මූලධර්ම තේරුම් ගතහැකි ඕනෑම අයකුට එය එසේ කළ නොහැකි බව වැටහී යනු ඇත.

**මුදල් මුද්‍රණය හා උද්ධමනය**

ලංකාවේ මහා බැංකුව ලංකාවට අවශ්‍ය තරම් කාසි හා නෝට්ටු මුද්‍රණය කරන්නේ බියගම, මල්වානේ පිහිටි ඩිලාරූ ලංකා කරන්සි ඇන්ඩ් සිකුයුරිටි ප්‍රින්ටින් පෞද්ගලික සමාගමෙන් බව සත්‍යයකි. 1986 දී ස්ථාපනය කළ එම සමාගම ආරම්භයේ පටන්ම ලංකාවට අවශ්‍ය කාසි හා නෝට්ටු මුද්‍රණය කරයි. එම සමාගමේ කොටස් හිමිකමින් 40%ක් ලංකා රජයට අයත්ය. එසේ බැවින් රජයට අවශ්‍ය පරිදි අවශ්‍ය මුදල් සපයා ගැනීමත් මුද්‍රණය කරවා ගැනීමටත් කළ නොහැකිද? එසේ කළ නොහැක. එය තවත් ආර්ථික අර්බුද රැසක් බිහි කරන්නකි. ආණ්ඩුව එසේ හිතුවක්කාර ලෙස මුදල් මුද්‍රණය කරන විට ප්‍රතිඵලය වන්නේ සංසරණයට (භාවිතයට) අනවශ්‍ය තරමේ මුදල් ප්‍රමාණයක් වෙළෙඳ පොළට පැමිණීමෙන් උද්ධමනකාරී වාතාවරණයක් ඇතිවීමය.

සියල්ල තීරණය කරන්නේ මුදල්වලින් යැයි කියමනට පැවැසුවත්, මුදල් පවතින්නේ භාණ්ඩ හා සේවා හුවමාරුව සමගය. වෙළෙඳපොළේ පවතින භාණ්ඩ හා සේවා ප්‍රමාණය ඉක්මවන, ආර්ථිකයක ඇති වත්කම ඉක්මවන මුදල් ප්‍රමාණයක් ආර්ථිකයට ඇතුල් කළ හොත් එයින් වන එකම ප්‍රතිඵලය ආර්ථිකය තුළ පවතින භාණ්ඩ ප්‍රමාණයේ මිල ඉහළ යාම පමණි. භාණ්ඩ ප්‍රමාණය ඉහළ යන්නේ නැත.

රුපියල් ඇත්තම් ඩොලර් මිලදී ගත හැකි යැයි යමකුට සිතුනද එසේ රුපියල්වලින් ඩොලර්වලටත්, ඩොලර්වලින් රුපියල්වලටත් හුවමාරු කරගත හැක්කේ, රට තුළ සංසරණය වන විදේශ විනිමය ප්‍රමාණය පමණි. රට තුළ රුපියල්වලින් ගෙන ඩොලර් මිලදී ගත නොහැකිය. මුදල් භාණ්ඩවලට හුවමාරු මාධ්‍යයක් මිස, මුදල් සඳහා මුදල් හුවමාරුවේ මාධ්‍යයක් නොවන්නේය. ඒ නිසා රටේ ආර්ථික අර්බුදයට ඩොලර් අවශ්‍ය නම් ඩොලර් ලබාගත යුතුය. ඒ සඳහාද භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කර විදේශ රටවල්වලට අලෙවි කළ යුතුමය. මුදල් අච්චු ගසා පිටරටට විකිණිය නොහැකි බව අවධාරණය කරන්නේ ඒ නිසාය. රටක මුදල් සංසරණය වන ප්‍රමාණය තීරණය වන්නේ මහා බැංකුවේ අධිපතිට හෝ ආණ්ඩුවේ දේශපාලන නායකයන්ට අවශ්‍ය වන ප්‍රමාණයට නොවේ. භාණ්ඩ ඇති ප්‍රමාණය හා එම භාණ්ඩ ආර්ථිකය තුළ සංසරණය වන වාර ගණන අනුවය. රු.10,000ක් වටිනා භාණ්ඩ වෙළෙඳපොළේ ඇති නම් එම භාණ්ඩ හුවමාරුවන වාර ගණන 10ක් ලෙස සැලකුවොත් ආර්ථිකයට අවශ්‍ය වන රුපියල් ප්‍රමාණය රු.1000කි. රු.10000ක්ම කාසි හා නෝට්ටු ආර්ථිකයට යොදාග ැනීම අවශ්‍ය නොවන්නේය. අවශ්‍ය වන්නේ, එම භාණ්ඩ ප්‍රමාණය සංසරණය වන වාර ගණන අනුව (භාණ්ඩයේ ස්වභාවය අනුව) මිලදී ගැනීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය ආර්ථිකය තුළ තිබීමය. ඊට වැඩි මුදල් තොග යක් ආර්ථිකයට යෙදවීමෙන් සිදුවන්නේ භාණ්ඩයේ මූල්‍ය වටිනාකම පමණක් ඉහළ යාමය. මෙහි ප්‍රතිලෝමයද මෙසේමය. මුදල් හා හුවමාරු වන වාර ගණන (අවශ්‍යතාවය අනුව) සීමිත භාණ්ඩයක්ද (උදා:- එළවළු) අසීමිතව එකවර වෙළෙඳපොළට පැමිණි විගස මිල අසීමිත ලෙස පහළ බසී. මූල්‍යමය වටිනාකම අඩුවූ පමණින් පාරිභෝජනය වැඩි කළ නොහැක්කේ එම භාණ්ඩ හුවමාරු වන නිශ්චිත වාර ගණනක් (Velocity) ඇති නිසාය. රුපියල් බාල්දු වීම බැඳී ඇත්තේ රුපියල අච්චු ගැසීමේ ක්‍රියාවලියක් සමග නොව පැහැදිලිවම භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය හා බැඳුණු ආර්ථිකයත් සමග බව අප තේරුම් ගත යුත්තේ එබැවිනි. එය නිෂ්පාදන ආර්ථිකයක ඉලක්ක වෙනුවට මිත්‍යා ප්‍රාග්ධනයක ඉලක්ක හඹා යාමේ ප්‍රතිඵලයකි. එයට පිළියම් ලෙස රුපියල මුද්‍රණය කළහොත් සිදුවන්නේ මූල්‍යමය වටිනාකමින් ආර්ථිකය පිටවී භාණ්ඩ නිෂ්පාදනයේ ප්‍රමාණය තවත් අඩුවීමෙන් ආර්ථිකය අර්බුදයෙන් අර්බුදයට ගමන් කිරීමය.



**රුපියලේ සිට කෞතුකාගාරය වෙත**

ලංකාවේ මේ මොහොතේ ඔඩු දුවන ද්‍රව්‍ය ආර්ථික අර්බුදය ආර්ථිකයට පමණක් සීමා නොවන දේශපාලන අර්බුදයක මට්ටමටත් ඉන් ඉදිරියට ජාතික කෞතුකාගාරයද මංකොල්ලකන සමාජ අර්බුදයක් බවටත් පත්වෙමින් තිබේ. එය ලංකාවට පමණක් සීමා වූ අර්බුදයක් නොවන්නේය. අද තනි යායක් යැයි ධනේශ්වර මතධාරීන් සාහිත්‍යයට නගන මුළු ලෝකය පුරාම පැතිර යන්නේ මේ අර්බුදයේ ප්‍රකාශනයන්ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි අනුව ආණ්ඩුවට ණය ගැනීමට සිදුවිය. ඒ ණය කොන්දේසි අනුව ඇමරිකානු ඩොලර් බිලියන 2.6ක ණය මුදලේ අවසාන ණය වාරිකය ලබාගන්නට නම් ආණ්ඩුව භාණ්ඩාගාරයේ විදේශ සංචිත වලින් ඩොලර් මුදාහරිමින් රුපියල බාල්දු වීම වළක්වාගෙන සිටින තත්වයෙන් ඉවත් විය යුතු විය. එසේ නොකරන්නේ නම් ණය වාරිකය නොලැබෙනවා පමණක් නොව ලබා ගෙන ඇති ණය සඳහා පොලී අනුපාතයන්ද ඉහළ දමන බව මූල්‍ය අරමුදලේ උපදේශකයෝ ආණ්ඩුවේ නියෝජිතයන්ට තර්ජනය කළෝය. අවසානයේ රුපියල බාල්දු කිරීමටත් බාල්දුවේ ප්‍රතිඵල ලෙස ඉන්ධන මිලදී ගැනීමේදී අතිවිශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඩොලර් ලෙස ගෙවීමටත් ආණ්ඩුවට සිදුවිය. ණය ගැනීමෙන් පුම්බන ලද 8.3%ක අපේක්ෂිත ආර්ථික වර්ධනය වේගය හා දැන් ආර්ථිකයේ පවතින වෙළෙඳපොළ ගෙවුම් ශේෂ අර්බුදය පැන නගින්නේ එතැන් සිටය.

ආණ්ඩුව 2011 වසර තුළදී පමණක් ලබාගෙන ඇති මුළු ණය හා ප්‍රදානයන් ප්‍රමාණය ඩොලර් මිලියන 2824කි. එහි රුපියල් වටිනාකම රුපියල් මිලියන 314,927කි. (2012.03.12 දක්වා) රජය හා පෞද්ගලික අංශය 2011 වසරේදී ලබාගෙන ඇති මුළු විදේශ ණය ප්‍රමාණය ඩොලර් මිලියන 6927.25කි. නමුත්, රජය සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියෙන් ජනනය කර අපනයනයෙන් ලද ආදායම 2011 වසරේදී ඩොලර් මිලියන 10,487කි. නමුත් ආනයන වියදම ඇමරිකන් ඩොලර් මිලියන 20,230කි. අපනයන හා ආනයන අතර වෙනස පමණක් සැලකුවද, රටට විනිමය ලැබෙන අපනයන ආදායම මෙන් දෙගුණයක් ආනයන සඳහා වියදම් කිරීමට සිදුවී ඇත.

**විදේශ වෙළදාමේ ක්‍රියාකාරිත්වය (සටහන 1)**

| | 2010 ජනඃ දෙසඃ ඩොලර් මිලියන | 2011 ජනඃ දෙසඃ ඩොලර් මිලියන | ජනඃ දෙසඃ වර්ධනයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| අප නයන | 8,569.6 | 10,486.9 | 22.4 |
| කෘෂිකාර්මික | 2132.4 | 2342.0 | 9.8 |
| කාර්මික | 6153.6 | 8016.6 | 2.6 |
| ඛනිජ ද්‍රව්‍ය | 94.5 | 128.1 | 35.6 |
| ආනයනය | 13,450.9 | 20230.1 | 50.4 |
| පරිභෝජනය | 2870.3 | 4138.8 | 44.2 |
| අන්තර් භාණ්ඩ | 7495.9 | 11,317.6 | 51.0 |
| ආයෝජන භාණ්ඩ | 2908.8 | 4663.3 | 60.3 |
| වෙළඳ ශේෂය | -4881.3 | -9743.2 | -99.6 |

**මුදල් වෙළෙඳපොළ හා නිෂ්පාදනය**

රටක ආර්ථිකයේ පැවැත්ම රදා පවතින්නේ ඒ රටේ මූල්‍ය-බැංකු-රක්ෂණ-කල්බදු සමාගම් අතරේ හුවමාරු වන මුදල් වල අගයන් මත නොවේය. එසේ නැතිනම් කොටස් වෙළෙඳපොළේ සංසරණය වන මුදල්වල මවන වටිනාකම්වලින් ලැබෙන ජයග්‍රහණය මතද නොවේ. සේවා ආර්ථිකයේ ඉපැයීම හා කොටස් වෙළෙඳපොළේ මවන අගයන්වල සැබෑ වටිනාකම ඇත්තේ, නිෂ්පාදන ක්‍රියාවලියට එය සම්බන්ධ වුවහොත් පමණි. අලුතින් වටිනාකම උපදින්නේ කොටස් වෙළෙඳපොළින් නොව නිෂ්පාදන කර්මාන්ත හෝ කෘෂිකාර්මික ක්ෂේත්‍ර තුළින්ය. ලංකාවේද (ලෝකයේ වෙනත් රටවල මෙන්ම) තත්වය අර්බුදය වී ඇත්තේද නිෂ්පාදනය-ඉපයීම-නව වටිනාකම- ජනිත වීම වෙනුවට පුම්බන ලද කොටස් හා මූල්‍ය වෙළෙඳපොළ අර්බුදයට යාමය. විදේශ විනිමය ලැබීම හා විදේශ විනිමය රටින් පිටකිරීම අතර වෙනස සෘජු වර්ධනය 99.6ක් වීමෙන්ම අර්බුදයේ තරම තේරුම් ගත හැකිය.


විදේශ වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය (සටහන 01) සටහන 01 නිරීක්ෂණය කිරීමේ, එය 2011 වසර අවසානයේ පැවැති තත්වය වුවත් වර්තමානයේ ඇතිවී තිබෙන බරපතළ විදේශ විනිමය හිඟයට බලපෑ සැබෑ හේතු සඳහා ගත හැකිය. 2011 වසරේදී අපගේ රටේ විදේශ විනිමය ඉපැයීම වර්ධනය වී ඇත්තේ, 22.4%කින් පමණි. එයිනුත් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආදායම 9.8%ක මට්ටමකද කාර්මික නිෂ්පාදන අපනයනයේ ආදායම වැඩවීම 2.6%ක මට්ටමක පැවැතියේය. ඒ සොච්චම් වර්ධනය තුළ ඇඟලුම් ක්ෂේත්‍රයේ 24%කුත් හා රබර් ආශ්‍රිත නිෂ්පාදනය 58.3%කුත අඩංගුය.

නමුත් අපනයන ආදායමට සාපේක්ෂව ආනයන වියදම දෙගුණයකි. එයින්ද වැඩිම ප්‍රතිශතයක් වියදම් කර ඇත්තේ, ප්‍රවාහන උපකරණ ගෙන්වීමටය. එය 76.4%ක වර්ධනයකි. ඉවක් බවක් නොමැතිව තීරු බදු සහන යටතේ වාහන ගෙන්වීමට ඉඩදීමද මීට හේතු විය. ඛනිජ තෙල් සඳහාද පසුගිය වසරට වඩා 53.4ක්ද ආහාර සඳහා පාරිභෝගික භාණ්ඩ ආනයනයට පසුගිය වසරට වඩා 67.1% ක්ද ලංකාව වියදම් කර ඇත. මේ නව ලිබරල්වාදී ආර්ථික බැලුමය. එසේ පිම්බීම තුළ අවසානයේ ඉතිරි කළ ප්‍රතිඵලය වූයේ, ආර්ථිකයට දරාගත නොහැකි තරමේ විදේශ විනිමය අර්බුදයකට ආණ්ඩුව මුහුණදීමය. ආණ්ඩුව මෙම අපනයනවලට වඩා ආනයන සඳහා දරන ලද වියදම උපයා ගන්නේ කෙසේද? ඉතාම පැහැදිලි ලෙස ණය, දඩ හා බදුවලින්ය. දඩ හා බදු ජනතාවගෙන්ය. ජනතාවට වියදම් කිරීමට ඇති දේ ආණ්ඩුව ජනතාවගෙන් උදුරාගෙන ආණ්ඩුව නාස්තිකාර ලෙස වියදම් කිරීමෙන් ආර්ථිකයට අලුතෙන් වටිනාකම් ඉපදෙන්නේ නැත. ඒ වෙනුවට ප්‍රතිඵලය වන්නේ, ජීවන බරින් මිරිකෙන ජනතාව තව තවත් දුප්පත් වීමය. ණයවල ප්‍රතිඵලය තව තවත් ණය ගෙවීමට ණය ගැනීමට සිදුවීමය. ආණ්ඩුවේ ගෙවිය යුතු ණයවල සංයුතිය නිරීක්ෂණයෙන් මේ අර්බුදය තේරුම් ගත හැකිය.

**රුපියල නැගිටින මඟ**


රුපියල බාල්දුවීම වළක්වා යළි පණ ගැසීමට ආණ්ඩුවට ඇති සරලම උපක්‍රමය මුදල් අච්චු ගැසීම වුවත් එය අර්බුදකාරී විකල්පය බව පැහැදිලිය.

2 වැනි පිටුවට



''නිෂ්පාදනය සමාජමය වන්නේය. නමුත් හිමිකර ගැනීම පෞද්ගලිකව තෙරෙන්නේය. සමාජමය නිෂ්පාදන මාර්ග අතළොස්සක් දෙනා ගේ පෞද්ගලික දේපළ වී පවතී. නාමික වශයෙන් පිළිගනු ලබන නිදහස් තරඟයේ පොදු රාමු කට්ටුව පවතින අතර අතළොස්සක් වන ඒකාධිකාරිත්වයේ විය ගසෙහි බර සිය ගුණයකින් වැඩි වී සෙසු ජන ගහනයේ කර පිට වැටෙන්නේය.''

**ලෙනින් (තෝරාගත් කෘති - 4 වෙළුම, 49-50 පිටුව)**



# රාජ්‍යය ගැන මාක්ස් කියයි

රාජ්‍යයේ සම්භවය පිළිබඳව දේවවරම් වාදය, සමාජ සම්මුති වාදය ආදී මතයන් සම්බන්ධව පසුගිය කලාප තුළින් අපි සාකච්ඡා කළ බැවින් මෙවර ඒ සම්බන්ධයෙන් ඇති මාක්ස්වාදී මතය පිළිබඳව අවධානය යොමුකරමු.
මාක්ස්වාදී මතයට අනුව රජය යනු පංති ප්‍රතිවිරෝධයන්ගේ ප්‍රතිඵලයක් බව පැවසේ.
ඒ බව සනාථ කිරීම සඳහා මාක්ස්වාදයේ නිර්මාතෘවරුන් වන කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් ඓතිහාසික කරුණු කාරණා රාශියක් පෙළ ගස්වනු ලබයි.

**මිනිසාගේ මුල් අවධිය**

පංති සහ රජයක් නොමැතිව තිබූ මිනිසාගේ මුල් අවධිය හෙවත් මුල් සමාජය ප්‍රාථමික සාමූහික සමාජය වශයෙන් හඳුන්වනු ලබයි. මෙකල මුළු මිනිස් සමාජයම ලේ නෑකම මත සංවිධානය වී සිටි අතර එම සංවිධාන ක්‍රම සංවර්ධනය වී අවසානයේ එම සමාජය පංති සහ රජයක් සහිත සමාජයක් විය. මෙය සිදුවූ ආකාරය පිරික්සීම සඳහා ඒ ආර්ථික තත්වයන් සහ සමාජ තත්වයන් ගැන අවධානය යොමුකරමු.
පවුල් සබඳතා වල විකාශනය සහ නිෂ්පාදනයේ දියුණුව මත මේ සමාජය,
1 ම්ලේච්ඡ
2 අශිෂ්ට
යනුවෙන් ප්‍රධාන යුග දෙකකටත් අධ්‍යයනයේ පහසුව සඳහා ඒවා පහළ, මැද හා ඉහළ යනුවෙන් අනු කොටස් වලටත් වෙන්කර ගතහැක.

**ම්ලේච්ඡ යුගය**

මෙය මිනිසාගේ බිළිඳු අවධිය ලෙස සැලකේ මුල්ම මිනිසා අඩක් රුක් මතද, අඩක් බිමෙහිද වාසය කළේය. ම්ලේච්ඡත්වයේ මුල් අවධියේ විශේෂය වන්නේ කථා කිරීමට හැකි වීමය. මෙහිදී ස්වභාව ධර්මය තුලින් සපයා ගත හැකි දේ ආහාරයට ගන්නා ලදි. නිෂ්පාදනය දුර්වල මට්ටමක තිබුණ මේ යුගයේ ආරක්ෂාව සඳහාත්, වර්ගයා බෝ කිරීමේ අවශ්‍යතාවය සඳහාත්, සාමූහිකව විසීමට මිනිසාට සිදුවිය. ඒ අනුව මිනිසා ගණ හා ගෝත්‍ර ලෙසින් සංවිධානය වී සිටි බව පෙනේ. ගණය ඉතා කුඩා ඒකකයක් වූ අතර ගණ කීපයකින් ගෝත්‍රය සැදුණි. ගෝත්‍රය තුළ පොදු දේපළ ක්‍රමයක් පැවතුනි. මේ කාලයේ තිබූ ලිංගික සම්බන්ධතා අවිචාරවත් සම්බන්ධතා ලෙස සැලකේ. එනම් ගෝත්‍රයක් තුල සිටි සියළුම පිරිමින් හා ගැහැනුන් දෙමව්පිය සහෝදර බේදයකින් තොරව ලිංගික සම්බන්ධතා පැවැත්වීමයි. මෙය එදා සමාජයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන්නක් විය.
ම්ලේච්ඡත්වයේ මධ්‍යම අවධිය වන විට මිනිසා ගින්දර සොයා ගැනීමත් ඔවුන්ගේ ආහාරයට මත්ස්‍ය වර්ග සහ අල වර්ග එකතු කර ගැනීමට හැකි විය. මේ නිසා ස්භාව ධර්මයේ බලපෑමෙන් එක්තරා දුරකට මිදී ගංගා ඔස්සේ භූමිය පුරා පැතිරීමට හැකි විය. දඩයම් කිරීමද ඉදහිට කරන ලදී. මේ වනවිට ගෝත්‍ර පුළුල් වීමත් සමඟ දෙමාපියන් හා දරුවන් අතර ලිංගික සබඳතා අහෝසි වීම නිසා ලේ ඥාති පවුල නම් පවුල් සම්බන්ධතාවය ගොඩ නැගුණි. මෙය සමාජය තැබූ වැදගත් ඉදිරි පියවරකි. එහෙත් සහෝදර සහෝදරියන් අතර ලිංගික සම්බන්ධතා එසේම පැවතුණි. මෙම ලේ ඥාති පවුල සමාජයේ මුල්ම පවුල් ක්‍රමය විය. ගෝත්‍ර තුළ පවුල් කණ්ඩායම් ලෙස සබඳතා පැවැත්විය. සම වයසේ ගැහැනුන් හා පිරිමි එක් පවුල් කවයක් සැදූ අතර ඔවුන්ගේ දරුවෝ තෙවැනි පවුල් කවය ලෙසින්ද පවුල් කව සැදුහ. මේ කව එකිනෙක අතර ලිංගික සබඳතා නොතිබුණි. ඒවා ඒ තුලට පමණක් සීමාවුණි.
දුන්න හා හීය සොයාගැනීමත් සමඟ සමාජය ම්ලේච්ඡත්වයේ සිට ඉහල අවධියට පාතැබූ බව පවසයි. දුන්න සහ හීය සංකීර්ණ අවියක් වීම නිසා දඩයම වෙනදාට වැඩියෙන් කිරීමට හැකි විය. ගල් අවිද නිපදවන ලදි. ඒ අතර ගස්වල පට්ටා වලින් වට්ටි පෙට්ටි හා රළු ඇඳුම් සෑදීම ඇරඹිණි. මේ යුගයේදී සමාජය අශිෂ්ඨත්වයට පා තැබූ බව එංගල්ස් පවසයි.
විවාහ සම්බන්ධතාවයද කලින් තත්වයේ සිට නව ස්වභාවය කට පරිවර්ථනය වෙමින් පැවතිණ.
මෙම ගෝත්‍රික සමාජය තුල ආර්ථික තත්වයන්ගේ එනම් නිෂ්පාදනයේ පහත් මට්ටම නිසාම සූරා කෑමක් හෝ පෞද්ගලික දේපළක් නොතිබිණ. ජනගහනය ඉතා අඩු විය. ගෝත්‍ර වලට විශාල දඩබිම් තිබුණි. සමාජයේ මුල්ම ශ්‍රම විභජනය ස්ත්‍රිය හා පුරුෂයා අතර සිදු විය. පුරුෂයෝ මසුන් ඇල්ලීම දඩයමේ හා යුද්ධයට යාම කළ අතර, ඊට අවශ්‍ය උපකරණ තැනීය. ස්ත්‍රීන් ගේ දොර බලා ගැනීම, ළමයින් රැක බලා ගැනීම සහ ඇඳුම් පිළියෙළ කිරීම කරන ලදී. දෙපිරිසම මේ අංශයන්වලට දක්ෂයන් විය. තමන් විසින් සාදා පාවිච්චි කළ අවි හා උපකරණ තමන්ට අයත් විය. එහෙත් නිෂ්පාදනය පොදුවේ සියල්ලන්ටම අයත් විය. තමන් විසින් උපයා ගත් දේපළ අපට දැකිය හැකි වන්නේ, මෙතනදී පමණක් බව එංගල්ස් පවසයි. ගෝත්‍රය තුළ සමාජමය කටයුතුවලදීත් සපේක්ෂව පූරුෂයන්ට වඩා වැදගත් කටයුතු වූ ගේ දොර වැඩ හා ළමයින් බලා ගැනීම කළේ ස්ත්‍රීන් නිසා අනෙක් අතට පැවති පවුල් සම්බන්ධයත් මත දරුවන් ගේ අයිතිය කීමට හැකි වූයේ, මවට නිසාත් මේ සමාජය මාතෘ මූලික එකක් විය.

**අශිෂ්ට යුගය**

කුඹල් කර්මාන්තය හා සතුන් ඇති කිරීම සමඟ මෙය ඇරඹිණි. මෙය සමඟ පවුල් සබඳතා වලද වෙනසක් වූ බව පෙනේ. ලේ ඥාති පවුල වෙනස් වී පූනලුවා පවුල නම් විවාහ ක්‍රමයක් ඇති විය. මෙය බිහිවූයේ සහෝදර, සහෝදරියන් අතර ලිංගික සබඳතා අහෝසි වීමත් සමඟය. එය සමාජය තැබූ දෙවන වැදගත් පියවර විය. ගෝත්‍රය තුළ කාණ්ඩ දෙකක් සැදුන අතර ඒවා වංශ ලෙස නම් කරන ලදී. එක් වංශයක සමවයසේ පිරිමි අනෙක් වංශයේ සම වයයේ කාන්තාවන් සමඟ ලිංගික සම්බන්ධතා පැවැත්වූ අතර වංශය තුළ ලිංගික සබඳතා තහනම් කරන ලදී. මෙසේ සමාජය, වංශ සංවිධාන තුළින් සංවර්ධනය වන්නට විය.
අශිෂ්ටත්වයේ මධ්‍යම අවධිය වන විට සත්ව පාලනයට අමතරව කෘෂිකර්මාන්තයද ඇති විය. සමාජයේ දෙවැනි මහා ශ්‍රම විභජනය වූ කෘෂිකර්මාන්තයෙන් හස්ත කර්මාන්තය වෙන් කරන ලදි. වංශ සංවිධානය තුළ පැවති පවුල් ක්‍රමය වෙනස් වී යුගලන පවුල ඇති විය. මෙහිදී සිදුවූයේ පූනලුවා පවුල තුළ සිටි පිරිමි සියලු කාන්තාවන් අතුරින් එක් ප්‍රධාන බිරියක් තබා ගැනීමටත් ඒ අතරම අනෙක් කාන්තාවන් සමඟද සබඳතා පැවැත්වීමත්‍ය. කාන්තාවන්ටද එසේම එක් ප්‍රධාන පූරුෂයෙක් සිට ඇත. එම ප්‍රධාන යුගලය දරුවන් ලැබෙන කාලයේදී එකට වාසය කොට ඇත. මේ සමඟ අශිෂ්ඨත්වයේ උසස් අවධියට සමාජය පිවිසෙයි. මේ විශේෂ දේ සිදු වන්නේ යකඩ සොයා ගැනීමත් සමඟය. යකඩ පොරව හා නගුල ඇති වීමත් සමඟ නිෂ්පාදනය වඩාත් දියුණු විය. එම නිෂ්පාදන දියුණුව විසින් දේපළ වැඩි වීමත් සමඟ වංශ සංවිධානය තුලින් එය බිඳගෙන පෞද්ගලික දේපලත්, ඒක භාර්යා වෘත්තය සහිත පවුලක් බිහිවී ඉන් ඇති වුණු ප්‍රති විරෝධතා මැඩීමට රජයද ඇති විය. මෙහිදී වංශ තුලින් රජය ඇති වූයේ කෙසේද යන්න හඳුනා ගැනීමට වංශයේ සංවිධානය පිළිබඳව විමසා බලමු.

**වංශ සෙවීමට මෝර්ගන්ගේ සහාය**

වංශ පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ඉතිහාසඥයෙක් වූ මෝර්ගන්ගේ සොයා ගැනීම් අපට වැදගත් වේ. අමෙරිකාවේ ඉරෝකුයිස් වංශ පිළිබඳව මෝර්ගන් විසින් කළ විමර්ශන ඉතා වැදගත්ය. එහි සංවිධාන ව්‍යුහය සුළු වෙනස්කම් සහිතව ග්‍රීක, රෝම, ඇතැන්ස් ජර්මන් සහ ඉන්දියානු වංශ තුළද තිවූ බව පෙනේ. අශිෂ්ටත්වයේ මුල් යුගයේදී පුනාලුවා පවුල් ක්‍රමය ඇතිවූ වංශ ලේ ඥාති පදනම මත සංවිධානය වී තිබුණි. බෝහෝ රටවල මේවා සංවිධානය වී තිබුණේ සතුන්ගේ නම් අනුවය. මෙහි ව්‍යුහය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී උදාහරණ ලෙස ඉරෝකුයිස් වංශය අපට ගත හැක. ගෝත්‍රයක් තුළ මුල් වංශ මව් වංශ වූ අතර ඒවා විශාලවත්ම දුහිතෘ වංශ ලෙසද බෙදී ගිය බව පෙනේ. එම දුහිතෘ වංශ එකිනෙක සහෝදරත්ව ලෙස හැඳින්විණි.

> තමන් විසින් සාදා පාවිච්චි කළ අවි හා උපකරණ තමන්ට අයත් විය. එහෙත් නිෂ්පාදනය පොදුවේ සියල්ලන්ටම අයත් විය. තමන් විසින් උපයා ගත් දේපළ අපට දැකිය හැකි වන්නේ, මෙතනදී පමණක් බව එංගල්ස් පවසයි.

**වංශ සංවිධාන**

1. වංශ තුළින් වංශ ප්‍රධානියෙක් (සාකෙම්), යුධ නායකයෙක් තෝරාපත් කරගත් බව පෙනේ. මෙහිදී වංශ ප්‍රධානියා වංශය තුළින් පරපුර අනුව තොරා පත්කර බව පෙනේ. යුධ නායකයා වංශයෙන් පිටවුවද තෝරාගෙන ඇත. මව් අයිතිය බලපෑ බැවින් සාකෙම්ගේ පුතා ඊළඟ සාකෙම් නොවීය. බොහෝ විට ඊලඟට පත්වන්නේ තම සහෝදරයෙක් හෝ මවගේ සහෝදරියකගේ පුතෙකි. මෙම පත්වීම ස්ත්‍රී පුරුෂ සියල්ලන්ගෙ 'ම ඡන්දයෙන් සිදු කෙරුණි. මෙය ගෝත්‍රයේ අනෙකුත් වංශ විසින්ද අනුමත කළ යුතු අතර ගෝත්‍රය විසින් පිළිගත්තේ ඉන් පසුවය. මෙම වංශ නායකයාට හෝ යුධ නායකයාට ආධිපත්‍ය හෝ වරප්‍රසාද නොතිබුණු බැවින් බලහත්කාරකම් කිරීමට නොහැකි විය.
2. වංශ තුළ ඡන්දයෙන් පත්කරන මෙම ප්‍රධානීන් අවශ්‍ය විටක ඉවත් කිරීමට හැකි විය. වංශය අකමැති වුවද අවශ්‍ය නම් ගෝත්‍ර සංවිධානයට ඔවුන් ඉවත්කළ හැක.
3. වංශ සමාජිකයන්ට වංශය තුළ විවාහ වීම තහනම් විය.
4. මියගිය වංශිකයකුගේ දේපළ වංශය තුළ ඉතිරි විය.
5. වංශ සාමාජිකයෝ එකිනෙකාගේ ආරක්ෂාවට උදව් කිරීමට බැඳී සිටිති. ලේවල පලිය ගැනීමද කරති. ඊට හේතුව මුළු වංශයම ලේ ඥාතීන් වීමයි.
6. සෑම වංශයකටම ඊට අවේණික නම් තිබූ අතර, වංශ හඳුනාගත්තේ එම නම්වලිනි.
7. වංශයට පිටස්තර පුද්ගලයන් ඇතුළත් කරගත හැකි වූ අතර මුල්කාලවල යුධ සිරකරුවන් එසේ ඇතුල් කර ගන්නා ලදී.
8. වංශයට පොදු සොහොන් බිමක් තිබුණි.
9. වංශයට මණ්ඩලයක් තිබී නැත. එහි සියලු ස්ත්‍රී පුරුෂයන්ට ඡන්ද බලය තිබූ අතර ඔවුන්ගේ ඡන්දයෙන් වංශ නායකයන් තෝරා ගන්නා ලදී.

මෙම සංවිධාන ව්‍යුහය අනුව පෙනී යන්නේ, වංශ තුළ බලහත්කාරී පාලනයක් නොතිබුණ බවත් එහි පැවතුණු ලේ ඥාති සබඳකම විසින් සාමාජිකයින් එකට බැඳ තැබූ බවත් ඔවුන් අතර තිබූ සාමූහිකත්වය නිසා පෞද්ගලික කිසිවක් නොතිබුණු බවත්‍ය. නිෂ්පාදන කොට පරිභෝජනය කළ සෑම දෙයක්ම පොදු දේපළ විය. මෙලෙස පැවතුණු වංශ තුළින් පසු කලෙක රජය පැන නැගුණේ කෙසේද ?

**රජයේ උපත**

ප්‍රාථමික සාමූහික සමාජයේ අවසාන අවධිය හෙවත් අශිෂ්ටත්වයේ ඉහළ අවධිය වන විට සමාජයේ වංශ සංවිධාන බිහිවී, ඒවායේ නිෂ්පාදනය දියුණු වීම එම සංවිධානවල සරල ව්‍යුහය බිඳ දැමීමට සමත් විය. මේ පිළිබඳව විවිධ වංශ තුළ රජය ඇතිවූ සැටි පිරික්සීමෙන් පැහැදිලි වේ. ග්‍රීක වංශ උදාහරණයක් ලෙස ගත්විට අශිෂ්ටත්වයේ ඉහළ අවධියේ ඒවා දියුණු මට්ටමක පැවති බව පෙනේ. සමාජය තුළ සූරා කෑමේ හැකියාව ඇතිවීමත් සමඟ සමහර තැන්වල පෞද්ගලික දේපළ ඇතිවීමට පටන්ගෙන තිබූ බව පෙනේ. පුරුෂයන්ට අයත්වූ මෙම පෞද්ගලික දේපළ තම දරුවන්ට උරුම කරදීමේ වුවමනාව විසින් එතෙක් පැවති විවාහ සම්බන්ධතා බිඳ වැටෙමින් තිබු බව පෙනේ. පිය අයිතිය ඇති වෙමින් තිබු අතර එය වංශ සංවිධානය තුළ පළමුවෙනි උල්ලංඝනය කිරීම වේ. මේ නිසා පොහොසත් උරුමකාරයන්ගේ දේපළ විවාහය නිසා පිරිමියාට අයිතිවිය. එනම් වෙනත් වංශයකට අයිතිවිය. මේ නිසා ධනය වංශ තුළම තබා ගැනීමේ වුවමනාව විසින් යළිත් වංශ තුළින්ම විවාහවීමේ අයිතිය තරුණයන්ට දෙන ලදී. එහෙත් තවමත් වංශ තුළ පවුල් ඒකකයක් නොවීය. ඊට හේතුව ගැහැනිය හා පිරිමියා වංශ දෙකකට අයත්වීමය. මෙහිදී පෞද්ගලික දේපළ සිය දරුවන්ට උරුමකර දීමේ වුවමනාව නිසා ඒක භාර්යා වෘතය සහිත පවුල ඇතිවීමත් සමඟ වංශ සංවිධාන කැඩී බිඳී විසිරිණි. ලේ ඥාති සබඳතා වෙනුවට දේපළ සබඳතා ඇතිවිය. මුලදී යුද සිරකරුවන් පමණක් වහලුන් ලෙස තබාගත් වංශය දැන් තමන්ගේම වංශ සාමාජිකයින්ව වහලුන් ලෙස තබා ගැනීම ආරම්භ කළේය. පැරණි ගෝත්‍රික යුද්ධ, ජීවිකාවන් කරගෙන යෑමේ හා දේපළ පැහැර ගැනීමේ යුද්ධ දක්වා පිරිහිණි. වංශ සංවිධාන විකෘති විය. පෞද්ගලික දේපළ ශුද්ධ වූ දෙයක් ලෙස සැලකූ අතර ඒවා ආරක්ෂා කිරීමත් ගොඩ නැගීමත් කළ යුතු විය. ඒ සඳහා සමාජයේ කොටසක් සූරා කෑ යුතු වු අතර ඊට පොදු ජන වලංගුතාවයක්ද අවශ්‍ය විය. මේ සමඟ සූරාකන්නන් හා සූරාකෑමට ලක්වන්නන් අතර ගැටුම් ඇතිවිය. සූරා කෑමට ලක්වන්නන් පාලනය කිරීමට ආයතනයක් අවශ්‍ය විය. ඒ ආයතනය අනෙකක් නොව රජයයි. ගෝත්‍රය තුළ සිටි අවිගත් ජනතාවන් වෙනුවට ජනතාවගෙන් ඈත්වූ ජනතාවට එරෙහිව යෙදවිය හැකි අවිගත් බලයක් නිර්මාණය විය. ග්‍රීක වංශ තුළ මෙන්ම රෝම හා ඇතැන්ස් වංශ තුළද මෙය සිදුවූ බව පෙනේ.
මේ අනුව අපට පැහැදිලිව පෙනෙන්නේ, වංශ සංවිධාන තුළ ඇතිවූ නිෂ්පාදනයේ දියුණුව නිසා දේපළ ඇති වීමත් ඒ සමඟ සූරාකෑම ඇති වීමත් එහි ප්‍රතිඵල ලෙස ඇතිවූ පෞද්ගලික දේපළ පුරුෂයන්ට අයත් වූ නිසා ඒවා පරපුරෙන් පරපුරට පවත්වා ගැනීමට වංශ සංවිධානයේ සියලුම කොන්දේසි උල්ලංඝනය කළ බවත් දේපළ තම දරුවන්ට උරුමකර දීමට ඒක භාර්යා වෘතය සහිත පවුල ඇතිවීමත් සමඟ වංශ සංවිධානයේ බැම්ම වූ ලේ ඥාති සබඳතා බිඳී ගොස් නිෂ්පාදන සබඳතා හා රාජ්‍ය සබඳතා ඇති විය. මිනිසාගේ මුල්ම සංවිධාන ආකාරය වූ ලේ නෑකම් මත බැදුනු ගණ හා ගෝත්‍ර වෙනුවට ඊට වඩා පුළුල් වූ අර්ථික හා සංස්කෘතික ජාතිකත්ව බිහිවිය. මෙලෙස සමාජයේ ව්‍යුහ බිඳවැටී සමාජය ඒ තුළින්ම ප්‍රතිවිරෝධයකට හසුවීම නිසා එහි ප්‍රථිඵලයක් ලෙස රජය බිහිවූ බව පැහැදිලිය.
මේ කරුණු අනුව අපට පහත නිගමනවලට එළඹිය හැක.
1. රජය වූ කලි පංති ප්‍රති

15 වැනි පිටුවට

# මගීන් කම්බස් කරන ආණ්ඩුවේ බස් ගාස්තු

අපේ රටේ ප්‍රවාහනය පොදු සේවාවක් ලෙස මුලින්ම ආරම්භ කර ඇත්තේ 1935 වසරේදීය. හලාවත කොළඹ පෞද්ගලික බස් රථ සේවාවක් වශයෙන් එය ආරම්භ වී තිබෙන අතර පසුව කොළඹ නුවර, කොළඹ ගාල්ල ආදී වශයෙන් ක්‍රමානුකූලව ව්‍යාප්ත වී තිබේ. ඊට සමාන්තරව බස් රථ ප්‍රවාහන කටයුතු සඳහා යෙදවීම වෙනුවෙන් සංගම්ද බිහිවී තිබේ. 1958 ජනවාරි 01 වන දින ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය පිහිටුවීමත් සමග එතෙක් පෞද්ගලික සංගම් සතුව තිබූ පොදු මගී ප්‍රවාහන කටයුතුවලට රජය මැදිහත්වීම සිදුවිය. ආණ්ඩුවේ මැදිහත්වීමෙන් පොදු මගී ප්‍රවාහන සේවය ආරම්භ කරන විට එහි මූලික අරමුණ ලෙස සටහන් කර ඇත්තේ මහජනතාව වෙනුවෙන් ලාභ ඉපයීම වෙනුවට සේවාවක් ලෙස මෙය ක්‍රියාත්මක වන බවයි. ඒ අනුව එවකට ආණ්ඩු කරවූ පාළකයන් පෞද්ගලික අංශය සතුව තිබූ පෞද්ගලික බස් රථ මගී ප්‍රවාහනය රජයේ මැදිහත්වීමට නතු කර ගන්නට සමත් වී තිබේ. ඉන් පසු ක්‍රමානුකූලව පෞද්ගලික බස් සංගම් අඩපණ වන්නට වූයේ ආණ්ඩුවේ මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වූ ජාතික ප්‍රවාහන සේවාව ජනතාව තුළ ස්ථාපිත වූ නිසාවෙනි.

එහෙත් 1978 විවෘත ආර්ථිකය හඳුන්වාදීමත් සමග ලාභය මත සියල්ල ගණනය කරන ආණ්ඩුවල දැක්මට යටත්ව ප්‍රවාහන සේවාවද ලාභ උපයන ආදායම් මාර්ගයක් බවට පරිවර්තනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක වන්නට විය. ඒ අනුව 1978 දී විශාල වශයෙන් පෞද්ගලික බස් රථ පොදු මගී ප්‍රවාහන සේවාව සඳහා යොදවන්නට වූ අතර පසුව විශාල සමාගම් ලෙසද මේවා පළල් වන්නට විය. ඒ අනුව පොදු ප්‍රවාහන සේවාවට අදාලව ආණ්ඩුව සතුව තිබූ කාර්යක්ෂම කාර්යය සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයට නතු කර ගන්නට හැකියාව ලැබුණි. 1978 පෞද්ගලික බස් රථ ධාවනයට යොදවන විටත් ගමනාන්තයක් වෙනුවෙන් මගී ජනතාවගෙන් අය කර ගත යුතු මුදල කොපමණද යන්න තීරණය ගනු ලැබුවේ ගමනා ගමන මණ්ඩලයයි. ඒ අනුව පෞද්ගලික බස් රථ හිමියන්ට කුමන තත්වයක් යටතේදීවත් ගමනාන්ත සඳහා වූ බස් ගාස්තුව තීරණය කිරීමේ ඉඩක් නොතිබිනි. එහෙත් 1978 සිදුවූ මෙම වෙනසත් සමග එතෙක් ගමනාගමන මණ්ඩලය සතුව තිබූ බස් ගාස්තු තීරණය කිරීමේ අයිතිය පෞද්ගලික බස් රථ හිමිකරුවන් වෙත පැවරිණි.



ඒ අනුව තමන්ට මුහුණපාන්නට සිදුවන ආර්ථික පීඩනයකදී එයට පිළිතුර ලෙස ඔවුන් එතැන් පටන් බස් ගාස්තු වැඩි කර ගැනීමට කටයුතු සිදුකරනු ලැබුවේ ඒවායේ ගමන් කරනු ලබන මගීන් සම්බන්ධයෙන් කිසිදු තක්සේරුවකින් නොවන බව ඉතා පැහැදිලිය. තම අයිතියට පවරාගත් බස් ගාස්තු වැඩි කිරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ඔවුන් විවිධාකාරයේ සැලසුම් ක්‍රියාත්මක කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2006 දී පමණ බස් ගාස්තු වැඩි කිරීමේ සූත්‍රගත ක්‍රියාවලියක් ගමනා ගමන මණ්ඩලය හරහා ක්‍රියාත්මක තලයට ගෙන එන්නට පෞද්ගලික බස් හිමියන්ට හැකිවිය. එහෙත් ලංගම සේවකයින්ගේ බලවත් විරෝධතාවයන් සහ එවැනි සූත්තරයක ඇති මහජන පීඩනය පෙන්වාදීමෙන් පසු එය ක්‍රියාත්මක තලයට නොගන්නට පාලකයින්ට සිදුවිය. නමුත් 2009 දී පමණ අක්‍රියව තිබූ එම සූත්තරය යළි සක්‍රිය කරන්නට වත්මන් රාජපක්ෂ පාලනය කටයුතු කරන ලදී. එතැන් පටන් තෙල් මිල වැඩිවීමට සාපේක්ෂව සෑම මොහොතකදීම වාර්ෂික ගණනය කිරීමකට යටත්ව බස් ගාස්තු වැඩි කිරීමේ ක්‍රමවේදයක් දියත් විය. එහෙත් 2012 පෙබරවාරි මාසයේදී ආණ්ඩුව 20% කින් පමණ වැඩි කරන ලද බස් ගාස්තු මෙකී සූත්‍රය අභියෝගයට ලක් කරන්නක් බව මේ වන විට තහවුරු වී තිබේ. ඉතිහාසයේ එක මොහොතක වැඩි කරන ලද විශාලතම බස් ගාස්තු ප්‍රතිශතය 2012 පෙබරවාරි මාසයේ වැඩි කරන ලද බස් ගාස්තුවයි. එය කිසිසේත්ම සාධාරණ නොවන බවත් එහි යුක්ති සහගත කමක් නොමැති බවත් සෘජුවම ආණ්ඩුවේ මූල්‍ය වුවමනාව තෘප්ත කර ගැනීම සඳහා පෞද්ගලික බස් හිමියන් සහ ආණ්ඩුව අතර ඇති කර ගත් එකඟතාවයක් අනුව ක්‍රියාත්මක වී ඇති බව මේ වන විට තහවුරු වී තිබේ.

මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී අනුර දිසානායක සහෝදරයා විසින් විශේෂ ප්‍රකාශයක් කරන ලද අතර එයට කිසිදු පිළිතුරක් ලබා නොදීමට පාලකයන් කටයුතු කර තිබේ. වත්මන් පාලනය ආර්ථික ක්‍රියාවලියේදී පෙන්වනු ලබන අසමත්කම කෙතෙක්ද යන්න මෙම ක්‍රියාවලියෙන්ද වඩ වඩාත් තහවුරු වේ. ඔවුන්ගේ ආර්ථික දැක්මේ ශූන්‍යභාවය හේතුවෙන් රට අති දැවැන්ත ආර්ථික අවපාතයකට ගොදුරු වී තිබේ. එය කොතරම්ද යත් අද වන විට ආණ්ඩුවේ පැවැත්ම තීරණය කරන එකම සාධකය බවට පත් වී ඇත්තේ ජනතාවගෙන් ගනු ලබන බදු ආදායමයි. රටෙහි සමස්ත ආදායමෙන් 90% කට ආසන්න ප්‍රමාණයක් මෙලෙස ජනතාවගේ බදු මුදල්වලින් පියවා ගැනීමට කටයුතු කිරීම විසින්ම තහවුරු වන්නේ ආණ්ඩුවේ ආර්ථික දැක්මේ ඇති දුබලතාවය මිස අන් යමක් නොවේ. ඒ නිසාම ආණ්ඩුව දැන් සිදුකරනු ලබන්නේ කුමන හෝ ආකාරයකින් කුමක් හෝ යොදා ගනිමින් උපයා ගත හැකි ඕනෑම මුදලක් උපයා ගැනීමට කටයුතු කිරීමටයි. එය දවස ගෙවා ගැනීමේ හිඟන්නන්ගේ සම්ප්‍රදාය මිස ප්‍රතිපත්ති මත පදනම්ව ඉදිරි දැක්මට අනුව කටයුතු කරනු ලබන පාලකයින්ගේ ප්‍රතිපත්තියක් නොවේ. ඒ අනුව බස් ගාස්තු වැඩි කිරීම සඳහා ආණ්ඩුව ප්‍රකාශයට පත් කර ඇත්තේ තමන් මුහුණ දී ඇති ආර්ථික අර්බුදයේ ගැඹුරයි. එය සැලකිල්ලට ලක් කරන්නේ නම් ආණ්ඩුවට ඔවුන්ගේ ආර්ථික ක්‍රියාවලියේ ඇති අසමත්කම් වටහා ගැනීමට හැකියාවක් තිබේ. එහෙත් ලාභය මත පමණක් සියල්ල තීරණය කරන ධනේශ්වර ආර්ථික ක්‍රමයක නායකයින්ට එවැනි වුවමනාවක් හෝ දැක්මක් නොතිබීම පුදුමය දනවන කරුණක් නොවේ. ඔවුන් හැම විටම උත්සාහ දරන්නේ කරනු ලබන කුමන හෝ කාර්යයකින් ලබා ගත හැකි ඉහළම ලාභය කොතරම්ද යන්න ගණන් බැලීමටයි. ඒ අනුව තහවුරු වන්නේ ආණ්ඩුව බස් ගාස්තු වැඩි කිරීම හරහා තමන්ගේ ආර්ථික උපාය මාර්ගික ක්‍රියාවලිය ඉතා සරල ඉපයීම් මාර්ගවලින් පවා තෘප්ත කර ගැනීමට මාන බලන බවයි. මේ තත්වය වඩාත් පුළුල්ව වටහා ගැනීමේ වගකීමක් අපේ රටේ පොදු ජනතාවට තිබෙන බව ඉතා පැහැදිලිය. එය වටහා ගැනීම සඳහා වන භෞතික පරිසරයේ සහයෝගය ලබා ගැනීම මෙන්ම ලබා දීමත් අතිශයින් වැදගත් වේ. දැන් අප මුහුණ දෙමින් සිටින්නේ එවැනි සංකීර්ණ වටපිටාවකටය. එහෙත් එකී සංකීර්ණතාවය ඉතා ඉක්මණින් සමනය වනු ඇත්තේ ජනතාව එයට අදාලව දක්වනු ලබන ප්‍රතිචාරවල කාලය අනුවය.



පීඩනයට එරෙහිව නැගී සිටීමේ අයිතියක් ඔබට ඇත. එම අයිතිය පාවිච්චි කිරීමට ඔබට ශක්තියක් නොමැතිනම් ඔබ කළ යුතු වන්නේ ඔබ වෙනුවෙන් එම අයිතිය යොදාගන්නවුන්ට බාධා නොවන සේ කටයුතු කිරීමයි. ඔබ එසේ කරන්නේ නම් එමගින් පමණක් වුව ඔබ, ඔබගේ අයිතිය දිනා ගැනීමට දායක වූවෙක් වනු ඇත.

**ඇමරිකානු ජාතික**
**එල්වියා කරයිලෝ ප්‍රයටෝ**

# බස් ගාස්තු වැඩි කිරීම නීති විරෝධියි

## අනුර දිසානායක සහෝදරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරයි



ඉන්ධන මිල අධික ලෙස ඉහළ දැමීම හේතුකොට ගෙන බස් ගාස්තු ඉහළ දැමීම පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

වාර්ෂිකව බස් ගාස්තු සංශෝධනය කිරීම පිළිබඳව හා පෞද්ගලික මෙන්ම රාජ්‍ය ප්‍රවාහන සේවා ඒකාබද්ධව පවත්වාගෙන යාම වෙනුවෙන් 2002 වසරේදී ජූනි මස 12 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 02/0942/104/049 (1) මගින් අනුමත කරන ලද බස් ගාස්තු ප්‍රතිපත්තිය 2002 වසරේ ජූලි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලදී. එම ප්‍රතිපත්තියට අනුව සෑම වර්ෂයකම බස් ගාස්තු වාර්ෂිකව ප්‍රතිසංශෝධනය ජූලි මස 01 වන දා වන විට ප්‍රකාශයට පත් කළ යුතුව ඇත. ප්‍රතිශෝධන අතර වාර්ෂිකව කාලයේ ප්‍රථම මාස 09 තුළ ඩිසල් මිල සීග්‍රයෙන් වැඩි වුවහොත් එනම් සමස්ත පිරිවැය සූචිය 4% ක ප්‍රමාණයකින් වැඩි වුවහොත් නැවත මිල සංශෝධනයකට අවසරය ලැබේ. ඒ අනුව මීට පෙර ඩීසල් ලීටරයක් රුපියල් 08 කින් සහ 2012 පෙබ. මස 12 වන දින ඩීසල් ලීටරයක් රු. 31.00 කින් ඉහළ යාම හේතුකොට ගෙන බස් ගාස්තු සංශෝධනයට අවස්ථාවක් උදාවිය. එහෙත් රජය පුන පුනා ප්‍රකාශ කරනු ලැබුවේ බස් ගාස්තු ඉහළ දැමීම අවශ්‍ය නොවන බවත් ඒ හේතුවෙන් බස් රථ හිමියන් සඳහා ඉන්ධන සහනාධාරයක් ලබා දෙන බවත්ය. නමුත් ඉන්ධන මිල වැඩිකොට එක් දිනයක් ගතවීමට මත්තෙන් ආණ්ඩුවේ සියලු පුරාජේරු සහනාධාර කථා ජනතාව රැවටීමේ ප්‍රෝඩාවක් බවට පත්කොට බස් ගාස්තු මෑත ඉතිහාසයේ ඉහළම අගයක් වන 20% කින් පමණ ඉහළ දමන ලදී. ආණ්ඩුව විසින් මෙම ගාස්තු ඉහළ දැමීම පිළිඳව ප්‍රකාශ කරනු ලැබුවේ එය ජාතික බස් ගාස්තු සංශෝධන ප්‍රකතිපත්තියට අනුකූල බවයි. නමුත් මෙම බස් ගාස්තු ඉහළ දැමීම එම ප්‍රතිපත්තිය මුළුමනින්ම උල්ලංඝනය කොට ජනතාව වෙත අති විශාල පීඩනයක් ඇති කොට තිබේ. මෙම මිල ඉහළ දැමීමේ ක්‍රමවේදය වැරදි බව පහත සඳහන් කරුණුවලින් සනාථ වේ. එහෙයින් මෙම කරුණු පිළිබඳව මෙම පාර්ලිමේන්තුවට ගරු පෞද්ගලික ප්‍රවාහන අමාත්‍යවරයා විසින් කරුණු පැහැදිලි කළ යුතුව ඇත.

**01. බස් ගාස්තු ඉහළ දැමීමේ ප්‍රතිශතය 20% ක් වූයේ කෙසේද?**
2002 අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද බස් ගාස්තු ප්‍රතිපත්තිය අනුව මෙවර බස් ගාස්තු වැඩි කිරීමේ ප්‍රතිශතය සකස් කළ යුතු වන්නේ ඩීසල් මිල වැඩි කිරීමෙන් බස් ගාස්තුව කෙරෙහි කරනු ලබන ආංශික බලපෑම මතය. එනම් බස් ගාස්තු වැඩි කිරීමේ ප්‍රතිපත්තිය අනුව ඩීසල් මිල වැඩි වූ අවස්ථා දෙකම එකතු කළ විට ඩීසල් වැඩි වූ ප්‍රතිශතය වන්නේ 51% කි. ඩීසල් මිල වැඩි වී තිබෙන්නේ 51% කිනි. ඊට අනුරූපිවයි බස් ගාස්තු සංශෝධනය කළ යුතු වන්නේ. ඒ අනුව මුළු ගාස්තුව වැඩි කළ යුතුව වන්නේ 15.8% කින්. ඇමතිතුමා ලඟ ඇති ලේඛණයේ තිබෙන්නේ 16.3ක් ලෙස සඳහන්ව නොවේ. එය 20% කින් වැඩි කොට තිබෙනවා. මෙසේ 15.8% කින් වැඩි කළ යුතු බස් ගාස්තු 20% කින් වැඩි වූයේ කෙසේද? බස් ගාස්තු සංශෝධනය කිරීමේ ප්‍රතිපත්තිය 16 වන පිටුවේ 8 වන වගන්තිය මුළුමනින්ම උල්ලංඝනය කරමින් මෙම 20% ක බස් ගාස්තු ඉහළ දැමීම සිදුකොට තිබෙනවා.

**02. අවම ගාස්තුව රු. 7 සිට 9 දක්වා වැඩිවූයේ කෙසේද?**
බස් ගාස්තු සංශෝධනයේදී සෑම විටම ආසන්න රුපියලේ අගයට වැටයීමක් කරනු ලබයි. එහෙත් නැවත සංශෝධනයකදී පාදක කරගනු ලබන්නේ වැටයීමට ලක්කොට ලබාගත් අගය නොව සැබෑ අගයයි. ඒ අනුව 2011 ජූලි මාසයේදී සිදුවූ සංශෝධනයේදී අවම ගාස්තුව වූයේ රු. 6.88 කි. ඒ නිසා මෙවර වැඩිවීම ගණනය කළ යුතු වන්නේ රු.6.88 මත පදනම්වය. ආණ්ඩුව වැරදි ලෙස වැඩි කරන ලද 20% අගයට අනුව වැඩි කළද අවම ගාස්තුව වන්නේ රු. 8.25 කි. ඒ අනුව අවම ගාස්තුව ආසන්න අගයට ගණනය කරන විට රු. 8.00 කි. නමුත් ආණ්ඩුව විසින් අවම ගාස්තුව රු. 9.00 දක්වා වැඩිකොට තිබේ. එබැවින් මෙම ගාස්තුව වැඩි කිරීම ප්‍රතිශතය 30% ඉක්මවනු ලබයි. එය මුළුමනින්ම කැබිනට් මණ්ඩලය අනුමත කළ බස් ගාස්තු සංශෝධන ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කිරීමකි. එමෙන්ම සත්‍ය වැඩිවීම වන 15.8% න් ගණන් බැලූ විට විය යුත්තේ 7.96 කි. ඒ අනුව ඇත්ත ගණන විය යුත්තේ රුපියල් 7.96 කි. ආසන්න රුපියලට වටයන විට එහි අගය විය යුත්තේ රු. 8 කි. මෙසේ නව ගාස්තු සකස් කිරීමේදී අවස්ථා ගණනාවක නියමිත ගාස්තුවට වඩා අමතර ගාස්තුවක් එකතු කොට ඇත. අවස්ථා 350 කට පමණ සාමාන්‍ය බස් ගාස්තු ගණනය කර තිබෙනවා. මෙම 350 තුළ ස්ථාන 75 කම නියමිත තැනට වඩා වැඩියෙන් රුපියල, රු. 2, රු. 3, සමහර තැන්වල රු. 9 දක්වා වැඩිපුර අයකර ගැනීමක් තමුන්වහන්සේලා විසින් සිදුකොට තිබෙනවා.

**03. මෙම බස් ගාස්තු සංශෝධනයේදී බස් ගාස්තු පිරිවැය දර්ශකය සකස් කරන ලද්දේ කෙසේද?**
බස් ගාස්තු වැඩිකිරීමට පෙර පිරිවැය දර්ශකය සකස් කොට එය ප්‍රකාශයට පත් කළ යුතු වුවද මෙම සංශෝධනයේදී එවැනි පිරිවැය දර්ශකයක් සකස් කොට නැත.

**04. වාර්ෂිකව ජූලි මාසයේ 01**


2 වැනි පිටුවට

# භාවිතයෙන් වීරත්වය පෙන්වූ අප්‍රේල් අරගලය

විප්ලවාදී පක්ෂයකට අතිත අරගල තුළින් ඉගෙන ගත යුතු පාඩම් බොහෝමයකි. සමාජවාදි කාන්තා සංගමයේ ආරම්භය හා ගමන් මාර්ගය පිළිබඳ ආපසු හැරී බැලීමේදී 1971 අප්‍රේල් අරගලයේ අත්දැකීම්, පක්ෂයට මෙන්ම සමාජවාදී කාන්තා සංගමයටද වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරන අවස්ථාවකි. 1971 අරගලය තුළ සහෝදරියන්ගේ විවිධ කැපවීම් හා ආදර්ශ සමාජවාදී කාන්තා සංගමය සංවිධානාත්මකව වැඩ කිරීමට, බලපෑම් කළ අයුරු විග්‍රහකළ බැලීම, 41 වෙනි අප්‍රේල් සමරුව තුළින් මතු කර ගැනිම අද දින අවශ්‍යම වැදගත් කාර්යකි. මේ කරුණු විග්‍රහ කර බැලීමේදී වමේ ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයන් ආවර්ජනය කිරීමට සිදුවේ.

ලාංකේය ඉතිහාසය තුළ දේශපාලන කටයුතු පිළිබඳ විග්‍රහකර ගැනීම්වලදී වමේ ව්‍යාපාරය තුළ කැපීපෙනන කාන්තා චරිත කිහිපයක් පිළිබඳව අසන්නට ලැබෙයි. එම කාන්තා චරිත බහුතරයක් පොදු සමාජ සංවර්ධනයේ ප්‍රගමනය පිළිබඳව පූර්ණ අවබෝධයක් දේශපාලනයේ යෙදි සිටියත් ඔවුනට නොතිබිණි. තම සැමියා හෝ පියා එසේ නැත්නම් පවුලේ අර්බුද හා මැදිහත් වීමේදී ගැටලුවලට විසඳුම් සඳහා දේශපාලනයට පිවිසිමක් පමණක් දක්නට ලැබිණි. සමාජ ප්‍රතිසංස්කරණවලට කොටු නොවී සමාජ වෙනස් කිරිම අරමුණ කරගත් කාන්තා ක්‍රියාකාරිත්වයක් මතු වන්නේ, විප්ලවාදි ව්‍යාපාරයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ බිහිවීමෙන් පසුවයි. 1965 ජනතා විමුක්ති පෙරමුණ බිහිවෙන විට ඍජු ලෙස පක්ෂයට කාන්තා දායකත්වයක් නොදැක්වුවත් 1970 කාලය වන විට සුළු වශයෙන් දායකවූ කාන්තාවන් පසුව සියලුම පසුගාමී ආකල්ප වෙනස් කරමින් ඍජු ලෙස මැදිහත් වීමක් දක්නට ලැබුණා. ගම්බදව කෘෂි ආර්ථිකව තුළ ජීවත් වු ජනතාව එදා පාලකයින් ජනතාවගේ අවශ්‍යතා යටකරමින්, සීමා කරමින් ගෙනගිය අත්තනෝමතික පාලනය නිසා පිඩීතයින් පාලකයින්ට එරෙහිව අමන්ත්‍රණය කරන දිශානතියකට නැඹුරුවීමක් දක්නට ලැබුණා. එමෙන්ම නාගරික, අර්ධ නාගරික, ප්‍රදේශවල තරුණිය විශ්වවිද්‍යාල තුළ උසස් අධ්‍යාපනය ලබමින් චින්තන විප්ලයක්ද ඇති කර ගත්තා. එකතැන පල්වෙන ආර්ථික ගැටලු සඳහා ඇය දැක්කේ පාලකයින් අතර බලය හුවමාරු වීම පමණයි. සමාජය වෙනස් කර ඇත්තේ වෙනස් කළ හැක්කේ අලුත් දේශපාලන ක්‍රියාකාරිත්වයකට බව ඇයට පසක් වීමට වැඩි කාලයක් ගතවුයේ නැත.

මේ වන විට සමාජ සුභසාධනය තුළ, සමාජ ප්‍රතිසංස්කරණය තුළ මධ්‍යම පංතික කාන්තාවන්ගේ බලපෑමට ලාංකේය කාන්තාව ග්‍රහණයට ගෙන තිබුණත් පීඩිත පංතිය සමග එකතු වී තම අයිතින් දිනා ගැනිමට ඔවුන් පීඩිත පංතියට ගැට ගැසුණා. වැඩකරන කාන්තාව, දුක් විදින කාන්තව, සුළු ධනපති පංතියේ කාන්තාව, ප්‍රථම වතාවට පංති සමාජ මාවතකට පැමිණ අලුත් දේශපාලනයක් ආරම්භ කිරිමට පටන් ගත්තා. ලෝකයේ සමහර කාන්තා ව්‍යාපාර පුරුෂ විරෝධයක් මතු කරමින් ස්ත්‍රීවාදී සංවිධාන සමාජගත වීමට පටන් ගත්තා. ලාංකේය කාන්තාව එවැනි ස්ත්‍රීවාදි සංවිධාන තුළ ගොනු කර ගනිමින් ප්‍රතිසංස්කරණ හා වැරදි දේශපාලන මත තහවුරු කරමින් සිටින වටපිටවක් තුළ ද සැබෑ කාන්තා ව්‍යාපාරයක් ඇති කර ගැනිමේ අවශ්‍යතාවය විප්ලවාදී පක්ෂයක් තුළ සිටින සහෝදරියන්ට නැවුම් කාර්යභාරයක් වුණා. සමාජ සංවර්ධනයේ ප්‍රධාන කොටසකට මග කියන කාන්තාව පංති බිහිවීම තුළ විවිධ ලෙස පාලකයින් විසින් පිඩාවට පත් කරන අයුරු අත්දැකීම් තුළින් ඉගෙනගත් ඇය කාන්තාව අගයන යහපත් සාධාරණ සමාජයක් බිහි කර ගැනීමේ අරමුණෙන් න්‍යායිකව හෝ මතවාදී ක්ෂේත්‍රයේ පමණක් නොවන භාවිතාව තුළද ක්‍රියාකාරී වීමත් ක්‍රමයෙන් දක්නට ලැබිණි.



ප්‍රේමවතී මනම්පේරි

ධනපති පංතිය පැරණි වමේ ව්‍යාපාරය තම අභිමතයට තනතුර ගැනිමට වරදන හා වරප්‍රසාදය ලබා දිමට කටයුතු කරමින් කම්කරු පංතිය පාවාදෙමින් 1956 ජනතා අරගලය, 1961 ඉල්ලීම් හා වෙනත් අරගලද ජනතාවගේ හැඟීම්ද, පාවාදිමේ ඉතිහාසය තුළ කම්කරුවන් හා පීඩිත ජනතාව තුළද වමේ ව්‍යාපාරයේ නායකත්වය කෙරෙහි පැවතුණේ දැඩි අප්‍රසාදයකි. සමාජ අසාධරණකම් නිසා ධනපති පංතියට එරෙහිව අවිගත් පීඩිත පංතියේ නැගිටීමක් සිදුවන්නේ ලංකාවේ ප්‍රථම වතාවට 1971 වර්ෂයෙදීය. පීඩිත පංතියට විමුක්තිය දිනා ගැනිමේ අරමුණින් එදා අපේ ආදරණීය සහෝදර සහෝදරියන් දසදහසක් පමණ ජීවිත පූජා කළා. තවත් 20,000 පමණ පිරිසක් සිරගෙවල්වල විවිධ පීඩා හා වධහිංසාවලට ලක්විය. මේ කාලය වන විටත් කාන්තාව වගකීම් හා ක්‍රියාකාරිත්වය තුළ එදා සමාජය ඉරි ගසමින් වෙන් කර තැබීමට උත්සහා කෙරිණි. ඇයගේ දෑත් සියුමැලිය. ඇයට නිවස යන වපසරිය පමණක් හිමිය. එය වෙනස් කරමින් විප්ලවවාදී පක්ෂයක් තුළ ධනපති පංතිය පරාජය කිරිමේ අරමුණින් ලංකාවේ ප්‍රථම වතාවට අවිගත් පීඩිත පංතිය සමග අවිගත් කාන්තාවන් දක්නට ලැබුණේ ජනතා විමුක්ති පෙරමුණ තුළයි. එය වෙන කිසිවක් නිසා නොව, මානව සංහතියේ අලුත් ලෝකය ගොඩනැගීමේ කාර්යභාරය ඉටු කිරීමටය.

තම පංතියේ සහෝදරවරුන් සමග උරෙන් උර ගැටෙමින් සටන් කිරිමට කාන්තාවක් වීම ඇයට කිසිදු බාධාවක් වුයේ නැත. 1971 අරගල තුළ විවිධ සංවිධාන වගකීම් දරමින් අවිගත් සහෝදරියන්ගේ කැපවීම විප්ලවාදී කාන්තා ව්‍යාපාරයක් ගොඩනැගිම එක් සංධිස්ථානයක් වුණා. විටක ඇය සටනෙන් මිය ගියේ සතුරාට අමතක නොවන පාඩමක් කියාදෙමිනි. තවත් විටක ඇය සතුරාට අදහාගත නොහැකි ආදර්ශ හා ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. මහා වනය මැද කුසට ආහරක් නොමැතිව සතා සිවුපාවුන් මැද නොබිව නොසැලි ඉදිරියට ගියේ සැබෑ ජයග්‍රහණයක් මුළු මානව සංහතියටම අත්පත් කර දීමේ දැඩි අධිෂ්ඨානයකිනි. දෙමාපියන්ගේ තුරුලේ සිටින විට ඝන අඳුරට බියවී ඉකි ගසන ඇය සටන තුළ මුළු වනයම ගුගුරුවමින් දැතින් අවි දරමින් පෙරමුණේ ගමන් කිරිමටද ඇය අධිෂ්ඨාන කර ගත්තා. එවැනි වීර පරපුරේ සහෝදරියන්ගේ නම් මතකයට නැගෙන විට එදා අරගලය තුළ දිවිපිදූ සහෝදරියන්ගේ වීරත්වය අදත් අප හදවත් තුළ රැව් පිළිරැව් දෙන්නේ අලුත් ධෛර්යක් හදවතට එක් කරමිනි. කතරගම ප්‍රදේශයේ අවුරුදු කුමරියක් ලෙස අභිෂේක ලත් ප්‍රේමවතී මන්පේරි තරුණිය එදා දෙමාපියන්ගේ ආදරය හා සෙනෙහස ලබමින්ද ගම තුළ කීර්තියට පත්වෙමින් ද සිටියාය. සමාජයේ ඇති විවිධ අසාධාරණයන් හා පීඩාවන් ගමේ සිටී ඇගේ දෙනතට ඇසිමට දැකිමටත් ලැබිණි. ඇය මෙම අසාධාරණකම්වලින් ගමේ බහුතරයක් පීඩාවිඳින බවත් එය වෙනස් කිරීමට පවතින පාලකයින්ට නොහැකි බවත් වැඩිකල් නොගොස් ඇයම තහවුරු කර ගත්තා. පංතියක් ලෙස නොබිව සංවිධානය වෙන ජනතා විමුක්ති පෙරමුණත් සමග වැඩකටයුතු කිරිමට ඇය තීරණය කළාය. මෙම සමාජ අසාධාරණයන් මුලුමනින්ම වෙනස් කර සාධාරණ සමාජයක් ගොඩනැගිමට ඇය තුළ සිදු වූ චින්තන විප්ලවය පිටුවහලක් විය. එදා පැවති පාලකයින් හා කුරිරු අදම හමුදාව විසින් ඇය සියලුම වධ හිංසාවලට ලක්කරමින් වෙඩිතබා ඝාතනය කළේ සාහසික ලෙසටය. මන්ම්ප්‍රේරි සහෝදරිය මිය ගියේ නැත. පීඩිත පංතියේ සියදහස් ගණන් සහෝදරියන්ගේ සිත්සතන් තුළ අදත් හෙටත් ඇය ජීවත් වෙයි. අවි දරමින් මහා වනය මැද සහෝදවරුන් සමග වීරත්වයෙන් මිය ගිය චූටි නංගි ඇතුලු දහස් ගණන් සහෝදරියන් ද අප සිත්තුළ ජීවමාන වී ඇත්තේ, ඔවුන්ගේ උදාර අරමුණ හා අධිෂ්ඨානය නිසාය. සියුමැලි දෑතට කටෝර අවි ගනිමින් සතුරා සමග පොරබදමින් තම ජීවිතය ද පංතිය වෙනුවෙන් පුජා කර ඇය මතකයට නැගෙන විට හදවතේ නැගෙන සෝ සුසුම් හා කඳුළු ගංගා පිටාර ගැලීමට සුදානම් වුවත් විරු සහෝදරියන් අභියස කම්පා නොවීමට අපි අධිෂ්ඨාන කරගනිමු. ඒ අඳුරු වේදනාව හදවතේ තුරුලු කරගෙන ඔහුන් පැතු ලෝකය දිනා ගැනිමට දහසදහස් ගණන් කාන්තාවන් පෙරටු කරගෙන ධෛර්යෙන් නැගි සිටිමු.

අප්‍රේල් අරගලය තුළින් මතු වු සහෝදරියන්ගේ නිර්ධන පංති මතවාදි හා ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය නිසාම සමාජවාදී කාන්තා සංගමය සංවිධානත්මකව වැඩ කිරීමට පටන් ගත්තේය. දහස් ගණන් ගොවිපොළේ කාන්තාවෝද නිවස තුළ සිටි කාන්තාවෝද උගත් කාන්තාවෝද ජනතා විමුක්ති පෙරමුණේ කාන්තා සංගමය සමග ඒකාබද්ධ වී වැඩ කටයුතු කිරිමට පෙළගැසුණහ. ඒ නිසාම 1982 වන විට සමාජවාදී කාන්තා සංගමයේ ජාතික සමුළුව සාර්ථකව සුගතදාස ක්‍රීඩාංගණය තුළ පැවැත්වීමට හැකි විය. සියලු අභියෝග ජයග්‍රහණ කරමින් පෙරට ආ සමාජවාදී කාන්තා සංගමය රටත් පංතියත් වැටී ඇති තත්වයන් නිවැරදිව වටහාගෙන අධිෂ්ඨානයෙන් යුතුව සංවිධානය වීමට පියවර ගනිමින් සිටියි. එදා 1971 ධනපති පංතියේ කෲරත්වයට වඩා වැඩි මර්දනයක් නිර්ධන පංතිය වෙත අද මුදාහරිමින් සිටිනවා. කාන්තා හිංසනය හා මිනීමැරිම් ද වර්ධනය වී තියෙනවා. කුඩා දැරියන් දූෂණය කර මරා දමන අපරාධකාරන්ට රැකවරණය ලබා දිමට පාලකයින් කටයුතු කරමින් සිටිනවා. රටේ ස්වෛරීත්වය අධිරාජ්‍යවාදීන්ට පාවා දීමට පාලකයින් තව පැත්තකින් කටයුතු කරමින් සිටිනවා. හිතුවක්කාරී අධිරාජයය ගැති පාලකයින් හා ධනපති පංතියත් එක්මිටකට ගෙන පරාජය කිරීමට වහා වහා කටයුතු පෙළ ගැසෙමින් තිබෙන යුගයක අප්‍රේල් විරුවන්ගේ කැපවීමත් අධිෂ්ඨානයත් ධෛර්යයත් පැතුමත් පෙරටු කරගෙන සමාජය වෙනස් කිරීම සඳහා අවි මුවහත් කළ යුතු වෙනවා. ඒ සඳහා සහෝදරිය ඔබ මතවාදි මෙන්ම භාවිතය තුළද ක්‍රියාකාරී වීම, පෙරට එම වැදගත් වෙනවා. එවිටයි අප්‍රේල් විරුවන්ට සාධාරණයක් ඉටුකළ හැක්කේ.

## සමාජවාදී කාන්තා සංගමයේ සමුළුව අති සාර්ථකයි




සමාජවාදී කාන්තා සංගමයේ 3වැනි ජාතික මහා සමුළුව කොළඹ ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී 2012.03.08 වන දින සියලුම ප්‍රතිගාමීත්වයන් පරාජය කරමින් අභිමානවත් ලෙස පැවැත්විණි. විවිධ අවලාද හා කුමන්ත්‍රණ දියත් කරමින් ජනතා විමුක්ති පෙරමුණත් සමාජවාදී කාන්තා සංගමයත් අපකීර්තියට පත් කිරීමට උත්සහා කළ ඇතැම් අඳබාල කුමන්ත්‍රණකාරීන්ගේ සියලු උත්සාහයන් පරාජය කර සමාජවාදී කාන්තා සංගමයේ අති විශාල සහෝදරියන් ප්‍රමාණයක සහභාගිත්වයක් සහිතව ජයග්‍රාහී ලෙස 3වැනි ජාතික මහ සමුළුවේ රතු ධජ ඉහළින්ම රැව් පිළිරැව් දුණි.

උතුරු නැගෙනහිර පළාත්වල සහෝදරියන් ඇතුළු රටේ සියලුම දිස්ත්‍රික්කවල සහභාගිත්වයෙන් පැවති සමුළුවේ නව ජාතික කමිටු සාමාජිකාවන් තෝරා පත් කරගැනීම හා නව ජාතික සංවිධායිකාව පත් කරගැනීම මෙහි ප්‍රධාන කටයුත්තක් වූ අතර යුක්ති ගරුක දේශයක්, සාධාරණ සමාජයක් උදෙසා සටන් වැදීමට සමත් කාන්තාවක් නිර්මාණය කර ගැනීම සඳහා විශේෂ දේශපාලන යෝජනා 3ක් ද සමුළුවේදී සම්මත කරන ලදී. 3වැනි ජාතික මහ සමුළුව විසින් තෝරා ගත් කමිටු සාමාජිකාවන් හා දේශපාලන යෝජනා පහත දැක්වේ.

**ජාතික කමිටුව**

1. සමන්මලී ගුණසිංහ - ජාතික සංවිධායිකා
2. ශ්‍රීයානි මධු ගල්ල
3. සුභානි පතිරණ
4. චන්ද්‍රමාලී පෙරේරා
5. ශ්‍රීයා කනේගල
6. සෙල්වි ක්‍රිෂ්ණන්
7. චාන්දනී කරුණාතිලක
8. සුරේකා කුමාරී දිසානායක

**දේශපාලන යෝජනා**

1. වත්මන් ආණ්ඩුව
ජනතා ද්‍රෝහී ඒකාධිපති ගමනක් යමින් සිටි. රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් අමු අමුවේ උදුරා ගනිමින් සිටී. මානව අයිතීන් අහෝසි කරමින් සිටී. යුද්ධයෙන් අසරණ වූ ජනතාවගේ ගැටලු විසඳා සිවිල් පරිපාලනය ස්ථාපිත කිරීමට නොහැකි වූ ආණ්ඩුව ජාතික සමගිය වෙනුවට බෙදුම්වාදයට නැවතත් ඉඩ සැලසමින් සිටී. එබැවින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කිරීමටත් ජාතික සමගිය ගොඩනැගීමටත් උතුරේත් දකුණේත් සිංහල, දමිළ, මුස්ලිම් සහෝදරියන් පෙරමුණ ගෙන සටන්වැදීමට පෙරට එන ලෙසට සමාජවාදී කාන්තා සංගමය 3වන ජාතික මහ සමුළුව යෝජනා කර සිටී.
2. අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාවට අනුව වැඩකරන රාජපක්ෂ ආණ්ඩුව රටේ ජනතාවගේ සම්පත් උකස් තබමින් රටම ණය උගුලකට ඇද දමා ඇත. ආණ්ඩුවේ දූෂණ වංචා හා නාස්තිකාර වියදම් මෙන්ම බොරු සංදර්ශන වියදම්ද දැරීමට සිදුවී ඇත්තේ,' රටේ ජනතාවටය. පීඩාකාරී ලෙස බදු බර ජනතාව මත පටවමින් බඩු මිල ඉහළ දමමින්ද ජනතාව දිගින් දිගටම පීඩාවට පත් කරමින් සිටී. කුසට ආහරක් නොමැතිව අඬන දරුවෝත් ජීවන බර ඉසිලීමට නොහැකි මව්වරුන්ගේ විලාපයනුත් ඇසෙමින් පවතී. වේගයෙන් කඩා වැටෙන ධනවාදී ආර්ථිකයේ කෲර බව නිසා ජනතාවගේ ජීවිත දැඩි ලෙස පීඩාවට පත්වී තිබේ. විසඳුම් නොමැති ධනවාදී ආර්ථිකයත්, නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියත් පරාජය කර සමාජවාදය ගොඩ නැගීම වහා වහාම කළ යුතු කාලය පැමිණ ඇත. ඒ සඳහා වතුකරයේ සහෝදරිය ඔබත්, විදේශගත සේවය කරන ආදරණීය සහෝදරිය ඔබත්, රටේ විවිධ කර්මාන්තවල නියැලී ඇති රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශයේ සේවක සහෝදරිය ඔබත් නිවසේ වැඩි පැය ගණනක් වැඩකරන සහෝදරිය ඔබත්, ඔබ සියලු දෙනාමත් නව ලෝකය ගොඩනැගීමට පෙරමුණ ගත යුතු බවට 3වන ජාතික සමුළුව යෝජනා කරයි.
3. අධිරාජ්‍යවාදයෙන් බැටකන රටවල්වල ජනතාව එයට එරෙහිව සාධාරණ සමාජයක් දිනාගැනීමට පෙළ ගැසෙමින් සිටී. ලෝකයේ ධනවාදී ආර්ථිකයේ කෲරතම හා සමාජ ආකල්පවල නොදියුණු බව නිසා දෙයාකාරව කාන්තාව පීඩාවට පත්වී ඇත. මේ වන විට සමාජවාදයෙන් තොර කාන්තා විමුක්තිය ලැබිය නොහැකිය යන සටන්පාඨය අනුව යමින් ලෝකයේම කාන්තාව එකට එකතු වී අධිරාජ්‍යවාදය පැරදවීමට සංවිධාන ගතවෙමින් සිටී. එබැවින් ලාංකේය කාන්තාවද සමාජවාදී ලෝක කාන්තා එකතුව දිගුකල් දිනේවා යැයි කියා සුභ පතමින් වහා වහාම සමාජවාදී ලෝක කාන්තා සමඟ එකතු වී අධිරාජ්‍යවාදය පරාජය කිරීම සඳහා සටන් කිරීමට සුදානම් බව සමාජවාදී කාන්තා සංගමය 3වැනි ජාතික මහ සමුළුවට අවධාරණය කර යෝජනා කර සිටී.

Reflections of Fidel - සිංහල පරිවර්තනය

# ඉරානයට එරෙහි යුද්ධය; ඇමරිකානු ඉතිහාසයේ විශාලතම අත්වැරැද්ද



මේ ආවර්ජනය, වරදවා තේරුම් ගැනීවි යැයි කිසිදු අවදානමකින් තොරව අද, හෙට හෝ වෙනත් ඕනෑම දිනයක ලිවිය හැක්කකි. මනුෂ්‍ය සංහතිය නව අර්බුදයන්ට මුහුණ පා සිටී. රියෝ ඩි පරුනයිරෝහි පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේදී වසර 20කට පෙර මනුෂ්‍ය වර්ගයා වඳවී යාමේ අනතුරකට ලක්වී ඇති බව මම සඳහන් කළෙමි. වසර 100කට කල් ඇතුව මම දකිමින් සිටියා වූ ව්‍යසනයක් පිළිබඳ අනතුරු ඇඟවීමේදී මට තිබුණේ අදට වඩා අඩු හේතු ගණනකි. ඒ යුගයේදී ලෝකයේ වඩාත්ම බලවත් රටවල නායකයන් අතළොස්සක් ලෝකයේ ප්‍රධානීහු වී සිටියහ. මගේ කතාවට හුදු අනුග්‍රහයක් ලෙස ඔවුන් අත්පොළසන් නැගූ අතර නිහැඬියාව අපේ වර්ගයාගේ මිනීවල කැණීම දිගටම කරගෙන ගියේය.
අපේ පෘථිවිය මත සමානය දැනීම හා විධානය බලපවත්වන්නේ යැයි පෙනී යයි. මොහොතකට, තාක්ෂණයේ හා විද්‍යාවේ සහාය ලද ආර්ථික සංවර්ධනය මනුෂ්‍ය සමාජයේ සමස්තය ලෙස පෙනී යයි.
අද සියල්ල වඩා පැහැදිලිය. යැසුරු ෂත්‍යයන් මතුපිටට පැමිණෙමින් තිබේ. නිදහස යැයි විශ්වාස කෙරෙන රාජ්‍යයන් 200ක් පමණ ප්‍රමාණයක් න්‍යායාත්මක ලෝකයේ ඉරණම පාලනය කිරීමේ කර්තව්‍යය පැවරී ඇති දේශපාලන සංවිධානය පිහිටුවාගෙන තිබේ. මිතුරු හෝ සතුරු බලවේග අත පවතින ආසන්න වශයෙන් 25,000ක් වන න්‍යෂ්ටික අවි, ලාභය පතා හෝ අවශ්‍යතාව මත, වෙනස්වන ලෝක රටාව ආරක්ෂා කිරීම සඳහා සූදානම්ව ඇත. ඒ බැලූ බැල්මට බිලියන සංඛ්‍යාත ජනතාවගේ අයිතීන් බිංදුවට දමමිනි.
1945 අප්‍රේල් රූස්වෙල්ට්ගේ මරණයෙන් පසු 1945 අගෝස්තුවේදී ටෲමන්ගේ නියෝග අනුව හිරෝෂිමා හා නාගසාකිවලදී භයංකාර සමූල ඝාතනයෙන් සිදුව තිබියදී එවැනි ආකාරයේ අවි වර්ධනය කිරීම වෙනුවෙන් රුසියාවට හා චීනයට චෝදනා කිරීමට මම කුහක නොවෙමි.
එසේම නාසිවාදයේ ගොදුරු බවට පත්ව ප්‍රධාන වශයෙන් යුදෙව්, රුමේනියානු, රුසියානු හා වෙනත් ජාතිකත්වයෙන්ට අයත් ළමුන් හා වැඩිහිටියන්ගේ ගැහැනු හා පිරිමින්ගේ දශ ලක්ෂ සංඛ්‍යාත මරණයන් සටහන් කළ සමූල ඝාතනයන් ප්‍රතික්ෂේප කිරීමේ වරදටද මම නොවැටෙමි. ඒ, පලස්තීන ජනතාවගේ ජීවත්වීමේ අයිතිය ප්‍රතික්ෂේප කරන්න වූයේ පිළිකුල් සහගත පිළිවෙත්හි නොගැලපෙන ස්වභාවය නිසාය.
එක්සත් ජනපදයට, එය මුහුණ දී සිටින නොවැළැක්විය හැකි විනාශයෙන් තනිවම ගැලවීමට හැකියාවක් ඇත්දැයි කිසිවෙක් සිතයිද? සති කිහිපයක් තුළ තම මැතිවරණ ව්‍යාපාරයට අවශ්‍ය ඩොලර් මිලියන 40ක මුදල සොයා ගන්නා බවට ඔබාමා ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කිරීම, ඔහුගේ රටේ මුදල එහි වටිනාකම අහිමිකරගෙන ඇති බව ප්‍රදර්ශනය කරන්නක් පමණි.
එසේම එය, ඩොලර් ට්‍රිලියන 20කට ළඟා වෙමින් ඇති නොසිතූ විරූ රජය ණයක් හිමි එක්සත් ජනපදය එහි නිෂ්පාදනය විසින් උපදන මුදල් මත නොව නිකුත් කරන මුදල් මත ජීවත් වෙමින් සිටින බව පෙන්නුම් කරන්නක් පමණි. සෙසු ලෝකය ගෙවමින් ඇත්තේ ඔවුන් නාස්ති කරමින් සිටින දෙයටය.




ඩිමොක්‍රටික් අපේක්ෂකයා ඔහුගේ රිපබ්ලිකන් විරුද්ධවාදියාට (ඔහු මිට් රොම්නි හෝ රික් සන්තෝරම් වියහැක) වඩා හොඳ හෝ නරක යැයි කිසිවෙක් විශ්වාස නොකරති. ආලෝක වර්ෂයන් ඒබ්‍රහම් ලින්කන් හෝ මාටින් ලූතර් කිං ගෙන් මේ චරිත වෙන් කොට පෙන්වාලයි. තාක්ෂණික වශයෙන් මෙතරම් බලවත් ජාතියක් සහ මතවාදීමය හා සදාචාරමය වශයෙන් මෙතරම් වැහැරුණු ආණ්ඩුවක් නිරීක්ෂණය කිරීමට ලැබීම අතිශයින්ම සුවිශේෂී කරුණකි.
ඉරානය න්‍යෂ්ටික ආයුද නිපදවන්නේ නැත. එහි චෝදනාවට ලක්වන්නේ, බලශක්තිය නිපදවීම සඳහා වූ ඉන්ධනයක් ලෙස වෛද්‍යමය භාවිතය සඳහා වූ සංරචකයන් ලෙස යුරේනියම් පිරිපහදු කිරීම පිළිබඳවය. කැමැති වුවද අකැමැති වුවද එම නිෂ්පාදනය න්‍යෂ්ටික අවි තැනීම සඳහා ප්‍රමාණවත් නැත. රටවල් දුසිම් ගණනක් බලශක්ති ප්‍රභවයක් ලෙස පිරිපහදු කරන ලද යුරේනියම් භාවිත කරයි. එහෙත් පූර්ව සංකීර්ණ පිරිපහදු කිරීමේ ක්‍රියාවලියකින් තොරව න්‍යෂ්ටික අවියක් තැනීම සඳහා ඒවා යොදා ගත නොහැකිය.
කෙසේ වුවද එක්සත් ජනපදයේ උදව් හා සහයෝගය ඇතිව කිසිවකුට දැනුම්දීමකින් හෝ වගවීමකින් තොරව න්‍යෂ්ටික අවි සිය ගණනක් නිපදවූ ඊශ්‍රායලය ඒවා තමන් සතුව ඇතිබව පිළිගැනීමෙන් තොරව සිටියි. අසල්වැසි අරාබි රටවල පර්යේෂණ වර්ධනය වැළැක්වීම සඳහා එය සිරියාවේ හා ඉරාකයේ බලාගාරවලට පහරදී විනාශකර දැම්මේය. එසේම ඔවුන් විසින් ඉරානයේ න්‍යෂ්ටික ඉන්ධන නිෂ්පාදනාගාරවලට පහරදී විනාශ කිරීමේ තම අභිප්‍රායද ප්‍රකාශයට පත් කර ඇත.
ඊශ්‍රායලයේ නැටෝ සහයකයින් විසින් ඉරානයේ කැපී පෙනෙන විද්‍යාඥයින් ඝාතනය කිරීමේ ක්‍රියාවලිය විරුද්ධවාදීන්ගේ වෛරය හා පළිගැනීමේ මනෝභාවයන් කුළුගැන්වීමේ පුරුද්දක් වී තිබේ. ඊශ්‍රායල් ආණ්ඩුව ඉරානයේ යුරේනියම් පිරිපහදු බලාගාරයට පහරදීමේ තම අභිප්‍රාය විවෘතව කියා සිටිද්දී එක්සත් ජනපදයේ ආණ්ඩුව එම කටයුත්ත සඳහා අවශ්‍ය බෝම්බයක් නිෂ්පාදනය කිරීම සඳහා ඩොලර් මිලියන සිය ගණනක ආයෝජනයක් කර ඇත.
2012 මාර්තු 16 වැනි දින දයිකල් චොසුඩොවුස්කි හා ෆිනියන් කනින්හැම් ප්‍රකාශයට පත්කළ ලිපියකින් හෙළිදරව්වක් සිදුකර ඇත. ඉහළ පෙළේ එක්සත් ජනපද ගුවන් හමුදා ජෙනරාල්වරයෙක් ඉරානයට පහරදීම සඳහා විශාලතම සාම්ප්‍රදායික යුධ ශීර්ෂයක් රාත්තල් 30,000ක බංකර් පුපුරුවා හරින බෝම්බය සුදුසුම අවිය ලෙස විස්තර කළ බව එහි සඳහන්ය.
දැවැන්ත මාරක අවි පිළිබඳ මෙබඳු පුරසාරම් ප්‍රකාශ සිදු කෙරෙන්නේ, එක්සත් ජනපද ජනාධිපති බැරැක් ඔබාමා පර්සියානු ගල්ෆ් කලාපය යුද්ධයක් ඇතිවීම පිළිබඳ 'සැහැල්ලු අදහස්වලට' එරෙහිව අනතුරු අඟවමින් සිටියෙදීය. ''දැවැන්ත විනිවිදයාමේ යුද උපකරණය :ඵධඡ* - ඕිසඪැ ධරාබ්බජැ ඣැබැඵර්ඵදර සුදුසුම අවියයි'' මෙහෙයුම් පිළිබඳ නියෝජ්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානි ලුතිනන් හර්බට් කාලිසලේ වැඩිදුරටත් කියා සිටින්නේ, වොෂින්ටනයේ නියෝග අනුව ඉරානයට කෙරෙන ඕනෑම ප්‍රහාරයකදී එය පාවිච්චි කිරීමට ඉඩ ඇති බවය. 'සියලු බෝම්බවල මව :ඔයැ එදඑයැර දෆ 'කක ඊදපඹි* ලෙස හැඳින්වෙන ඵධඡ අවිය, එහි දැවැන්ත යුද ශීර්ෂය පුපුරා යාමට පෙර, වැර ගන්වන ලද කොන්ක්‍රීට් අඩි 200ක් විදගෙන යාමට සමත්ය. එය ඇමරිකානු අවි ගබඩාවේ ඇති විශාලතම සාම්ප්‍රදායික, න්‍යෂ්ටික නොවන අවිය යැයි විශ්වාස කෙරේ. උපක්‍රමික න්‍යෂ්ටික අවි හා අති විශාල සාම්ප්‍රදායික හතු ආකාරයේ වළාවන් නිර්මාණය වන බෝම්බ ඒකාබද්ධව පාවිච්චි කරමින් ඉරානයේ යටිතල පහසුකම් විශාල ලෙස විනාශ කිරීමටත් සාමාන්‍ය ජනතාව වැඩි ප්‍රමාණයකට තුවාල සිදු කිරීමටත් පෙන්ටගනය සැලැසුම් කරමින් සිටී. ''ඉරානයේ හා උතුරු කොරියාවේ භූගත න්‍යෂ්ටික පහසුකම් ඉලක්ක කරගත් බලවත් නව බෝම්බයක්'' ලෙස ඵධඡ අවිය විස්තර කෙරේ. දැවැන්ත බෝම්බය පුද්ගලයන් 11 දෙනෙකුගේ උරහිස්වලට වඩා පළල අතර දිගින් අඩි 20කි. මේ හමුදාමය වාග් කෝෂය භාවිත කිරීම පිළිබඳ මම පාඨකයන්ගෙන් සමාව අයදිමි.
මෙබඳු ගණන් බැලීම්වලට පදනම් කර ගන්නේ, ආගමික බැඳීමට හා අරගල සාම්ප්‍රදායකට ප්‍රසිද්ධ, දශ ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් හා ගැහැනුන්ගෙන් සමන්විත ඉරාන සටන්කාමීන් වෙඩිල්ලක් හෝ නොතබා යටත් වනු ඇති බවට වන සිතුවිල්ලය. පසුගිය සති තුනක කාලය තුළ ඉරාන ජාතිකයෝ එක්සත් ජනපද සෙබළුන් ඇෆ්ගනිස්ථානයේදී මරා දමන ලද්දවූවන්ගේ සිරුරු මතට මුත්‍රා කරනු, කුරානයේ පිටපත්වලට ගිනි තබනු, නිරායුධ පුරවැසියන් 15කට වැඩි ගණනක් මරා දමනු දකිමින් සිටියහ.
එක්සත් ජනපද හමුදා, කර්මාන්ත ශාලා මතට මීටර් 60ක සිමෙන්ති විනිවිද යා හැකි දැවැන්ත බෝම්බ හෙළන ආකාරය මවා ගන්න. එවැනි විනාශකාරීත්වයක් කිසිඳු සිතෙහි මවා ගැනීමට හෝ නොහැක. එවැනි පිළිවෙතක බරපතළභාවය අවබෝධ කර ගැනීම සඳහා තවත් වචන අවශ්‍ය නැත. මේ මාර්ග යේ යාමෙන් අපගේ වර්ගයා අනුකම්පා විරහිත ලෙස විනාශය කරා යොමු වෙනු ඇත. අපි එය තේරුම් ගැනීමට ඉගෙන නොගන්නේනම් අපි නොමැරී පැවතීමට ඉගෙන නොගනු ඇත. මා පිළිබඳව සැලකුවහොත්, එක්සත් ජනපදය තම ඉතිහාසයේ විශාලතම වැරැද්ද සිදු කිරීමටත් ලෝකය එතැනට ඇද දැමීමටත් යන බවට මගේ සිතෙහි කුඩා හෝ දෙගිඩියාවක් නැත.

**පිදෙල් කැස්ත්‍රෝ රූස්**
**2012 මාර්තු 21**



**උන්ගේ යුද්ධය හා**
**උන්ගේ සාමය**

දොඩවන කල පාලකයන්
සාමය ගැන
ජනයා වටහා ගන්නේ
යුද්ධයකට වැඩි කල්
නොයන වග...
ශාප කරන කල යුද්ධයට
පාලකයන්
යුද්දෙට මිනිසුන් අරගෙන
හමාර බව දැනගත යුතු...
සාමය උන්ගේ නැවතත් යුද
ගිනිසිළුවක් පමණායි.

**බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට්**

# පරාවළල්ලක් වූ ඇෆ්ගන් ඝාතන



පසුගිය 11 වැනිදා විදෙස් ජනමාධ්‍ය ඇෆ්ගනිස්ථානයේ කන්දහාර් ප්‍රාන්තයේ කුරුරු ඝාතනයක් වාර්තා කළා. ඒ, ළමුන් 9ක්ද ඇතුළුව නිරායුධ සිවිල් වැසියන් 16 දෙනෙක් ඇමරිකානු සෙබළෙකු විසින් මරා දමා ඇති බවයි. මේ සෙබළා 38 හැවිරිද මාණ්ඩලික සාජන් රොබට් බලෙස් ලෙස එක්සත් ජනපදය විසින් පසුව හෙළිදරව් කළ අතර ඔහු මානසික ගැටලු හේතුවෙන් ඇති වූ ව්‍යාකූලත්වය මත මෙම ඝාතන සිදුකර ඇති බවද සඳහන් කෙරුණා.
කෙසේ වුවද සිද්ධියෙන් දින 06කට පසුව ඔහුගේ අනන්‍යතාවය හෙළි කොට පැය 48ක් යාමටත් පෙර මෙම ඝාතන හුදු එක් සෙබළෙක් විසින් කරන ලද ඒවා නොවන බවත් මේ ලේ වැගිරීමට ඇමරිකානු සෙබළුන් කිහිපදෙනෙක් සම්බන්ධ බවත් ඝාතනයෙන් දිවි බේරා ගත්තවුන් පවසන බව වාර්තා වුයේ, ඇමරිකාව බලවත් අසීරුවට පත් කරමිනුයි. ඔහුට විවාහය සම්බන්ධ ප්‍රශ්න තිබූ බවටත් ඉරාකයේ සේවය කරද්දී මොළය තුවාල වී තිබූ බවටත් එහි පිපිරීමකදී කකුලේ කොටසක් අහිමි වී තිබූ බවටත් ඔහුගේ නිවස බැංකුවට සින්න වී ඇති බවටත් එක්සත් ජනපද හමුදා ආරංචි මාර්ග උපුටමින් මාධ්‍ය වාර්තා කර තිබුණා.
දැන් ඇමරිකාවට අවශ්‍ය වී ඇත්තේ, ඇෆ්ගනිස්ථානයේ සියලු යුද අපරාධ එක් එක් සෙබළුන්ගේ හිතුවක්කාරී මැර ක්‍රියා ලෙස චිත්‍රණය කර ඇමරිකාවේ යුදවාදයේ විරූපී මුහුණ ආවරණය කර ගැනීමටයි. මෙම නිශ්චිත රොබට් බෙලෙස් සෙබළාගේ පිටින් යැවීමට උත්සාහ කළද ඇමරිකානු ආණ්ඩුව ඔහු පිළිබඳව කියනු ලබන දේ අසත්‍යයක් බව මාධ්‍ය හෙළිදරව් කරනවා. ඔහුගේ පවුල් ජීවිතයේ බරපතළ ගැටලු නොතිබුණු බවත් මානසික ගැටලු ඇති වීමට තරම් ඔහුට බලපෑ තත්වයක් නොපැවති බවත් සඳහන්. විශේෂයෙන් 2005දී ඔහු මිලට ගත් නිවස ඩොලර් 50,000ක පාඩුවකට අලෙවි කිරීමට සිදුවීම මානසික අවුලක් නිර්මාණය කරයි නම් ඇමරිකානු වැඩකරන පංතියේ සහ මධ්‍යම පංතියේ නිවෙස් හිමියන් අති විශාල සංඛ්‍යාවකටද එම තත්වය ඇතිවිය යුතු බව පැවැසෙනවා.
එසේ නම් ඇෆ්ගනිස්ථානයේ කැළැල් මකන්නට එක්සත් ජනපද ආණ්ඩුව සෙබළාට නැගූ චෝදනාව පෙරළා ඇමරිකාවට පරාවළලල්ක් වී තිබෙනවා. එනම් ආර්ථික අර්බුදයේ ප්‍රතිඵල ඇෆ්ගන් පුරවැසියන්ගේ හිස් මතට එල්ලවන වෙඩි පහරවල් ලෙස පුපුරා යන බව හෝ තමන්ගේ අධිරාජ්‍යවාදී යුද භාවිතයේ ම්ලේච්ඡත්වය යන දෙකෙන් එකක් සත්‍යය යැයි පිළිගැනීමට එක්සත් ජනපදයට සිදුව තිබෙනවා. ඉන් කුමන කරුණ සත්‍ය යැයි පිළිගත්තද චෝදනාවෙන් මිදිය නොහැකි තරමට අධිරාජ්‍යවාදය අර්බුදයට ගොස් තිබීම ඉතිහාසයේ බලවත් සරදමක් වන බවට සැකයක් නැහැ.

කවුළුව හැරී තබමි

# එදා චේගුවේරා තමයි අද ඉන්නෙත්

අර්නස්ට්ටෝ චේ ගුවේරා යනු ලෝක ප්‍රකට ක්‍රිකට් ක්‍රීඩකයෙකු හෝ ගායකයෙකු හෝ නළුවෙකු හෝ නොවේ. චේ ගුවේරා යනු පවතින දූෂිත ධනපති ක්‍රමයට හා අධිරාජ්‍යවාදයට එරෙහිව අරගල කළ, අරගලයට නායකත්වය දුන් ජාත්‍යන්තරවාදී විප්ලවවාදියෙකි. චේ ගුවේරාගේ ක්‍රියාකාරිත්වය සැබැවින්ම දන්නා කියුබානු ජනතාව තම දරුවන්ට කියන්නේ 'පුතේ උඹත් චේ ගුවේරා කෙනෙක් වෙයං' යනුවෙනි. කියුබානු ජනතාව තම දරුවන් දෙස බලමින් එසේ ප්‍රර්ථනා කරන විට 70 දශකයේදී මෙරට ජනතාව ජනතා විමුක්ති පෙරමුණෙන් ඈත් කිරීම සඳහා ධනපති පාලකයින් විසින් ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීන් හැඳින්වූයේ චේ ගුවේරාකාරයින් ලෙසය. කියුබානු ජනතාව චේ ගුවේරා සිප වැළඳ ගන්නා විට මෙරට බොහෝ ජනතාව චේටත් චේ ගුවේරාකාරයින්ටත් අනියත බියක් දැක්වූහ. චේ ගුවේරා ධනපති පාලකයින්ට බිය ගෙන දුන් බව සැබෑය. එසේ වූයේ ඔහු තුළ දුක් විඳින ජනතාව සම්බන්ධයෙන් තිබූ අපරිමිත ආදරය, කරුණික බව සහ සහෝදරත්වය නිසාය.



ධනපති පාලකයින් චේ ගුවේරාට බය වූයේ, ඔහු ජනතාවට ආදරය කරන විප්ලවවාදියෙකු වු නිසාය. මෙරට ධනපති පාලකයින් කියන දේ පිළිගත් ජනතාව චේ සම්බන්දයෙන් අනියත බියක් නිර්මාණය කර ගනු ලැබුවේද ඔහු විප්ලවවාදියෙකු වූ නිසාය. විප්ලවවාදීයගේ එකම අරමුණ දුක්විඳින ජනතාවට සේවය කිරීම බව නොදන්නා නිසාය. මේ නිසා චේ ගුවේරාගේ නම පැවසීමට පවා බොහෝ අය මැළි වූහ.

කාලය දින, සති, මාස සහ අවුරුදු ලෙස ගෙවී ගොස් ඇත. එදා චේගේ නම පැවසීමට පවා බිය වු අය අද, චේගේ ඡායාරූප ත්‍රිරෝද රථවල සිත්තම කොට ඇත. තරුණ තරුණියන් ටී ෂර්ට් තෝරා ගැනීමේදී චේ රුව සහිත ටී ෂර්ට්ම තෝරා ගනිති. දේශපාලන විද්‍යා උපකාරක පංති ප්‍රචාරක දැන්වීම්වල චේගේ රුව යොදා ඇත.

එදා චේ ප්‍රතික්‍ෂෙ කරනු ලැබුවේත් අද ළංවී සිටින්නේත් ජාත්‍යන්තර විප්ලවවාදියෙකු ලෙස කිර්තියට පත් වූ නිසාය. ධනපති පාලකයින් දේශපාලනිකව චේ ප්‍රතික්‍ෂෙප කරන විට ජනතාව අදේශපාලනිකව චේ ප්‍රතික්‍ෂෙ කළේය. ඒ දෙකම සිදු වූයේ, චේ ගුවේරා මාක්ස් - ලෙනින්ගේ අඩි පාරේ ගිය විප්ලවවාදියෙකු වූ නිසාය. ධනපති පාලකයින් අදත් චේගේ පෙනුමට සහ හරයට බියක් දක්වුවද ජනතාව චේගේ පෙනුමට ආදරය කරමින් සිටිති. ජනතාව ආදරය කරන චේගේ ජනතාවට සමීප පෙනුම යනු ඔහුගේ හරය විසින් ඇති කළ කිර්තිය නිසා වූවක් බැවින් තව බොහෝ කල් නොගොස් ජනතාව චේගේ දේශපාලන හරයටද සමීප වනු ඇත.

# නිදිකුම්බා



නිදිකුම්බා යනු රනිල කුලයට අයත් ශාක විශේෂයකි. නයිට්‍රජන් සහ පොස්පරස් සාන්ද්‍රණය අඩු භූමි ප්‍රදේශවල වැවෙන මෙම ශාකය විදෙස් රටින් පැමිණි ආගන්තුක ආක්‍රමණශිලී පැළෑටියකි. ඉඳහිට ඖෂධයක් ලෙස භාවිතයට ගැනුණද, ජනතාවගේ එදිනෙදා ජීවිතයට නිදිකුම්බා අවශ්‍ය වන්නේ නැත. සරු බිම් නිසරු කරන නිදිකුම්බා තමන්ට අනතුරක් වනවිට හැකිළෙන තම ආරක්‍ෂාවට උපකාරකර ගන්නා බහුල වශයෙන් කටු සහිත ශාකයකි. මෙම ලිපියේ අරමුණ නිදිකුම්බා ගැන කතා කිරීම නොවේ.

පවතින ධනපති ක්‍රමය ගැන කල්පනා කිරිමේදී ධනපති ක්‍රමයත් එක්තරා ආකාරයකට නිදිකුම්බා ගසට සමානය. මෙරට ධනපති ක්‍රමයත් ආක්‍රමණශිලී සමාජ ක්‍රමයකි. අප රටේ ධනේශ්වර ක්‍රමය උත්තරාරෝපිත එකකි. පංති ප්‍රශ්නය හඳුනා නොගන්නා සහ දේශපාලන අවබෝධය නොමැති සාමාන්‍ය ජනතාව වෙසෙන බිම් තුළ වේගයෙන් වැඩෙන ධනපති ක්‍රමය, සරු බිම් නිසරු කරමින් සිටි. කොමියුනිස්ට් ප්‍රකාශනයේ ප්‍රකාශ කරන්නාක් මෙන් ධනපති ක්‍රමය සියලු සමාජ හර පද්ධතින් සහ ගරු බුහුමනට ලක් වූ සියල්ල විනාශ කරමින් සිටි. තමන්ට අනතුරක් වන විට ස්වේච්ඡාවෙන් හැකිළෙන ධනපති ක්‍රමය අවට ඇති සියල්ලම තම ක්‍රමයේ පැවැත්ම වෙනුවෙන් ගොදුරු බවට පත් කරගනිමින් සිටි.

නිදිකුම්බා ගස විනාශ කිරීමට නම් එය මුලින් උදුරා දැමිය යුතුය. කරදරයෙන් මිදීමට මතු පිටින් ඉවත් කළද එය නැවත වැඩී විනාශය සිදුකරනු ලබයි. වසර 64 ක් මෙරට ජනතාව කළේද ධනපති ක්‍රමය මතු පිටින් කපා දැමීම මිස මුලින් උදුරා දැමීම නොවේ. නිදිකුම්බා ගස මුලින් උදුරා දැමීමට නම් දැනෙන තාවකාලික වේදනාව ගණන් නොගෙන, ගසේ මුල තදින් අල්ලා උදුරා දැමිය යුතුය. කම්මැළිකමට ඉවත් කරන්නට යාමෙන් අනතුර ඉවත් නොවන අතර ඉදිරිපත්වන්නා කටු ඇනී අනතුරට පත් වේ. එබැවින් සමාජ පිළිලයක් වූ නිදිකුම්බා මෙන් ධනපති ක්‍රමයද මුලින් අදුරා දැමීම ආවාට ගියාට කළ නොහැක. තාවකාලික වේදනාව ගැන නොසිතා සරු බිම රැක ගැනීම සඳහා එය මුලින්ම උදුරා දැමිය යුතුමය.

# දේශප්‍රේමය

රාජපක්‍ෂ ආණ්ඩුවේ කැඳවීම අනුව දේශප්‍රේමී ජනතාවගෙන් කොටසක් විදෙස්ප්‍රේමී රාජපක්‍ෂ ආණ්ඩුව රැක ගැනීමට මහ පාරේ පෙළපාලි යමින් සිටිති. රාජපක්‍ෂ ආණ්ඩුවේ දේශප්‍රේමී ගෝරනාඩුව යනු අධිරජ්‍යවාදයට පෙරට දමා අධිරාජ්‍ය ගැත්තන් ආරක්‍ෂා කරන්නට ඇටවූ අගුලක් බව දන්නා දේශප්‍රේමි ජනතාව සිය අයිතීන් වෙනුවෙන් මහ පාරේ සටනට අවතීර්ණ වී ඇත. වී මිලට සාධාරණ මිලක් ඉල්ලා ගොවියෝ පාරට බැස සිටිති. තෙල් මිල ඉහළ යාමට එරෙහිව ධීවර, කම්කරු, වතු ජනතාව පාරට බැස ඇත. ජීවත් වීමට සාධාරණ වැටුපක් ඉල්ලා රාජ්‍ය පුද්ගලික අංශ සේවකයින් මහ පාරට පැමිණ ඇත. ධනපති නීතිය ගැන විශ්වාසය බිඳගත් ජනතාව විවිධ සිද්ධින්වලදී තමාට හිතෙන දේ නීතිය බවට පත්කරගෙන ඇත. 'තෙල්ද - රටද' යනුවෙන් රාජපක්‍ෂ ආණ්ඩුව පොස්ටර් අඳින විට, ජනතාව තෙලුත් 'ඕනෑ - රටත් ඕනෑ' යනුවෙන් පෝසටර් ඔසවති.




අපේ රට යනු සැබෑ දේශප්‍රේමින් තොග ගණනින් බිහිකළ රටකි. සතුරා ඉදිරියේ සැබෑ විරත්වයෙන් මරණය වැළඳගත් මිනිසුන් ඕනෑතරම් බිහිකළ බිමකි. රාජපක්‍ෂ ආණ්ඩුවේම නිර්මාණයක් වූ එල්.එල්.ආර්.සී. යෝජනා ක්‍රියාත්මක කරන ලෙස අධිරාජ්‍යවාදීන් ප්‍රකාශ කරන විට 'බලපෑම් කරන්න එපා අපි එහෙම කරන්නම්' යනුවෙන් රාජපක්‍ෂ කනිපින්දම් ගාමින් සිටි. අධිරාජ්‍යවාදීන්ගේ දබරඟිල්ල හමුවේ ජනාධිපතිවරයා පල්ලම් බැස්සාට සතුරාගේ තුවක්කුව ඉදිරියේදී පවා තම අරමුණු පාවා නොදුන් දේශප්‍රේමිහු අප රටේ සිටියහ. තවත් සිටිති.

'අවසන් වශයෙන් උඹට කියන්න තියෙන්නේ කුමක්ද'යි පුරන් අප්පුගෙන් සුද්දා විමසන විට, 'අනේ මාව මරන්න එපෝ. උඹලා කියනදේ කරන්නම්' යනුවෙන් ව්‍යාජ දේශප්‍රේමයෙන් ජනතාවට කන්නලව් කළේ නැත.

'මගේ අම්මා මං වගේ තව දෙන්නෙක් වැදුවානම් එක පර සුද්දෙක් ඉතිරි කරන්නේ නැහැ' යනුවෙන් ප්‍රකාශ කොට වීරයෙකු ලෙස වෙඩි උණ්ඩයට ළය පෑවේය.

# පො ලිටිකල් පංතිය

පොලිට්ක්කා පංතියට ආවේ කලබල ගතියකින්.

සුබ උදෑසනක් සර් පංතියේ හැමෝම කිව්වා.

එහෙමයි එහෙමයි.. සුබ උදෑසනක් .. සුභ උදෑසනක් එහෙම කියමින්ම පොලිට්ක්කා වෙනදා නැති කලබලයකින් කළුලෑල්ලේ පාඩමේ මාතෘකාව ලිව්වා. මානව හිමිකම් හා අධිරාජ්‍යවාදය. අකුරු ඇඹරිලා ලියවිලා තිබුණට හැමෝටම එය කියවා ගන්න පුළුවන් වුණා.

අධිරාජ්‍යවාදය කියන්නේ, ඉහෙන් කනෙන් බේරෙන දහදිය පිහිදා ගන්නටත් නොදී වසන්ති ඇහුව.

අධිරාජ්‍යවාදය කියන්නේ අමෙරිකාවටනේ. පොලිට්ක්කා උත්තර දෙන්නත් කලින් සුගත් මැදට පැන්නා.

කිසියම් රටක් තවත් රටක ස්වාධීනත්වයට බාධා කරමින් කටයුතු කරනවා නම් ඒකට කියන්නෙත් අධිරාජ්‍යවාදය කියලා තමයි. ඒක ආකාර කිහිපයකින් කරනවා. ආර්ථික,සමාජ සහ දේශපාලනික. කවදත් පොත පත ඇසුරෙන් උත්තර දෙන කමල් ඇහුවා.

කමල් එහෙම කියන කොට මෙතෙක් වෙලා හිටගෙන හිටපු පොලිට්ක්කා පුටුවේ වාඩි වුණා.

ඒක බරපතළ වැඩියි. මම කියන්නේ මානව හිමිකම් කවුන්සලය හරහා රටවල්වලට කරන බලපෑම තමයි අධිරාජ්‍යවාදී මැදිහත්වීම කියන්නේ. වසන්ති කිව්වේ හැම ප්‍රශ්නයක්ම උඩින් පල්ලෙන් අතගාන නෝනා උත්තර දෙන විදිහට.

ආණ්ඩුවේ උද්ඝෝෂණවල තිබුණා තෙල් ද.. රටද.. කියලා. එතකොට අමෙරිකාව ඇතුළු රටවල් අනෙක් රටවල්වල තෙල් සම්පත කොල්ලකන්න කරන බලපෑමට මොකක්ද කියන්නේ පොලිට්ක්කා දෙස බලමින් වසන්තිට ඇඟිල්ල දිගු කරමින් නැවතත් කමල් විමසුවා.

ඒ උනාට මානව හිමිකම් ප්‍රශ්න මුල්කරගෙන රටවල් වලට කරන බලපැම තමයි අපට අද දවසේ අධිරජ්‍යවාදි මැදිහත්වීම වශයෙන් හදුනාගන්න පුළුවන් වන්නේ . තමන් තුල නොමැති ගාම්භිර කමක් ඇරුඬ කරගෙන කතා කරන ඩිලාන් පෙරේරා සිහි ගන්වමින් වසන්ති බේරා ගැනීමට පොලිට්ක්කා ඉදිරිපත් වුණා.

අධිරාජ්‍යවාදී මැදිහත් විම් වගේ තමයි අතට අත දීලා අධිරාජ්‍යවාදී මැදිහත්වීම් භාරගැනීම. මෙතෙක් වෙලා නිහඬව සිටි සිසිර ප්‍රශ්නය වෙනත් අතකට යොමු කරමින් පැවසුවා.

මම හිතාගෙන ඉන්නේ එළැඹෙන සිංහල දෙමළ අළුත් අවුරුදු උත්සවයට දින කිහිපයක් පොලිටිකල් පන්තියට නිවාඩු දෙන්න. පොලිට්ක්කා ඒ වේලාවේ ඇන්දෙ ගම්මන් පිලට කියලා හැමෝටම තේරුණා.

ඒ උනාට සර්.. පටන් ගත්ත පාඩම අතරමඟ නතර කරන්න හොඳ නැහැ. පොලිට්ක්කාගේ අදහස තේරුම්ගත් සුනිල් ප්‍රශ්නයට එන්ටර් වුණා.

අතට අත දීලා... ගිවිසුම් අත්සන් කරලා.. කරන්නෙත් අධිරාජ්‍යවාදයට උදව් දිමක්. ඒකට හොඳ ප්‍රශ්ථා පිරුළකුත් තියෙනවා අහක යන නයි රෙද්ද පල්ලේ දාගන්නවා කියලා.

ඒක වෙනම ප්‍රශ්නයක්.. දැන් අප හමුවේ තියෙන අධිරාජ්‍යවාදය තමයි් මානව හිමිකම් කවුන්සලය හරහා අපට කරපු අධිරාජ්‍යවාදී මැදිහත්වීම. සුනිල්ගේ කථාවට බාධා කරමින්, කවදත් පොලිට්ක්කා බේරාගැනීමට කටයුතු කරන සුගත් මැද්දට පැන්නේ සුදුවෑන් මල්ලිලා බේරගන්න මැද්දට පැනපු අනුර සේනානායක වගේ..

රටවල් යටත් කරගන්නත්.. දුර්වල පාලකයෝ තවත් දුර්වල කරන්නත් අධිරාජ්‍යවාදි මැදිහත් වීම් වෙනවා..

චමියා එසේ කියන විට අනේ මම ඕවා දන්නේ නැහැ කියන්නාක් මෙන් පොලික්කා කරබාගෙන සිටියේ රත්නපුරේ කුඩු තියෙන බවක් මම දැනගෙන හිටියේ නැහැ යනුවෙන් ජෝන් සෙනෙවිරත්න කියපු දෙකේ පන්තියේ ප්‍රකාශය සිහිග න්වමින්.

අධිරාජ්‍ය මැදිහත්විම බලහත්කාරයෙන් එන්නත් පුළුවන්. අත්පුඩි ගහලා ගෙන්න ගන්නත් පුළුවන්. බලහත්කාරයෙන් එන එකට වඩා භයානකයි අත්පුඩි ගහලා ගෙන්න ගන්න එක. දැන් අපේ රටේ වෙලා තියෙන්නේ අධිරාජ්‍යවාදයේ නරකම එක. ඒ නිසා අධිරජ්‍යවාදයත්, අධිරාජ්‍යගැති භාවයත් දෙකම එක වල්ලේ පොල්.. සමනයා එසේ කියමින්.. එහෙම නේද සර්.. යැයි පොලිට්ක්කාගෙන් විමසුවා.


සුභ අනාගතයක් කියලා වෙනදා පන්තියෙන් යන පොලිට්ක්කා ඒ වන විටත් පන්තියෙන් නික්ම ගොස් තිබුණා.

## 3 පිටුවෙන් ජිනීවා විගඩම...



අනුව තාක්ෂණික සහාය දීමේ මුවාවෙන් ලංකාවේ අභ්‍යන්තර ක්‍රියාවලියට අත ගැසීමට අධිරාජ්‍යවාදී නියෝජිතයන්ට ඉඩ ලැබෙන අතර ලංකාවේ ආණ්ඩුව මෙම යෝජනාවට අනුව කටයුතු කරන ආකාරය මත ඉදිරියේ තවත් යෝජනා ගෙන එමින් ලංකාවේ ප්‍රශ්න ජාත්‍යන්තර බලවතුන්ගේ අතට ගැනීමේ ඉඩද ලැබී තිබේ. ලංකාවේ ප්‍රශ්න එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය හෝ මහා මණ්ඩලය දක්වාම ගෙනයාමට අවශ්‍ය පළමු පියවර දැන් ඇතිකර තිබේ. එය අධිරාජ්‍යවාදයේ ජයග්‍රහණයක් වන අතර රටක් ලෙස ලංකාව ලැබූ පරාජයකි.
දැන් ආණ්ඩුව උත්සාහ කරන්නේ, මෙම පරාජය වසං කිරීමටය. යෝජනාව සම්මත වීමට පෙර ජනතාව පාරට ගනිමින් රට තුළ ආණ්ඩුවට එරෙහිව ගොඩනැගෙමින් තිබූ ජනතා විරෝධය යටපත් කිරීමට පෙළපාළි ගිය ආණ්ඩුව, ජනාධිපතිවරයා විදුලි පුටුවේ තැබීමට යන්නේ යැයි රටම බියට පත්කළ ආණ්ඩුව දැන් යෝජනාව සම්මත වූ පසු තම නොහැකියාව හා ලැජ්ජාව වසා ගැනීමට යෝජනාවේ බරපතළකම සඟවමින් කටයුතු කරයි. නිමල් සිරිපාල ඇමතිගේ කතාව තුළ ඇත්තේද එයයි. මෙය අපට ප්‍රශ්නයක් නොවේ යැයි පවසමින් ආණ්ඩු රටට කළ බරපතළ අපරාධය සරල කිරීමට උත්සාහ කරයි.
එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදයත්, ඉන්දියාවත් මානව හිමිකම් පිළිබඳ යෝජනා සම්මත කරමින් ලංකාවේ ආණ්ඩුව යොමුකරමින් සිටින්නේ එක් දිශාවකටය. ඒ, සැබෑ ලෙසම මානව හිමිකම් රැකීමේ දිශාවට හෝ උතුරේ ජනයාගේ අයිතීන් ලබාදීමේ දිශාවට නොව ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වන බලය බෙදීමේ දිශාවටය. එක්සත් ජනපදය ජිනීවා මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ යෝජනාවේ ආරම්භක කොටසේ ''පළාත්වලට බලය බෙදන දේශපාලන විසඳුමක්'' ගැනද සඳහන්කර තිබේ. එක්සත් ජනපදයේ අරමුණ යුද්ධයේදී මානව හිමිකම් කඩවීම් හෝ යුද අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම නම් බලය බෙදීමේ වාක්‍යයක් යෝජනාවට එකතු කළ යුතු නැත.
එසේම යෝජනාව සම්මත කිරීමට ජිනීවාවලදී ඡන්දය දුන් ඉන්දියාව ඒ පිළිබඳව පැහැදිලි කරමින් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා වෙත එවා ඇතැයි කියන ලිපියේද 13 ඉක්මවා බලය බෙදිය යුතු බවට සඳහන් කර තිබේ. එපමණක් නොවේ. මහින්ද රාජපක්ෂ මහතාගේ උගත් පාඩම් කොමිසමේ නිර්දේශ තුළද බලය බෙදීමට යෝජනා කර තිබේ. උගත් පාඩම් කොමිසමේ නිර්දේශ වහා ක්‍රියාත්මක කරනු! යයි අධිරාජ්‍යවාදීන් හා ඉන්දියාව බලකරන්නේ එකී යෝජනාවද සහිතවය. මීට අමතරව ආණ්ඩුව විටින් විට මේ රටවලට මේ පිළිබඳ පොරොන්දුද දී තිබේ. ඒ අනුව දැන් ආණ්ඩුව පඹගාලක පැටලී ඇති අතර රටද පඹගාලක පටලවා අධිරාජ්‍යවාදයේ වුවමනාව ඉටුකරන තැනට කටයුතු සලස්වා තිබේ. මේ දිනවල ආණ්ඩුව උත්සාහ කරන්නේ, මෙය වසංකර ගැනීමටය.
මෙම ප්‍රශ්නයේදී ඉන්දියාවද යළිත් වරක් තමන් කවුද යන්න පෙන්වා තිබේ. ඉන්දියාව හැමවිටම කටයුතු කර තිබෙන්නේ, තම රටේ වුවමනාව වෙනුවෙන් ලංකාවේ දේශපාලනය හසුරුවන අතරම ලංකාවේ 'මිතුරා' ලෙස පෙනී සිටින කපටි ආරක්ෂකයාගේ භූමිකාවය. දැන් ජිනීවාවලදී ලංකාවට එරෙහිව මහින්දගේ ආණ්ඩුවට එරෙහිව ඡන්දයදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට ලිපියක් එවමින් පවසන්නේ තමන් ඡන්දය දුන්නේ යෝජනාවේ තිබූ හානිකර වගන්ති සමතුලිත කිරීමට සංශෝධන ඉදිරිපත්කොට ඒවා ඇතුළත් කිරීම සඳහා බවය. ඒ අනුව ලංකාව ලොකු අනතුරකින් බේරාගෙන ඇත්තේ, ඉන්දියාවය! මේ අරුම පුදුම මිතුරාට මෙලෙස කටයුතු කිරීමට සිදුව ඇත්තේ ඇයි? ඉන්දියාව ලංකාව තුළ කරගෙන යන ඉදිකිරීම් , ලංකාවේ වෙළඳපොළ ආදිය අහිමිකර ගැනීමටද ඉන්දියාවට නොහැක. එබැවින් රටේ ජනතා විරෝධය ඉන්දියාවට එරෙහිවව එල්ල වීම වැළැක්වීම සඳහා ඉහත මතය ප්‍රචාරය කරයි. මෙහිදී ආණ්ඩුවේ ඊනියා දේශප්‍රේමීන්ද නිහඬය. ඇමරිකානු බඩු වර්ජනය කිරීමට හඬ නගන ඔවුන් ඉන්දියාව ගැන දක්වන්නේ, අඳගොළු බිහිරි ප්‍රතිපත්තියකි.
මෙම ප්‍රශ්නයේදී අධිරාජ්‍යවාදයත් ඉන්දියාවත් ලංකාවේ ආණ්ඩුවත් හරයෙන් සිටින්නේ, එකම තැනකය. ඒ, උගත් පාඩම් කොමිසමේ වාර්තාවේ නිර්දේශ ක්‍රියාවට නැගීමටය.
ඒ හරහා බලය බෙදීමටය. එහෙත් මේ හැම පාර්ශ්වයකටම ඊට බාධාකරන තත්වයන් තිබේ. ජනතාවගේ මනෝභාවයන්, නොසලකා කටයුතු කිරීම දුෂ්කර බව ඔවුහු දනිති. ඔවුනට මේ සියල්ල අතර තම රටවල තම බලය පවත්වා ගැනීමද කළ යුතුය. ඒ නිසා ඊට අනුව ඇත්ත සඟවමින් බොරු රඟපෑම් කිරීමට ජනතාව රවටා නොමග යැවීමටද සිදුවී තිබේ. ප්‍රශ්නය සංකීර්ණ වී ඇත්තේ ඒ නිසාය.
කෙසේ වෙතත් පොදුවේ ගත් විට පැහැදිලිවම ලංකාවට එරෙහිව අධිරාජ්‍යවාදී ක්‍රියාමාර්ගයක් දැන් දියත් වෙමින් තිබේ. වත්මන් ආණ්ඩුවට හැක්කේ, එයට තව තවත් වාසිදායක පරිසරයක් නිර්මාණය කිරීම මිස එය පැරදවීම නොවේ. තමන්ට අධිරාජ්‍යවාදය නොව ඔවුන්ගේ යෝජනාවක් වත් පරාජයට කිරීමට නොහැකි බවත් රට රැකිය නොහැකි බවත් ආණ්ඩුව ඔප්පු කර තිබේ. (කෞතුකාගාරය වත් ආරක්ෂා කිරීමට බැරි ආණ්ඩුව රටත් ආරක්ෂා කරන්නේ කෙසේද?) එබැවින් දැන් එළඹ ඇත්තේ, බොරු දේශප්‍රේමී සටන්පාඨ හඬනගමින් අධිරාජ්‍යවාදයට මච්චිම බිලිදෙන රාජපක්ෂලාගේ පාලනයද අවසන් කිරීම අරමුණු කරගත් සැබෑ අධිරාජ්‍යවිරෝධීන්ගේ, දේශප්‍රේමීන්ගේ පුළුල් මධ්‍යස්ථානයක් ගොඩනැගීමේ අවස්ථාවය. අධිරාජ්‍යවාදය සැබෑ ලෙසම පැරදවිය හැක්කේ, ඊට මග තනන දුබල ධනවාදයද පරදන වැඩපිළිවෙළක් තුළය. ඒ සඳහා පංති බලවේගයන්ගේ නායකත්වයෙන් පුළුල්තම අධිරාජ්‍ය විරෝධය හා දේශප්‍රේමී ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගීම හැර එය සවිමත් කිරීම හැර අන් විකල්පයක් රට හමුවේ නැත.

## 10 පිටුවෙන් රාජ්‍යය ගැන ...



විරෝධයන්ගේ අසමගියේ ප්‍රතිඵලයක් බව
මේ ගැන එංගල්ස් මෙසේ පවසයි ''රජය සමාජය මත පිටතින් පැටවූ කිසියම් ප්‍රපංචයක් නොවේ. හේගල් කියන පරිදි රජය සත්‍ය වූ අධ්‍යාත්මික අභිප්‍රායයන් නොවන්නා සේම බුද්ධි තර්කයේ තාත්විකත්වයේ හෝ ප්‍රතිමූර්තියක්ද නොවන්නේය. රජය වූ කල්හි සමාජ සංවර්ධනයේ ඵලයක් ලෙස එක්තරා අවධියකදි පැන නැගුණු රජය වූ කලි විසඳිය නොහැකි වූ ප්‍රතිවිරෝධයන්ට ඒ තුළින්ම මේ සමාජය හසුවී ඇතිබව පිළිගැනීමකි''

2. රජය වූ කලි පැගී සිටින පංතියේ සූරාකෑමේ උපකරණයකි.
''රජය පැන නැගුනේ ප්‍රතිවිරුද්ධ පංතිවල අරගල වළක්වාලීම සඳහාය. නමුත් ඒ අතරම එය පැන නැග්ගේ පංතිවල සට්ටන මතය. එය රීතියක් වශයෙන් රජයේ මාධ්‍ය තුළින් දේශපාලන වශයෙන් බලපාන පංතිය බවට පත්වූයේ පෑගුන පංතිය යටපත් කිරීමට හා සූරාකෑමට අලුත් මාධ්‍යයන් ලබා ගන්නාවූත් අතිශ්‍යයින්ම බල සම්පන්න ආර්ථික වශයෙන් ප්‍රබල පංතියේ රජය වන්නේය. ඒ අනුව පුරාණයේ රජයයන් හැමටම වඩා වහලුන් යටපත් කරගැනීම සඳහා වහල් හිමියන්ගේ රජය විය. ගොවි, ප්‍රවේණිදාසයන් යටපත් කර ගැනීම සඳහා රදළ යන්ගේ රජයත් කුලීනයන්ගේ රජයත් වූවා මෙන් වැටුප් ශ්‍රමය ප්‍රාග්ධනය විසින් සූරා කෑම සඳහා නූතන නියෝජිත රජය සේවය කරන්නාක් මෙනි''
(එංගල්ස් - පවුල පෞද්ගලික දේපළ හා රජය ඇතිවූ හැටි 173 පිටුව)

3. මේ අනුව රජය යනු දෙවියන්ගේ කැමැත්ත හෝ සම්මුතික ප්‍රතිඵලයක් නොව සමාජ දේපළ මත පංතීන් බෙදීම හේතුවෙන් ඇතිවූවක් බව පැහැදිලිය.
''මා දැනටමත් කියා ඇති පරිදි සමාජය පංතිවලට බෙදීමට පෙර රාජ්‍ය නොපැවති බව ඔබට පෙනෙනු ඇත නමුත් සමාජයේ පංති බෙදුම උද්ගතවී තදින් තහවුරු වීම සමඟ පංති සමාජය උද්ගතවීම සමඟ රාජ්‍යයද උද්ගතවී තදින් තහවුරු විය''
**(ලෙනින් එකතු කළ කෘති වෙළුම 10 පිට 15)**

## 5 පිටුවෙන් ලාබ අපේක්ෂාවෙන්...

ඇති වෙලා තිබෙනවා. ඇති වෙන්නත් පුළුවන්.
ජනතා විමුක්ති පෙරමුණට අදාලව සළකා බලන විට. එවැනි කණ්ඩායම් ප්‍රවණතා අවස්ථා ගණනාවකදීම මතු වුණා. එහි මුල් අවස්ථාවක් තමයි ධර්මසේකර කණ්ඩායම. ඒ 1969 අග භාගයේ පමණ. ඒ අවස්ථාවේ සාකච්ඡා කර විසඳුමක් ලබාගත නොහැකි වූ තැන එම කණ්ඩායම පක්ෂයෙන් නෙරපා හැරුණා. ඔවුන් ඊට පස්සෙ වෙනත් සංවිධානයක් අටවා ගෙන සමාජ විප්ලවය පවා දීමේ ක්‍රියාවලියේ දිගටම නිරත වුණා. එහි එක් අවස්ථාවක් තමයි, ඇමරිකානු තානාපති කාර්යාලයට පෙට්‍රල් බෝම්බ විසි කරලා, පොලිස් නිලධාරියෙකුට පිහියෙන් ඇන මරපු සිද්ධිය. ජ.වි.පෙ. පිටින් යවන්නයි එහෙම කළේ. ජ.වි.පෙ. වෙත මර්දනය දැඩි වුණේ එම සිද්ධියෙන් පස්සෙයි.
අපේ පක්ෂය තුළ ඊළඟ කණ්ඩායම් ප්‍රවණතාව ඇති වුණේ 1970 පමණ. ලොකු අතුල සමඟ සනත් ඊට නායකත්වය සැපයුවා. 1971 මාර්තු මාසේ රෝහණ විජේවීර සහෝදරයා අත්අඩංගුවට පත්වීමත් සමඟ ඒ වගේම එවකට රට තුළ පැන නැගී තිබූ තත්වයත් සමඟ මෙම කණ්ඩායම පරාජයට පත් කළ නොහැකි වුණා. 1971 අරගලයෙන් පරාජයට පත්වීමත් සනත්ලා වැනි අය මිය යෑමත් ලොකු අතුල විප්ලවය පාවාදී ආණ්ඩුවේ සාක්ෂිකාරයෙකු බවට පත්වීමත් නිසා එම කණ්ඩායම එයින්ම අවසන් වුණා.
ඊළඟ කණ්ඩායම් ප්‍රවණතාව ඇති වුණේ 1978 පමණ. ඒ හතර දෙනාගේ කණ්ඩායම. ඒකත් හඳුනා ගත්තු වහාම පරීක්ෂණයක් පවත්වා ඔවුන් පක්ෂයෙන් නෙරපා හැරියා.
1987 පමණ වාස් තිලකරත්න, මහින්ද පතිරණ, වැනි අයත් පක්ෂය තුළ කල්ලි කණ්ඩායම් ප්‍රවණතාවක් ඇති කළා. ඊටත් අවශ්‍ය කරන පිළියම් ලැබුණේ ඔවුන් කණ්ඩායම පක්ෂයෙන් නෙරපා හැරීම තුළින්. 1994 පක්ෂය නැවත ප්‍රසිද්ධ දේශපාලනයට අවතීරණ වුණාට පස්සේ සෙනවිගේ නායකත්වයෙන් කණ්ඩායමක් ක්‍රියාත්මක වුණා. ඔවුන් පක්ෂයෙන් නෙරපා හැරීමෙන් අනතුරුව එම ප්‍රශ්නය සමනය වුණා.
ජ.වි.පෙ. තුළ අලුතෙන්ම ඇති වුණු කණ්ඩායම තමයි, මුලදී ඔවුන් විසින්ම හඳුන්වා ගත් 'කැරලිකාරී' කණ්ඩායම. මෙයත් මීට පෙර ඇති වු කල්ලි කණ්ඩායම් වගේ සුළු ධනේශ්වර අවස්ථාවාදීන්ගේ රංචු ගැහීමක් විතරයි. මීට කලින් කල්ලි කණ්ඩායම් හැදූ අයත් කිව්වේ, 'ජ.වි.පෙ. වැරදියි. ඒගොල්ල ඒක නිවරදි කරන්න යනවා' කියල. හැබැයි ඒ අයගේ පසුකාලීන හැසිරීම් රටාවන් එක්ක ඔප්පු කරලා පෙන්නලා තියෙනවා, ජ.වි.පෙ. නිවැරදියි, ඔවුන් තමයි, ධනපති ගුබ්බෑයම්වල ලැගලා තියෙන්නේ කියලා. මාක්ස්-ලෙනින්වාදී පක්ෂය තුළ කල්ලි කණ්ඩායම් පවතින්න බැහැ. එවැනි අය සිටී නම්, වහාම ඔවුන් ඉවත් කොට පක්ෂය පිරිසිදු කළ යුතුයි. ඊනියා අරගල කණ්ඩායම් සම්බන්ධයෙන් වුණත්, ජ.වි.පෙ. ඉතා පරිණත විදියට කටයුතු කරමින් එම ප්‍රශ්නයට විසඳුම් ලබාදී තියෙනවා. ඊනියා අරගල කල්ලිය විසින් නුදුරු අනාගතයේ ප්‍රදර්ශනය කරාවි තමන් මොන කුණු කූඩයටද වැටෙන්නෙ කියල.

***නියමුවා:- වර්තමාන ලාංකේය තරුණ පරම්පරාව ඔවුන් හමුවේ ඇති අභියෝග හඳුනා ගැනීමට සහ ඒවා ජය ගැනීමට සමත්ද?***

**කිතුලෙගොඩ සහෝදරයා:-** වත්මන් ලාංකේය තරුණ පරම්පරාව ගැන කතා කරන විට මතක තබා ගත යුතු වැදගත් කාරණාවක් තියෙනවා. එනම්, මේ තරුණ පරම්පරාවෙන් වැඩි දෙනෙක් ඉපදී හැදුණෙ-වැඩුණේ වෙළඳපොළ (විවෘත) ආර්ථික ක්‍රමය යටතේ. ඒ වගේම ඉතිහාසය සහ සාහිත්‍යය වැනි විෂයයන් පාසැල් විෂය ධාරාවෙන් ඉවත් කරපු අධ්‍යාපන රටාවක් ඇතුලේ අධ්‍යාපනය ලබමින්. යාන්ත්‍රික ජිවිතයකට හුරු කරපු පරම්පරාවක්. මේක ඒ පරම්පරාවේ වරදක් නෙවෙයි, පවතින සමාජ ක්‍රමයෙ පාලකයන් විසින් කරන ලද අපරාධයක ප්‍රතිඵලයක්.
කොහොම වුණත් මේ පරම්පරාව නූතන තාක්ෂණික දැනුම කඩිනමින් ග්‍රහණය කරගත හැකි දක්ෂ පිරිසක්. ඒ වගේම රටේ අනාගතය භාර ගන්න ඉන්න පිරිසක්. දැනුම අතින් ඉහළ මට්ටමක ඉන්න පිරිසක් නිසා තමන් මුහුණ දෙන අභියෝගය හඳුනා ගැනීමට ඔවුන් සමත් වන බව විශ්වාසයි. ඒත් ගැටලුවකට තියෙන්නෙ සියලු දේ තරඟකාරිත්වයේ රැල්ලට හසුවී ඔවුන්ද ඒ තුළ කැකෑරෙන පිරිසක් වන නිසා පොදු වුවමනාව වෙනුවෙන් පෙළ ගස්වන්නට තිබෙන අපහසුවයි. 1965 අපේ පක්ෂය පටන් ගන්න වකවානුවෙ හිටපු තරුණ පිරිස් අද තරුණයින් තරම් දැනුම අතින් ඉහළ මට්ටමක හෝ තරඟකාරීත්වයක නොසිටියත් තමන් ගේ පුද්ගලික දෙයක් බලාගෙන ඉන්න තත්වයක සිටියා මිස පොදු වුවමනාවට පෙළ ගැසෙන පිරිසක් වුණේ නැහැ. ඒත් රෝහණ සහෝදරයාගේ කැපකිරීමේ ආදර්ශය හා පුද්ගලයින්ට සමීප වීමේ කලාව විසින් ඔවුන් පොදු වුවමනාවට පෙළ ගස්වන්න පමණක් නොවෙයි, පොදු වුවමනාව වෙනුවෙන් දිවි දෙන්නන් බවට පත් කරන්නටත් හැකි වුණා.



අද තරුණ පරපුරට අදාලවත් එය එසේමයි. අද තරුණ පරම්පරාව දේශපාලනිකව දිනාගැනීම වෙනුවෙන් ඔවුන්ට සමීපවීමේදී, ඔවුන් විප්ලවවාදී පක්ෂයේ භාවිතයන්ට අනුගත කර ගැනීමට අප සමත් වුවොත්, තමන් මුහුණ දෙන අභියෝග ජයගැනීම සඳහා පෞරුෂයෙන් හෙබි පිරිසක් බවට ඔවුන් අනිවාර්යයෙන්ම පත්කර ගතහැකියි. එය එසේ කළ යුතුයි.

***නියමුවා:- ඔබ දශක 04 කටවැඩි කාලයක් ජනතා විමුක්ති පෙරමුණ සමග ක්‍රියාකාරිව සම්බන්ධයි. මේ කාලය තුළ බොහෝ පිරිසක් පක්ෂයට එකතු වෙනු හා ක්‍රියාකාරිත්වයන් බැහැර වෙනු ඔබ දුටුවා. ජ.වි.පෙ. ලාංකේය ජනතාවට තමන් ගේ විමුක්තිය උදාකර ගැනීමට නායකත්වය දෙනු ඇතැයි ඔබ විශ්වාස කරන්නේ ඇයි?***

**කිතුලෙගොඩ සහෝදරයා:-** විප්ලවවාදී ව්‍යාපාරයක් තුළ වැඩ කරන එක මහා දුෂ්කර කාර්යයක්. එවැනි ව්‍යාපාරයක පළමුවත් දෙවැනිවත් තුන්වැනිවත් තියෙන්නේ කැපකිරීම්. එයට සම්බන්ධ වන අය එක දිගට එබඳු කැපකිරීම් කර ගන්න අසමත්වන විට ව්‍යාපාරයෙන් දුරස් වෙනවා. තවත් සමහර අවස්ථාවල ව්‍යාපාරයට සම්බන්ධ සමහරුන් තමන්ගේ පෞද්ගලික අරමුණු ඒ තුළින් ඉෂ්ට කරගන්න බැරිවෙන කොට ඉවත් වෙලා යනවා. තවත් සමහරුන් පෞද්ගලික අරමුණු වෙනුවෙන් පක්ෂයට සම්බන්ධ වී සිට එම අරමුණ ඉටුකර ගත්තාට පස්සේ පක්ෂයෙන් ඉවත් වී තමන්ට සුදුසු තැන් සොයා ගෙන යනවා. විප්ලවවාදි පක්ෂයට පුද්ගලයින් එන්නේ ධනේශ්වර සමාජයේ සිටයි. ධනේශ්වරයේ තිබෙන අගතිගාමී ලක්ෂණ ඇතැමුන්ට කිනම් මොහොතක හෝ මතු වෙන්න පුළුවන්.
මෙම තත්ත්වය ජ්‍යාන්තර විප්ලවවාදි ව්‍යාපාරයටත් අපේ පක්ෂයටත් පොදු කාරණයක්. විප්ලවවාදී ව්‍යාපාරයක් පටන් ගෙන කෙටි කාලයකදී සමාජ විප්ලවය සිදු වූ කියුබාව වැනි රටක් හැරුණු විට අනෙක් හැම විප්ලවවාදී ව්‍යාපාරයකම ආරම්භක බහුතර පිරිසම නෙවෙයි, විප්ලවය අවසන් කරන්නේ. මෙම තත්වය සම්බන්ධයෙන් රෝහණ සහොදරයා කියපු 'කොළඹ-කතරගම බස් එකේ උදාහරණය' මීට හොඳට ගැලපෙනවා. කොළඹින් පටන් ගත්ත බස් එකට නැගපු අයගෙන් කොටසක් ගාල්ල, මාතර, හම්බන්තොට ආදී නගරවලින් බැහැලා යනවා. කොළඹින් නැගපු අය ටික දෙනෙකුයි, මගදි නැගපු අය වැඩි දෙනෙකුයි, තමයි කතරගමදි බස් එකෙන් බහින්නෙ. අවස්ථා දෙකකදී රාජ්‍ය මර්දන දෙකක් විසින් අපේ සටන් සගයින් දස දහස් ගණන් අපට අහිමි කර ඇති බවත් අප අමතක කළ යුතු නැහැ.
අනිත් වැදගත් කාරණය මෙකයි. 'පක්ෂයෙන් ඉවත්වූ' අය යැයි කිව්ව පමණින් බොහෝ අයගෙ මතකයට එන්නේ එක්කෝ වෙනත් දේශපාලන පක්ෂවලට නැත්නම් සතුරන් අතරට ගිය අය ගැන පමණයි. ඒත් පෞද්ගලික හේතුන් මත පක්ෂයේ ක්‍රියාකාරිත්වයෙන් දුරස් වූ දස දහස් ගණනක පිරිසක් තමන්ට හැකි පමණින් උදව් කරමින්, පක්ෂයේ ඉදිරි ගමනට ආශිර්වාද කරමින් රට පුරා ඉන්නවා.
ඒ නිසා ගියපු පිරිසයි ඉන්න පිරිසයි දිහා බලලා නෙවෙයි මම සමාජ විප්ලවය පිළිබඳව විශ්වාසය හා බලාපොරොත්තු තියන්නෙ. විප්ලවවාදී ව්‍යාපාරය හැටියට ජනතා විමුක්ති පෙරමුණේ උපාය මාර්ගය (ජාතික විමුක්ති අරගලය හරහා සමාජවාදයට) වෙනස් නොවෙන තාක්කාල් මම මේ පක්ෂය විශ්වාස කරනවා, මම මේ පක්ෂයත් එක්ක ඉන්නවා, සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණය ඉක්මන් කිරිම සඳහා මගේ උපරිම දායකත්වය ඊට ලබා දෙනවා. එකී උපාය මාර්ගය සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් භාවිතා කරන ලද 'උපක්‍රම' (තත්වයන් පියමන් කිරිම වෙනුවෙන් ගන්නා කෙටි කාලීන තාවකාලික ක්‍රියා මාර්ග) ඇතැම් ඒවා අසාර්ථක වෙන්න පුළුවන්. එහෙත් ඒවා සද්භාවයෙන් ගන්නා ලද තීරණ නම්, වැරදුන තැන හඳුනා ගෙන නිවැරදි කර ගන්නවා නම්, ඒ වැරදී ගිය තැන් මගේ අරමුණු වෙනස් කර ගන්නට හේතු කර ගන්නේ නැහැ.
මේ මොහොත වන විටත් ලාංකේය ජනතාවගේ විමුක්තිය උදෙසා කටයුතු කරන එකම විප්ලවවාදී පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ පමණමයි. සමාජ විප්ලවයට නායකත්වය සපයන්නේ, ජනතා විමුක්ති පෙරමුණයි. සමාජ විප්ලවය, මගේ දෑහින් දැක ගන්නට හැකි වුණත් නැතත් එය මට වැදගත් නැහැ. මගේ කැපකිරීම සමාජ විප්ලවයේ ජයග්‍රණය උදෙසායි. ඒ නිසයි මා විශ්වාසයෙන් යුතුව වැඩ කරන්නෙ.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# කටුගෙය හොරු කැඩීම හා රට රැකීම

පසුගිය දිනවල ලංකාව සම්බන්ධයෙන් ඉතාම හානිකර සිදුවීම් දෙකක් වාර්තා විය. ඉන් එකක් වුයේ ජිනීවා මානව හිමිකම් කොමිසමේදී එක්සත් ජනපදය ලංකාවට එරෙහිව යෝජනාවක් සම්මත කර ගැනීමය. එය රටේ ස්වෛරීත්වයට හා ස්වාධිපත්‍යයට අනාගතයේ බරපතළ හානි ගෙන දෙන එකකි.

අනෙක් සිදුවීම වූයේ, ලංකාවේ කොළඹ පිහිටි ජාතික කෞතුකාගාරය හොරු කැඩීමය. එහි තිබූ වටිනා භාණ්ඩ රැසක්ම හොරු රැගෙන ගොස් තිබේ. මෙය රටක් ලෙස ලංකාව අපකීර්තියට පත්වන සිදුවීමකි. මේ දෙකම සිදුවූයේ, රට රැකීමේ 'පේටන්ට්' අයිතිය තම නමට ලියාගත් රාජපක්ෂ පාලනය තුළය.

අධිරාජ්‍යවාදීන් මානව හිමිකම් දඩමීමා කරගනිමින් ජිනීවා කොමිසම මගින් ලංකාවට අත පෙවීමට වසර කිහිපයක් තිස්සේ සූදානම් වෙද්දී, ඊට සැලසුම් සකස්කරද්දී ආණ්ඩුව කළේ එය වැළැක්වීමට කටයුතු කිරීම නොව එම තත්වය රට තුළ තමන්ගේ ප්‍රතිරූපය පුම්බාගැනීමට හා ජනතා විරෝධයන් යටපත් කිරීමට යොදා ගැනීමය. රට ඉදිරියේ පැවැති සැබෑ අනතුර වසංකරමින් රාජපක්ෂ ජනාධිපතිවරයා විදුලි පුටුවේ තැබීමේ ප්‍රබන්ධයක් ගොඩනගා ඊට එරෙහිව පඹයන් පුච්චමින් මහ පාරේ ජෝගි නැටූ ආණ්ඩුව සැබෑ ලෙසම ජනතා විරෝධයෙන් ජනාධිපතිවරයා තාවකාලිකව හෝ මුදා ගනිමින් ඒ වෙනුවට අධිරාජ්‍යවාදීන්ට රට අනතුරේ හෙළීය. රට රැකීමට රාජපක්ෂ ආණ්ඩුවට නොහැකි බව ඉන් ඔප්පු කළේය.

ලංකාවේ ජාතික කෞතුකාගාරය පවතින්නේ, රජයේ වගකීම යටතේය. එය ආරක්ෂා කිරීම හා නිසි නඩත්තුව සහිතව පවත්වාගෙන යාම ආණ්ඩුවේ වගකීමය. කෞතුකාගාරයක තිබෙන්නේ, රටක අතීතයේ උරුමයන්ය. ඒ අනුව ලංකාවේ අතීත උරුමයන්ට අදාල දේවල්, වටිනා ඓතිහාසික පුරාවස්තු මේ තුළ තිබේ. කෞතුකාගාරය ආරක්ෂා කිරීම යනු රටක අතීත උරුමයන් ආරක්ෂා කිරීමය. කෞතුකාගාරය හොරු කඩාගෙන යෑම වළක්වාලීමට නොහැකිවීමෙන් වත්මන් ආණ්ඩුව ඔප්පු කර තිබෙන්නේ, තමන්ට රට රකිනවා තබා කෞතුකාගාරය වත් රැකගත නොහැකි බවය.

ජිනීවා යෝජනා ගෙන ඒමට හා සම්මත කර ගැනීමටත් අවශ්‍ය සාධක නිර්මාණය කිරීමෙන් හා එය වළක්වන පියවර නොගැනීමෙන් ආණ්ඩුව ලංකාවේ වර්තමානයත් අනාගතයත් අනාරක්ෂිත කර තිබේ. අනතුරට පත් කර තිබේ. රටේ අනාගතය ආරක්ෂා කිරීමට ආණ්ඩුවට නොහැකි බව ඔප්පු කර තිබේ. එසේම කෞතුකාගාරය ආරක්ෂා කරගැනීමට නොහැකි වීමෙන් රටේ අනාගතය පමණක් නොව රටේ අතීතයද (ඉතිහාසය) රැක ගැනීමට තමන්ට නොහැකි බව ඔප්පු කර තිබේ.

යකඩ මල්ලට ගුල්ලන් ගැසූ පසු ධාන්‍ය මල්ල ගැන කුමන කතාදැයි අපේ ජනශ්‍රැතියේ කියමනක් තිබේ. ඒ අනුව කෞතුකාගාය හොරු කැඩූ පසු අනෙක් දේවල් ගැන කතා කිරීමද එල රහිතය.

පසුගිය කාලය පුරා හොරකම් මංකොල්ලකෑම්, කප්පම් ඉල්ලීම් හා මිනිස් ඝාතන රැල්ලක් ලෙස වැඩි වී තිබේ. ඉන් පෙන්වන්නේ, සමාජයක පිරිහීමේ තරමය. කෞතුකාගාරය හොරු බිඳීම යනු එහි උච්ඡතම අවස්ථාවය. රටක හොරකම් හා අපරාධ ඉහළ යන්නේ, එම රට සාමාජීය වශයෙන් බරපතළ ලෙස පිරිහෙන විටය. රටත් සමාජීය වශයෙන් පිරිහෙන්නේ, එම රට ආර්ථික වශයෙන් බරපතළ ලෙස පිරිහෙන විටය. රාජපක්ෂ ආණ්ඩුවේ ඊනියා ආර්ථික සංවර්ධනය රට ගෙනැවිත් තිබෙන්නේ එතනටය.

වත්මන් නව ලිබරල් ධනවාදය තුළ විවෘත ආර්ථිකයේ දෙවැනි ඉනිම ක්‍රීඩා කරන පාලනයක් වෙතින් මීට වඩා යමක් බලාපොරොත්තු විය නොහැක. එය ආර්ථිකයත් දේශපාලනයත් අධිරාජ්‍යවාදයේ වුවමනාවට යට කරන අතර මානව සම්බන්ධතා සුනු විසුණු කරමින් නව ලිබරල් ධනවාදයට ගැලපෙන නරුම මිනිසෙක් නිර්මාණය කරයි. දැන් කෞතුකාගාරය කඩා භාණ්ඩ සොරාගන්නේත් පෞරාණික වස්තු සොරාගැනීමට භික්ෂූන් දෙනමක් පන්සල තුළ ඝාතනය කරන්නේත් මව හා දියණිය අමානුෂිකව මරා දමන්නේත් එම මිනිසාය.

නරුමයා යනු හැම දේකම මිල දන්නා එහෙත් වටිනාකම නොදන්නා පුද්ගලයායැයි ඔස්කා වයිල්ඩ් පවසා තිබුණේය. නූතන ධනවාදය නිර්මාණය කර ඇත්තේ, එවැනි මිනිසුන්ය. රාජපක්ෂ පාලනයද 'මතට තිත' කියමින් සම්බුද්ධත්ව ජයන්තියට පිළිවෙතින් පෙළගැසෙන ලෙස ඉල්ලමින්, සැබෑ ලෙස නිර්මාණය කර ඇත්තේ, නරුම මනසක් ඇති මිනිසුන්ය. පරිසරය නොතකා වැලි ගොඩදැමීමේ, ගස් කැපීමේ සිට නිධන් සෙවීමට පුරාවස්තු හා පන්සල් විනාශ කිරීමේ සිට, කටුගේ කැඩීම දක්වා පැමිණ ඇත්තේ, එකී මිනිසුන්ය.

මේ දුබල යල් පැන ගිය ධනවාදයට රට රැකීමටවත් ජනතාව රැකීමටවත් රටේ ඉතිහාසය හා වටිනා පුරාවස්තූන් ආරක්ෂා කිරීමටවත් නොහැක. එයට රැකිය හැක්කේ, පවුල්වාදය හා ධනවාදයයි. එබැවින් ධනවාදය වල දමා නව සමාජයකට උපත දීමේ සටනට රට ගැන, ජනතාව ගැන, අතීතය මෙන්ම අනාගතය ගැනද සිතන සැබෑ මිනිසුන් එක් විය යුතුය.

# අධිරාජ්‍යවාදී බලපෑම්වලට පාර කැපුවේ ආණ්ඩුවමයි

## ජ.වි.පෙ. නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා




රටේ ප්‍රශ්නවලට අධිරාජ්‍යවාදීන්ට ඇඟිලි ගැසීමට පාර කැපුවේ ආණ්ඩුවම බවත් ජනතාවගේ මූලික මිනිස් අයිතීන් සහ ප්‍රජාතන්ත්‍රවාදය විශේෂයෙන්ම උතුරේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කර සිවිල් ජනජීවිතය නගා සිටුවීමට ආණ්ඩුව අසමත් වූ බවත් ජ.වි.පෙ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා කියා සිටියේය.

ඔහු මේබව පෙන්වා දුන්නේ, පසුගිය 04වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. ''මේ ආණ්ඩුව අධිරාජ්‍යවාදය සමග එකට එකතු වී අභ්‍යන්තර ප්‍රශ්නවලට අතපෙවීමේ ඉඩකඩ ලබාදුන්නා. මේ ප්‍රශ්නය විසඳීමේ හැකියාවක් ආණ්ඩුවට නැහැ. ධනපති ක්‍රමයටත් නැහැ. අධිරාජ්‍යවාදී රටවලටත් නැහැ. ශ්‍රී ලංකාව වගේ රටවල අභ්‍යන්තර ප්‍රශ්නවලට මැදිහත්වී අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රශ්න යටගහගන්න උත්සාහ කරනවා. මේ නිසා ආණ්ඩුවත් අධිරාජ්‍යවාදීනුත් දෙගොල්ලොම මේ ප්‍රශ්නයේදී එකම විත්ති කූඩුවේ සිටිය යුතුයි. ඒ අයට විරුද්ධව ජනතාව එක්වී සටන් කළ යුතුයි. ඒ වගේම විශේෂයෙන්ම අවධාරණය කළ යුතු දෙයක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයත් මේ ප්‍රශ්නයේදී සිටින්නේ ආණ්ඩුව සහ අධිරාජ්‍යවාදී බලවේග සමග එකඟත්වයෙන්. මේ නිසා සැබෑ විසඳුමක් කෙරෙහි ජනතාව කල්පනා කළ යුතුයි. අපි යෝජනා කරන්නේ මේ ප්‍රශ්නයට සැබෑ විසඳුමක් පවතින්නේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම සමානාත්මතාව ඇතිකිරීම, සමාන අවස්ථා ස්ථාපිත කිරීම කියන මූලික මූලධර්ම තුන මත පදනම්වයි. එවැනි දිගුකාලීන විසඳුමක් ධනපති ක්‍රමයට නැහැ. ඒ නිසා සමාජවාදය සඳහා පෙළ ගැසෙන මෙන් අපි ජනතාවට ආරාධනා කරනවා.

ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් සලකා බැලීමේදී කුමක් හෝ විසඳුමක් යෝජනා කිරීමෙන් ප්‍රශ්නයට කිසිම උත්තරයක් ලැබෙන්නේ නැහැ. නිවැරදි විසඳුම් තියෙන්නේ එකයි. අපි යෝජනා කරන්නේ ඒ නිවැරදි විසඳුම ලබාදීමට අපි පක්ෂයක් විදියට ක්‍රියාකරනවා. මීට පෙර සඳහන් කළ මූලධර්ම මත පදනම් වූ විසඳුමකින් පමණයි. දිගුකාලීන සංහිඳියාවක් බලාපොරොත්තු විය හැක්කේ. අපි ජනතාව දැනුවත් කරන්නේ ඉල්ලා හිටින්නේත් ඒ සැබෑ විසඳුම දක්වා ගමන් කරන ලෙසයි,'' සෝමවංශ සහෝදරයා මාධ්‍ය හමුව අවසන් කරමින් පැවසීය.

මෙම හමුව සඳහා ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහ ප්‍රචාරක ලේකම් විජිත හේරත් යන සහෝදරවරුද එක්ව සිටියහ.

# 'ජිනීවා නාඩගම හා ආණ්ඩුවේ ඇස්බැන්දුම'

## ජ.වි.පෙ.න් ප්‍රසිද්ධ දේශනයක්



මානව හිමිකම් සමුළුව සම්බන්ධයෙන් ආණ්ඩුව ගෙන යන දෙබිඩි පිළිවෙත පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ පසුගිය 06වැනි දින ප්‍රසිද්ධ දේශනයක් පැවැත්වීය.

ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් සිදුකරන ලද මෙම දේශනය කොළඹ, මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

මෙම දේශනයේදී අදහස් දක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා, ආණ්ඩුව බොරු දේශප්‍රේමයක් මවාපා ජනතාව ආණ්ඩු හිතවාදී උද්සෝෂණවලට පොළඹවා රටේ ඇත්ත ප්‍රශ්න වසන් කිරීමට උත්සාහ කරන නමුත් ඇමරිකාව ඇතුළු අධිරාජ්‍යවාදීන් සහ ඉන්දියාව සමග මහින්ද රාජපක්ෂ පාලනය එකගත්වයෙන් කටයුතු කරමින් සිටින බව පෙන්වා දුන්නේය.

# ජීවන වියදම අඩු කරන ලෙස ඉල්ලා කම්කරු-ගොවි ඒකාබද්ධ උද්ඝෝෂණයක්





ජනතාවට දැරිය නොහැකි ජීවන බරක් පටවා තිබියදී තෙල් මිල, බස් ගාස්තු, විදුලි ගාස්තු ඉහළ දමා නාස්තිකාර වියදම් ජනතාව මත පටවන ආණ්ඩුවට වහාම තෙල්මිල අඩුකර ජීවන වියදම අඩුකිරීමට බල කරන බව බහුජන සංවිධාන ගණනාවක් ඒකාබද්ධ පවත්වන ලද විරෝධතාවයකදී අවධාරණය කෙරිණි. පසුගිය 05වැනි දින කොටුව දුම්රිපොළ ඉදිරිපිටදී ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය විසින් සංවිධානය කර තිබූ මෙම විරෝධතා ව්‍යාපාරයට අන්තර් සමාගම් සේවක සංගමය, සමස්ත ලංකා ගොවිජන සම්මේලනය, සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය, සමස්ත ලංකා වතු කම්කරු සංගමය, කුඩා තේවතු හිමියන්ගේ ජාතික සම්මේලනය යන සංගම් මූලික වශයෙන් ඒකාබද්ධවී තිබිණ.

පැයකට අධික කාලයක් පැවති විරෝධතා ව්‍යාපාරයට විශාල පිරිසක් සහභාගී වී සිටි අතර විරෝධතාවයෙන් අනතුරුව බහුජන සංවිධාන නායකයෝ රැස්ව සිටි ජනතාව ඇමතූහ.

# දඹුල්ලෙත් ගොවි උද්ඝෝෂණ

වී සඳහා රු.40ක සහතික මිලක් ලබා දෙන ලෙසත් වී කිලෝවක සහතික මිල නීතිගත කරන ලෙසත් ඉල්ලමින් ගොවීහු විශාල පිරිසක් පසුගිය 27වැනිදා දඹුල්ල නගරයේදී උද්ඝෝෂණයක නිරත වූහ. සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විසින් සංවිධානය කර තිබූ මෙම විරෝධතාවයට ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික අනුර කුමාර දිසානායක සහෝදරයාද එක්වී සිටියේය.




කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි එම්. ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.